# රංගිරි ශ්‍රී ලංකා

FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු



FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

**RANGIRI SRI LANKA NEWSPAPER**

ශ්‍රී.බු.ව. 2564- ක්‍රි.ව. 2020
ජූලි (ඇසළ)
මාසික බෞද්ධ සාර සංග්‍රහය - අන්තර්ජාල කලාපය
20





## සඳහම් ආලෝකය ලොවට උදාවූ වගයි...



### රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය

UHF CH 60
PEO TV CH 22
Dialog Tv 21
Dish Tv 2532

RSL TELEVISION

### රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය
### දේශයේ රන් හඬ

FM 104.4 - 105.7

RSL RADIO

වෙබ් : www.rangirisrilanka.lk

රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ ප්‍රකාශනයකි.




ලක්දිව ජනතාවට පොසොන් උදාවෙන් පසු එළඹෙන්නේ ඇසළ පොහොයයි.ඇසළ පොහොයත්,බුද්ධ චරිතයට සම්බන්ධ කරුණු රැසක් හේතුකොටගෙන වැදගත් වේ. එම කරුණු විමසා බැලීම මෙම ලිපියේ ප්‍රධාන අරමුණවේ. වෙසතුරු අත්බවින් මිදී තුසිත දෙව්ලොව උපන් බෝසතාණෝ,දෙව් බඹුන්ගේ ආරාධනාවෙන් පස්මහ බැලුම් බැලීමෙන් පසු දඹදිව කපිලවස්තු පුරයෙහි සුදොවුන් මහරජුගේ අගබිසව වූ මහාමායා දේවියගේ කුස පිළිසිඳ ගත්තේ ඇසළ පොහෝ දිනකය.

ගිහි සැප උපරිම ලෙස වින්දනය කළ සිදුහත් කුමරු නාටිකාවන්ගේ විප්‍රකාරත් සතර පෙර නිමිතිත් දැක ගිහි ජීවිතය කෙරෙහි කළකිරී මහා අභිනිෂ්ක්‍රමණය සිදු කරන්නේ ද ඇසළ පොහොය උදාවීමෙන් පසුවය.බුදුවීමෙන් පසු අවබෝධ කරගත් නිර්මල ධර්මය පළමුවෙන් පස්වග තවුසන්හට දේශනා කොට වදාළේ ඇසළ පොහෝදාය.තීර්ථකයන්ගේ මානය දුරුකිරීම සඳහා ගණ්ඩඹ රුක්මුලදී යමාමහ පෙළහැර දැක්වූයේ ද දෙව්ලොව සිටි මෑණියන් වූ මාතෘදිව්‍යරාජයාට අභිධර්මය දේශනා කෙළේ ද ඇසළ පොහෝ දිනකය.

මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රධානව අජාසත් රජුගේ මූලිකත්වයෙන් ප්‍රථමධර්ම සංඝායනාව පවත්වන ලද්දේ ද ඇසළ පොහොය මූලික කරගෙනය.ලක්දිව බුදුදහම ලැබීමෙන් පසු අරිට්ඨ කුමරුගේ පැවිද්ද හා මහමෙවුනා උයනේ සීමා ලකුණු කිරීමත් රුවන්වැලිසෑ රදුන් සෑදීමට මුල්ගල තබන ලද්දේද ඇසළ පොහොය දිනකය දළදා පෙරහැර ආරම්භය සිදු වන්නේද මෙම ඇසළ පොහොය නිමිති කරගෙනය.

ඇම්.ඩී.විජයවර්ධන

## පුදබිමක අසිරිය

# කතරගම කිරි වෙහෙර



මොණරාගල දිස්ත්‍රික්කයේ මැණික් ගඟ අසබඩ පිහිටි කතරගම පුදබිම ඓතිහාසික සිද්ධීන් රාශියක් සිදු වූ ස්ථිනයක් වශයෙන් හඳුන්වාදීමට පුළුවන. ක්‍රි.පූ අවධියේ මෙම ස්ථානයේ දස බෑ රජවරුන් පිරිසක් රාජ්‍යකළ බව අභිලේඛන වලින් පැහැදිලි වෙයි. ධාතුවංශයේද මෙම තොරතුරු සඳහන්ව විනාශ කරදමා රාජ්‍ය බලය ලබාගත් බව බෝවත්තේගල කොටා දැමූ හෙළ කුසලානකන්ද වැනි ස්ථානවලින් හමුවී ඇති අභිලේඛන වලින් පැහැදිලි වෙයි. මෙම කාලයේදී කතරගම ප්‍රධාන පාලන(දකුණේ) මධ්‍යස්ථානයක් වශයෙන් පැවැති බවට තොරතුරු සඳහන්ව ඇත.

සංඝමිත්තා රහත් තෙරණින් වහන්සේ මෙරටට ජයශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව වැඩම කරවීමෙන් පසු විවිධ ප්‍රදේශවලට අෂ්ටඵල බෝධීන් වහන්සේලා ව්‍යාප්තවිය.එහි පළමුවැන්න කතරගමට ලැබුණු බවත් එහි වාසය කල රාජකීය පිරිස් විසින් එය ආරක්‍ෂාකල බවත් වංශකථාවෙහි සඳහන්ව ඇත.කතරගම දේවාලය අසල වර්තමානයේ දක්නට ලැබෙන්නේ,අෂ්ටඵල බෝධීන් වහන්සේ බව පිළිගත් මතයකි.

බුදුරජාණන් වහන්සේ ලංකාවට වැඩම කරවීමේදී මෙම ස්ථානයේද සමාධි සුවයෙන් වැඩ සිටි ඉවට වංශකතාවල තොරතුරු සඳහන් වෙයි.බුදුපහස ලත් පුදබිමක් වශයෙන්ද මෙම ස්ථානය ඇගැයීමට ලක්කළ හැකිය. වර්තමාන කිරිවෙහෙර පිහිටා ඇත්තේ එම ස්ථානයේ බවට තොරතුරු සඳහන්ව ඇත.

පළමු වන විජය භාහු රජතුමා රාජ්‍ය පාලකයා බවට පත් වීමෙන් පසු මෙම පුද බිම (කතගෙට කිරි වෙහෙර) ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකළ බවට චූල වංශයෙහි සඳහන්ව ඇත 'මහසෙන් දෙවිරද' නමින් ප්‍රසිද්ධියට පත්වූයේ, මෙම කතරගම දේවාලයේ දෙවියන් බව ඓතිහාසික ග්‍රන්ථවල (චූලවංශය) සඳහන් වේයි. අලංකාර ශෛලමය දේව ප්‍රතිමාවක්, මෙම ස්ථානයේ තැන්පත් කර තිබූබවට 'කතරගම සෙල්ලිපියක' දැක්වේ. කතරගම කිරිවෙහෙරෙහි, වාර්ශික උත්සව පැවැත්වෙන අතර, දෙවොලෙහිද වාර්ශික පෙරහැර මංගල්‍යයක් උත්කර්ෂවත් අන්දමින් සිදුකරගෙන එනු ලබයි.



බෞද්ධ, හින්දු යන ජනතාව ප්‍රධානව සෙසු ජනයාද මෙම උත්සව සඳහා සහභාගි වන අතර, මානසික සුවය සඳහා පූජාවෙන් ක්‍රියාත්මක වේ. එබැවින් කතරගම පුදබිම දෙස්, විදෙස් සංචාරකයින්ගේ චිත්තාකර්ෂණීය ස්ථානයක් බවට පත්ව තිබීම, අප සැමගේ සතුටට කරැණකි. මෙම ස්ථානය ආරක්ෂාකර ගැනීම ලාංකික ජනතාවගේ පරම යුතුකම සැලකිය හැකිය.

විජය තලවත්තේගෙදර

# ලෝ සත දුකින් මුදවාලීමට සම්පත් හැර දැමූ මහා වීරයාණෝ



පින්සර ඇසළ මාසයේ නිලබර ඇසළ සඳ නැගෙන විට සිසිල් මදනල ගත දවටෙන විට ලෝසත වෙනුවෙන් තම සියල් සම්පත් අතහැර දමූ මහා වීරයාණ කෙනෙකුන්ගේ ජීවිතයේ සුවිශේෂී අවස්ථාවන් රැසක් අපේ මතකයට නැගී එයි. ඒ වීරයාණන් අන් කිසිවෙකුත් නොව මේ ලොවට උතුම් වූ සත්‍ය පහදා දුන් තිලෝගුරු බුදු රජාණන් වහන්සේමය. සරා සැකි කප් කෙළක් නොවිඳිනා දුක් විඳ සියලු සත්ත්වයන්ගේ යහපත වෙනුවෙන් උන් වහන්සේ දස පාරමිතාවන් සම්පූර්ණ කරමින් උතුම් බුදු පදවිය ලබා ගැනිමට සසර සැරි සැරූ බව ශාසන ඉතිහාසයේ සඳහන් වෙයි.

එදා දීපංකර පාද මූලයේදී තමා අතට පත් වූ නිවන් සැපත හැරදමා තමන් පමණක් නොව සියලු සත්ත්වයන්ට ඒ උතුම් නිවීම ලබාදෙන්නට නියත විවරණ ලබාගෙන සෝර සංසාරයේ බොහෝ ජාතිවල ඉපිද ඇස්, ඉස්, මස්, ලේ, අඹු දරුවන් දන් දෙමින් උතුම් බුදු බව පතා බෝසත් දම් පිරූ මහා බෝධිසත්ත්වයෝ අවසන වෙසතුරු අත් බැවින් මිදී තව්තිසා දෙව්ලොව උපන්හ. දෙව් ලොව දිව සැපත් විඳ ඉන් චුතව මිනිස් ලොව උපදින්නට දෙව් බඹුන්ගේ ආරාධනා ලැබූහ.

" ***කාලෝ යං තෙ මහා වීර***
***උප්ප්ජ මාතු කුච්ඡියං***
***සදෙවකං තාරයනෙතා***
***බුජ්ඣස්සු අමතං පදං"***

''මහා වීරයාණෙනි, මිනිස් ලොව මව් කුස ඉපිද දෙවියන් සහිත මිනිසුන් සසර දුකින් එතෙර කරනු පිණිස නිවන අවබෝධ කර ගැනීමට මේ සුදුසු කාලයයි.''

මෙසේ ඒ ආරාධනාව පිළිගෙන මනු ලොව උපදින්නට කාලය, දීපය, දේශය, කුලය සහ මව යන පස් මහ බැලුම් බලා දඹදිව කිඹුල්වත් පුර ශාක්‍ය වංශයේ සුද්ධෝදන රජුගේ පින්වත් බිසව මහා මායා දේවියගේ කුස පිළිසිඳ ගත්හ. ඒ මේ උතුම් ඇසළ පෝය දිනයේය. මහාමායා දේවියට එය සුදු නෙළුමක් සොඬින් ගත් සුදු ඇත් පැටවකුගේ විලාශයකින් එය සිහිනයෙන් පෙන්නුම් කළේය. සිහිනයේ පලාඵල විමසූ විට දැන ගැනීමට ලැබුණේ පින්වත් කුමරෙකු කුස පිළිසිඳගෙන ඇති බවයි.

කාලය සපිරීමෙන් වෙසක් පුන් පොහෝ දිනක බෝසත් පුතු උපත ලදහ. **''මෙය මාගේ අවසන් උපත''** බව සඳහන් කරමින් සත් පියුම් මත බෝසතුන් මෙලොව එළිය දුටහ. ඉන්පසු සුදොවුන් රජ තම පුතු උගත් බමුණු වෙතට පඬිවරුන් ගෙන්වා බෝසත් කුමරුගේ දේහ ලක්ෂණ බලා **''ලොවට අර්ථයක් සිදු කරන්නා''** යන අර්ථයෙන් **''සිද්ධාර්ථ''** යැයි නම් තැබූහ. මේ සිද්ධාර්ථයන් ඉපදී දින හතකින් මහාමායා දේවි තොමෝ කලුරිය කළාය. ඉන් අනතුරුව දේවියගේ නැගණිය වූ ගෝතමී දේවියගේ මව් සෙනෙහස යටතේ හැදුන වැඩුණ සිදුහත් කුමරු නිසි වයස් පැමිණ ශිල්ප උගත්තේය.වයස අවුරුදු 16 දී සුප්‍රබුද්ධ රජුගේ රූමත් යශෝදරා දියණිය සමඟ විවාහ විය. ගිහිව සිටියහොත් සක්විති රජ වන බවට හා පැවිදි වුවහොත් බුදුබව ලබන බවට බමුණන් පැවසූ අනාවැකි නිසා පිය රජුගේ එකම බලාපොරොත්තුව වූයේ තම පුතු සක්විති රජෙකු වනු දැකීමටය. ඒ නිසාම ගිහි ජීවිතය අතිශයින් සැපවත් ජීවිතයක් බවට පත් කිරීමටත් සිත කළ කිරීමට පත්වන කිසිවක් නොදැකීමටත්, කිසිඳු අඩුපාඩුවක් කිසි දිනක නොදැනීමටත් මංපෙත් විවර කරදීමට සුදොවුන් රජුට හැකිවිය. රම්‍ය, සුරම්‍ය, සුභ යනුවෙන් කාලත්‍රයටම සුදුසු මාළිගා තුනක් විය. දෙවඟනක් වැනි රූසිරෙන් යුත් යශෝදරා නම් බිරිඳක විය.

මේ සැප සම්පත් විඳිමින් ගෙවන ඒකාකාරි ජීවිතයට කුමරු ප්‍රිය නොකළේය. දිනක් ඔහු ඡන්න ඇමති ද සමඟින් උයන් කෙළි පිණිස මාළිගයෙන් නික්ම ගියේය. ඒ ගමන යන අතරමඟදී කුමරුට කිසිදා නොදුටු රුවක් හමුවිය. සැරයටියක් අතින් ගෙන වක ගැසුණු සිරුරින් ඉතා සෙමින් ගමන් කරන මහල්ලෙකුගේ දසුනකි.

කුමරු එය රථාචාර්යාගෙන් විමසූ විට ලැබුණ පිළිතුර වූයේ අප සේම ඉපිද දූන් මහලු වියට පත් පුද්ගලයෙක් බවයි. එය මිනිස් ලොව උපන් සැම කෙනෙකුටම පොදු වූ ධර්මතාවයක් බවද දැනගන්නට ලැබිණි. මෙය දැනගත් සිද්ධාර්ථ කුමරුට තවත් ටික දුරක් ගමන් කරන විට ඉතා අමාරුවෙන්, වේදනාවෙන් සිටින ලෙඩෙකු හමුවිය. එයද ඡන්නගෙන් විමසූ විට අසන්නට ලැබුණේ එයද සැම කෙනෙකුටම පොදු ධර්මතාවක් වන බවය. එමෙන්ම මළමිණියක් ගෙනයමින් හඬා වැලපෙන පිරිසක් දුටු කුමරුට එයද සැමට පොදු ධර්මතාවයක් බවටත් ඉන් මිදීමට කිසිවෙකුටත් නොහැකි බවටත් පිළිතුරු ලැබිණි. කල්පනාවේ නිමග්නව මේ දුකින් මිදී නිදහස් වීමට මඟ කෙසේ දැයි සොයන්නට කුමරු නිරතුරුවම වෙහෙසුණේය. සිත නිවන සන්සුන් ගමනින් වඩින උතුමකුගේ පැවිදි රුවක් දුටුකුමරුගේ සිත පැහැදුණේය. සැනසුණේය. මේ සියල්ල බලා කුමරු නැවත මාළිගයට ගියේය. ඒ මේ මහලුවීමට, ලෙඩවීමට, මරණයට පත් නොවී ඉන් මිදෙන මඟක් සොයන්නේ කෙසේදැයි කල්පනා කරමිනි.

තවත් දිනෙක උයන් කෙළි පිණිස ගොස් සිටින කුමරුට දූතයෙකු පිණිවිඩයක් රැගෙන ආවේය. ඒ යශෝදරාවෝ පුතකු බිහිකළ බවට ගෙන ආ පණිවිඩයයි. සිදුහතුන්ට එය ඇසූ විගස ''රාහුලෝ ජාතෝ බනධනංජාතං'' (රාහුලයෙක් උපන්නා. බැඳීමක් ඇති වුණා) යනුවෙන් කියවුණහ. උයන් කෙළි නවතා තම මාළිගයට යන අතරමගදී කිසා ගොතමියගේ නිබ්බුත පද අසා කලකිරුණු සිත මඳක් සැනසුණත් තමාගේ බිරිඳ, දරුවා, දෙමාපියන් තමාගේ කරදරකාරී බැඳීම් බවට පත්විය.

එදින සවස් කාලයේ දීත් පුරුදු ලෙසින්ම නාටිකාංගනාවෝ කුමරු සතුටු කිරීමට නැටුම් ගැයුම් වැයුම්හි නිරත වූහ. ඉන් ද කුමරුට කිසිඳු සතුටක් ඇති නොවීය. කුමරු මැදියම් රැයේදී නෙතු හැර බලන විට නලඟනන් සිටි තැන්වලම අපිළිවෙලට නින්දට ගොස් සිටියාහ. මන්ද අතිශයින් කළකිරීමට පත් සිදුහත් කුමරු ගිහි ගෙයින් නික්ම යෑමට සිතා ගත්හ.

එදා ඇසළ පුන් පොහෝ දිනකි. සඳ රැස් රැස ආලෝක කරමින් තිබිණ. ඡන්න ඇමති අමතා කන්ථක අසු සූදානම් කරන ලෙස ඉල්ලා සිටියහ. ගමනට සූදානම්ව යශෝදරාවගේ යහන් ගැබට එබී බලා සුරතල් රාහුල පුතු මව් තුරුළේ නිදා සිටින අයුරු දැක සිප ගන්නට සිතක් ආවත් එයද මැඩගෙන මේ දරුවාටත්, යශෝදරාවටත් මෙන්ම සියලුම සත්ත්වයන්ගේ යහපත වෙනුවෙන් උතුම් බුදු බව ලබාගෙන දුකින් එතෙර කරවමියි' යන අදහසින් පෝදා රාත්‍රියෙහි මාළිගයෙන් පිටවිය. අනෝමා ගංතෙරට පැමිණි සිද්ධාර්ථයෝ තම ආභරණ හා සළුපිළි සියල්ල ඡන්න ඇමතියන්ට ලබාදී පිය රජු ඇතුළු පිරිසට තමා මෙහි පැමිණි බව දන්වා සිටින මෙන් ඉල්ලා සිටියහ.

යස ඉසුරින් පිරි සියලු රජ සැප හැර දමා සියලු සත්වයන් සංසාර දුකින් එතෙර කරන්නෙමියි යන අදහස කැටි කරගත් මහ බෝසතාණන් ඒ දුකින් මිදෙන මඟ, ඒ සත්‍යය සොයා ආලාර කාලාම, උද්දකරාම පුත්ත වැනි ගුරුවරුන් සොයා ගිය මුත් තමා සොයන සත්‍යය එහි නොවීය. තමාම ඒ දුකින් මිදීමේ මඟ සොයා ගන්නෙමියි සිතූ සිදුහත් බෝසතාණෝ දැඩි සැප අතහැර දමා තම සිරුරට අධික ලෙස දුක් දෙමින් සත්‍ය සොයා වෙහෙසුණේය. ශරීරයට අධික දුක් දීමත් අධික සැප දීමත් මගින් විමුක්තිය සොයා ගත නොහැකි බව අවබෝධ කරගත් බෝසතුන් ශරීරයට අධික දුකත් නොදී අධික සැපත් නොදී මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කළේය. එයින් උන් වහන්සේට උතුම් සුවය වූ, ලොව්තුරා බුදුබව ලබාගැනිමට හැකිවිය. එක් වෙසක් පෝ දිනක පෙර විසූ කඳ පිළිවෙල දන්නා පුබ්බේ නිවාසානුස්මෘති ඥාණයත්, චුති හා උප්පත්ති දක්නා චුතූපපාත ඥාණයත් ආශ්‍රවක්ෂය කිරීමේ ආසවක්ඛ්‍ය ඥාණයත් යන ත්‍රිවිද්‍යා උපදවාගෙන උතුම් වූ බුද්ධත්වයට පත් වූහ.

දුකත්, දුකට හේතුවත්, නිවීමත් ඉන් මිදීමේ මඟත් යන උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරගන්නේ සියල් සැප සම්පත් අතහැර දමා පැමිණි නිසාය. එක් ඇසළ පොහෝ දිනක තමා පළමුවෙන්ම මේ සත්‍යය ධර්මය දේශනා කරන්නේ කා හටද යන්න සිහිපත් කරන විට තමා පළමුවෙන්ම සොයා ගිය ආලාර කාලාම, උද්දකරාම පුත්ත ආදී ගුරුවරුන් කොහේදැයි බැලූවිට මේ ලොව ජීවතුන් අතර ඔවුන් නොමැති බව දැනගත්හ. පසුව තමා දුෂ්කර ක්‍රියා කරන සමයෙහි උවටැන් කළ කොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම, අස්සජි යන පස්වග තවුසන් සිහිපත් විය. ඔවුන් බරණැස ඉසිපතන මිගදායේ සිටින බව දැන එහි ගොස් ඔවුන්ට උතුම් වූ දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කළසේක. ඉන් ලොව ප්‍රථම වතාවට සත්‍ය ලොවට දේශනා විය.

ඉපදීම, ලෙඩවීම, මහලුවීම, මරණය, අප්‍රියයන් හා එක්වීම, ප්‍රියයන්ගෙන් වෙන්වීම, කැමති දෑ නොලැබීම, ශෝකය, පරිදේව, දෝමනස්ස, උපායාස ආදී පංචස්කන්ධයම දුකක් බවත් ඒ දුකට හේතුව ඉපදීමත්, ඉපදීම නැති කිරීමේ මඟ ආර්ය අෂ්ඨාංගික මාර්ගය බවත්, ඉන් නිවන් සුවය අවබෝධ කරගත හැකි බව ඇසළ පුන් පොහෝ දිනයේදී බුදු රජාණන් වහන්සේ ලොවට දේශනා කළහ. ඒ දෙසූ දහම් මඟ, ගමන් කරමින් යහපත් දැක්මෙන්, යහපත් වූ කල්පනාවෙන්, වචනයෙන්, ක්‍රියාවෙන්, ජීවිතයෙන් උත්සාහයෙන්, සිහියෙන්, සිතෙහි එකඟතාවයෙන් යුතුව ඒ මහා වීරයාණන් දෙසූ ලෙස යහපත්ව ජීවත් වියයුතුය. ඉන් මොලොව හා පරලොව ජීවිතයේ යහපත අපට සාදාගත හැකිය.

මේ ආකාරයට ඇසළ පුන් පොහෝ දින සිදු වූ වැදගත්ම සිදුවීම් ලෙසට බෝධිසත්ත්වයන් වහන්සේගේ මව්කුස පිළිසිඳ ගැනීමත්, අභිනිෂ්ක්‍රමණයත්, ප්‍රථම ධර්ම දේශනාව පැවැත්වීමත් යන සිදුවීම් හඳුනාගත හැකිය.

එසේ නම් ලොවට උතුම් වූ සත්‍ය පහළ වූ මේ ඇසළ පුන් පොහෝ දිනයේදී ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවන්හි යෙදෙමින් දහම් මඟ යමින් අපගේ ජීවිත යහපත්ව හා නිවැරදිව ගත කිරීම ඒ මහා වීරයාණන් වූ බුදුන් වහන්සේට කරන ඉමහත් ගෞරවයක් බව පැවසිය යුතුමය. එසේ නිවැරදි පිළිවෙතකට ගමන් කිරීමට මේ පුන් පොහෝ දිනයේ බෞද්ධයන් වන අපි අදිටන් කර ගනිමු.

එස්. දිල්රුක්ෂි අබේකෝන්




# ශ්‍රී දළදා වහන්සේ

**ක්‍රි. පූ. 483 දී දඹදිව කුසිනාරානුවර මල්ල රජ දරුවන්ගේ උපවත්තන සල් උයනේදී පිරිනිවන් පෑ බුදු රජාණන් වහන්සේගේ ශ්‍රී දේහය ආදාහනය කරන අවස්ථාවේදීම, එතැනට වැඩම කල "ඛේම" නම් තෙරුන් වහන්සේ එක් ශ්‍රී දළදාවක් ලබාගත්තේය.**

එම දන්ත ධාතූන් වහන්සේ කාලිංග දේශයේ රජුට භාරදුන්නේය. වසර 783ක් පමණ කාලිංග දේශයේ වැඩ සිටි දන්ත ධාතූන් වහන්සේ ක්‍රි.ව. 300 දී පමණ ගුහසීව රජු වෙතට පත්විය. ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ, පැලලුප් නුවර අලංකාර මන්දිරයක තැන්පත් කළ ගුහසීව රජතුමා විශේෂ පුද පූජා පැවැත්වීය. භාරතය පුරා පැතිරී ගිය කලකෝලාහල නිසා යළිත් වරක් කලිඟු රටට දළදා වහන්සේ වැඩම කරවා එහි තැන්පත් කර ආරක්ෂා කළ අතර, යළිත් වරක් ආරවුල් තත්වයක් ඇතිවීම නිසා දන්ත ධාතූන් වහන්සේගේ ආරක්ෂාව ගැන කල්පනා කළ කලිඟු රජතුමා, තම පුත් දන්ත කුමරුට ක්‍රි.ව. 352 දී දන්ත ධාතූන් වහන්සේ ආරක්ෂා කරගැනීමට භාර දුන්නේය. හේමමාලා කුමරිය දන්ත ධාතූන් වහන්සේ තම කෙස් කලඹේ සඟවාගෙන, දන්ත කුමරුන් සමඟින් ලංකාවට පැමිණියහ. එවකට ලංකාවේ රජකල කිත්සිරි මෙවන් රජතුමා දන්ත ධාතූන් වහන්සේ ඉමහත් ගෞරවයෙන් පිළිගෙන, අභයගිරි විහාරයෙහි විශේෂ මණ්ඩපයක තැන්පත් කරවා විශේෂ පුද පූජා පැවැත්වීය. එතැන් සිට ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය බවට පත්වූයේ ශ්‍රී දන්ත ධාතූන් වහන්සේය.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය පැවැති (රාජධානිවල) ස්ථානවල රජමාලිගාව අසලින්ම දළදා මන්දිරයක් කරවා එහි දන්ත ධාතූන් වහන්සේ තැන්පත් කොට ආරක්ෂා කිරීම සෑම රජෙකුගේම වගකීමක් වශයෙන් සැළකුහ. රාජ්‍ය හිමිවන්නේද දන්ත ධාතූන් වහන්සේ, අයිති තැනැත්තාට යන ස්ථාවරය ඇති වූයේද මෙතැන් සිටය. වාර්ෂිකව දන්ත ධාතූන් වහන්සේ, වෙනුවෙන් පෙරහැර පැවැත්වීමද ආරම්භ විය. සංස්කෘතික මංගල්‍යයක් වශයෙන් පෙරහැර පැවැත්වීම සිදුවූ බව වංශ කථාවල සඳහන් වෙයි.


අනුරාධපුර රාජධානියෙහි වැඩසිටි දන්ත ධාතූන් වහන්සේ, එතැනින් පොළොන්නරු රාජධානියට මාරුවිය. පළමුවන පරාක්‍රමබාහු රජතුමා විසින් පොළොන්නරු රජ මාලිගාව අසල අලංකාර මන්දිරයක් කරවා එහි දන්ත ධාතූන් වහන්සේ තැන්පත්කර විශේෂ පුද පූජා පැවැත්වූ බව ඉතිහාසයෙහි සඳහන් වේ. පොළොන්නරු රාජධානිය අවුල් සහගත තත්වයට පත්වීමෙන් පසු දන්ත ධාතූන් වහන්සේගේ ආරක්ෂාව පිණිස කොත්මලේ ප්‍රදේශයටත් එතැනින් දඹදෙණිය රාජධානියටත් වැඩම කරවූ බව සඳහන් වෙයි. දඹදෙණි රාජධානියෙන් පසු යාපන, රාජධානියට වැඩම කරවූ බව සඳහන් වෙයි. ලංකාව ආක්‍රමණය කල ආර්‍යචක්‍රවර්ති විසින් දන්ත ධාතූන් වහන්සේ ඉන්දියාවට ගෙනගිය බවත් තුන්වෙනි පැරකුම්බා රජතුමා යළිත් වරක් ඉන්දියාවෙන් දන්ත ධාතූන් වහන්සේ ලංකාවට වැඩම කරවූ බවද වංශ කථාවල සඳහන් වේ. දෙවන බුවනෙකබා රජු ඇතුගල්පුර රාජධානියට දන්ත ධාතූන් වහන්සේ වැඩම කරවූ බව දක්වේ. කෝට්ටේ රජකළ හයවන පැරකුම්බා රජතුමා දන්ත ධාතූන් වහන්සේ කෝට්ටේ රාජ්‍යයට වැඩම කරවා එහි විශේෂ මන්දිරයක තැන්පත් කොට විවිධ පූජා විධි පැවැත්වූ බව ඉතිහාසයෙහි සඳහන් වෙයි. කෝට්ටේ රාජධානියට කඩා වැදුණු පරදේශකාරයින් නිසා දන්ත ධාතූන් වහන්සේට ආරක්ෂාව සැපයීමට නිලමේවරුන්ට සිදුවිය. එනිසා සීතාවක රාජ්‍යටත් එතැනින් දෙල්ගමු විහාරයටත් දන්ත ධාතූන් වහන්සේ වැඩම කරවන ලදී. එතැනින් උඩරට රාජ්‍යට ගෙන යෑමට භික්ෂූන් වහන්සේලාට සිදුවිය. උඩරට රජකල I වන විමලධර්‍ම රජු දවස විදේශීය බලපෑම් එල්ල වූ නිසා ආරක්ෂිත ස්ථානයකට ගෙන යෑමට සිදුවිය.

මෙරට උවදුරු එල්ල වූ සෑම අවස්ථාවකදීම දන්ත ධාතූන් වහන්සේගේ අපරිමිත ගුණ බලයෙන් එම උවදුරු වලින් ජය ගැනීමට මෙරට හෙළ රජ දරුවන්ට හැකි වූ බව **"දළදා වංශ කථාවල"** සඳහන් වෙයි. එක් අවස්ථාවක දන්ත ධාතූන් වහන්සේ, සතුරන් අතට පත්වීමට ගියවිට, දළදා වහන්සේ, නොපෙනී ගිය බවත්, වංශ කථාවල දක්වේ. කලිඟු රටේදී සතුරන් විසින් දළදා වහන්සේ කිණිහිරක තබා තැලීමට ගියවිට අහසට පැන නැගුණු දන්ත ධාතූන් වහන්සේ **"රශ්මිමලා"** විහිදුවමින් ප්‍රාතිහාර්‍ය පෑ බව දළදා වංශයෙහි සඳහන් වෙයි. එය දුටු බොහෝ ජනයා මිසදුටු බවින් මිදී යහපත් දිවි පෙවෙතක් ලැබූ බවද, වංශ කථාවෙහි දක්වේ. මෙරට නියං උවදුරු ඇතිවූ අවස්ථාවලදී දන්ත ධාතූන් වහන්සේ දළදා මැඳුරෙන් පිටතට ගෙන, පූජෝපහාර පවත්වා පෙරහැර කළ පසු මහ වැස්සක් ඇද හැලුනු බව පුරාවෘත්ත වල සඳහන් වෙයි. කෙත්වතු සාරවී සෞභාග්‍යය උදා වූ බව එම විස්තරයෙහි වැඩි දුරටත් සඳහන් වෙයි. දන්ත ධාතූන් වහන්සේට පූජෝපහාර දක්වීමට බ්‍රිතාන්‍ය ජාතිකයන්ද පෙළඹුණේ 1928 වර්ෂයේදීය. ඉන්පසු මල්වතු, අස්ගිරි මහ නාහිමිවරුන්ට දළදා වහන්සේ භාරදී අවශ්‍ය පහසුකම්ද, ඔවුන් විසින් සපයාදුන් බව ඔවුන්ගේ ගිවිසුම්වලින් පැහැදිළි වෙයි. දන්ත ධාතූන් වහන්සේගේ නිත්‍ය ආරක්ෂකයෙකු අවශ්‍ය බව තේරුම්ගත් බ්‍රිතාන්‍ය පාලකයින් 1953 දී දියවඩන නිලමේ කෙනෙකු පත්කර භික්ෂූන් වහන්සේලාට දන්ත ධාතූන් වහන්සේගේ භාරකාරත්වය ලබාදී ඇත. එතැන් සිට දන්ත ධාතූන් වහන්සේ සෙංකඩගල රාජධානියෙහි වැඩ වාසය කරන අතර, වාර්ෂික වශයෙන් (ඇසළ මාසයේ) මහා පෙරහැර පවත්වා ගරු බුහුමන් පුද සත්කාර සිදු කරනු ලබයි. තේවාමුර මල්වතු විහාරයටත් අස්ගිරි විහාරයටත් වාර්ෂික වශයෙනුත් මාරුවෙන් මාරුවට සිදු කෙරෙයි. පෙර රජ දවස බුද්ධ පූජාවට (දන්ත ධාතූන් වහන්සේට) ගත් පූජා විධි ක්‍රම අද දක්වාම නොකඩවා පවත්වාගෙන ඒම ඉතා වැදගත්ය. දළදා මාළිගාවේ රාජකාරි කරන පිරිසට ගම්වර ප්‍රදානය කර තිබේ. නඩත්තුව සඳහා අවශ්‍ය බදු මුදල් ද වෙන්කර තිබේ. දළදා මාලිගාවට මල් සැපයූ ප්‍රදේශය බිබිලේ **"මල්ලැහැව"** නමින් අද හැඳින්වෙන බව පුරාවෘත්ත වල සඳහන් වෙයි.

වාර්ෂිකව පැවැත්වෙන අළුත් සහල් මංගල්‍යයට ලංකාවේ විවිධ ප්‍රදේශවලින් ජනතාව පැමිණ සහභාගීවීම විශේෂ සිද්ධියකි. නියමිත වේලාවන්හිදී තේවා මුර පැවැත්වීමද, විශේෂ රාජකාරියකි. ඒ සඳහා වෙන් වූ පිරිසක්ද සිටින අතර ඔවුන්ට යැපීම්, දීමනා, ආදියද ප්‍රදානය කෙරේ.

වාර්ෂිකව පැවැත්වෙන දළදා පෙරහැර නැරඹීමටත් පුද පූජා පැවැත්වීමටත් දෙස්, විදෙස් ජනී ජනයා ලක්ෂ ගණනින් මහනුවරට පැමිණෙති. පෙරහැර පැවැත්වීම සඳහා දන්ත ධාතූන් වහන්සේ දළදා මාලිගාවෙන් පිටතට ගත්විට **"මල් වර්ෂාවක්"** ඇදහැලෙන බව ජනතාවගේ විශ්වාසයයි. කොපමණ ජනතාවක් එදිනට මහනුවරට පැමිණියත් විපතක් සිදු නොවීමද, ආශ්චර්යයක් සේ ජනතාව සලකති. කරඬුව වැඩම කරවන මංගල හස්තියාට පාවඩ එලනතුරු රැදී සිටීමත් ගරු ගාම්භීරව පෙරහැරේ ගමන් කිරීමත් විශේෂ ලක්ෂණයකි. දියවඩන නිලමේ පෙරහැරේ ගමන් කිරීමත් විශේෂ ලක්ෂණයකි. පෙරහැර පවත්වා ඉන්පසු නැකතට දියකපා රජතුමාට දියවඩන නිලමේතුමා ප්‍රමුඛ නිලමේවරුන් පෙරහැර පැවැත්වූ බව දන්වූ බව සඳහන් වේ. එපරිද්දෙන්ම වර්තමාන රාජ්‍ය නායකවන ජනපතිඳුන් හට දැනුම්දීම අද සිදු කරණු ලබයි.මෙපරිද්දෙන් දළදා වහන්සේ සෙත සළසන ලෝක පූජිත වස්තුවක් බවට පත්වී හමාරය.

විජය තලවත්තේගෙදර



# ඇසළ පොහොයෙහි අරුත දැන අපි සදහම් මඟට පිවිසෙමු

**සමස්ථ ලෝකවාසී බෞද්ධ ජන හද මඩල බුද්ධාලම්බන ප්‍රීතියෙන් ඔදවැඩී යන දිනයකි ඇසල පුන්පොහෝදා බෞද්ධ සාහිත්‍ය තුල විශේෂ සිදුවීම් රැසක් සිදු වූ දිනයක් බැවිනි. එනම්,**

01 ලොව්තුරා සම්මා සම්බුද්ධ රාජ්‍ය ප්‍රාර්ථනයෙන් සාරා සංඛ්‍ය කල්ප ලක්‍ෂයක් දානාදි සමතිංශත් පාරමී දම් සපුරා සුදුසු කාලය පැමිණෙන තුරු තව්තිසා දෙව් භවනේ දෙව් සැප වලදමින් සිටි බෝසත් දෙව්රජ කාලෝ යං තෙ මහාවීර...” ආදී වශයෙන් බෝසත් දෙව්වරුනි මනුලොව ඉපිද ලොව්තුරා සම්බුදුව දෙව්මිනිසුන් සසරින් එතර කරවීමට මේ කාළයයි” යනුවෙන් දෙවියන් කළ ආරාධනය ඇතිවපංච මහා විලෝකනය (පස්මහ බැලුම්) කොට සුදෝවුන් මහරජුට දාව මහමායා දේවියගේ කුස පිළිසිඳ ගන්නේ ඇසළ පුන් පොහෝ දිනයි.

02 සකළ ශිල්පයේ කෙළ පැමිණ දහසය විය සපිරුන සිදුහත් කුමරු යසෝදරාවන් හා විවාහ වී රජ සැපත් ලැබ වසර 13 කින් රාහුල පුතුන් ඉපදීමෙන් පසු සතර පෙර නිවිති දැක, ජීවිතයේ නියම තතු වටහාගෙන ජරා, මරණ, දුක්, දොම්නස් දුරලීමට ඉපදීම නැතිකළ යුතු යැයි නුවණින් දැන , ලැබගෙන තිබුණ රජ සැපත් ලැබෙන්නට තිබූ සක්විති රජ සැපත් එදිනම ලැබුණු දරු සම්පතත් ඇතුලු සියළු දේ අලුයම ලූ කෙළ පිඩක් සේ අතැර මහා අභිණිෂ්ක්‍රමණය කළෙද ඇසළ පුන් පොහෝ දිනයකය.

03 වෙසක් පුන් පොහෝ දින ලොව්තුරා සම්මා සම්බුද්ධත්වය ලැබ සති හතක් පුරාවට නැවත ඒ අවබෝධ කලා වූ ධර්මය ප්‍රතීත්‍ය සමුත්පාද වශයෙන් මෙනෙහි කර මින් සත්‍ය, කෘත්‍ය, කෘත වශයෙන් දොළොස් ආකාරයකින්ම ප්‍රත්‍යක්‍ෂ කිරීමෙන් අනතුරුව සහම්පතී මහා බ්‍රහ්මයාගේ ආරාධනයක් ඇතිව බරණැස ඉසිපත මිගදායේදී පස්වග මහණුන් අරඹයා සමස්ථ බුදු දහමේ සාරය වූ ධම්ම චක්කප්පවත්තන සූත්‍රය ” නම් මංගල දම් දෙසුම දේශනා කළේද ඇසල පුන් පොහෝ දිනකය.

04 දම්සක් දෙසුම ශ්‍රවනය කළ පිරිස අතුරෙහි කොණ්ඩඤ්ඤ තාපස තුමා සක්කාය දිට්ඨිය, විචිකිච්ඡාව, සීලබ්බත පරාමාස යන භවගාමී සංයෝජනයන් තුනක් ප්‍රහීන කොට සම්බුදු දහමේ සිසිල හඳමඩලට එකතු කර ගනිමින් සෝවාන් ඵලය ලැබීම ද මේ පොහොය දින සිදු වූ සුවිශේෂී සිද්ධියකි.

05. වෙසක් පුන් පොහෝ දින ලොව්තුරා සම්මා සම්බුද්ධත්වය ලැබ අනෙක ජාතී සංසාරං......” ආදී වශයෙන් සසර ඇවිදිමින් අනේක විධ විදි දුක් අවසන් කළ බව ප්‍රකාශ කරමින් ප්‍රථම ප්‍රීති වාක්‍ය දේශනා කළ බව සම්බුදු පියාණෝ කොණ්ඩඤ්ඤ තවුස්තුමා ධර්මය අවබෝධ කර සොවාන් මාර්ගඵල නුවණ ලැබීමෙන් ද ලැබුවේ ඉමහත් සතුටකි. මා ඉතා අමාරුවෙන් අවබෝධ කරගත් මේ නිවන් මාර්ගයට කොණ්ඩඤ්ඤද පැමිණියේය. යනුවෙන් අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤෝ අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤෝති ඉතිහිදං ආයසමතො කොණ්ඩඤ්ඤ අඤ්ඤා කොණ්ඩඤ්ඤෝත්වෙව නාමං අහොසි”

යනුවෙන් සම්බුදු දහම අවබෝධකළ ඔබට මම ප්‍රඥාවෙන් යුක්ත වූ (අඤ්ඤා) කොණ්ඩඤ්ඤ යනුවෙන් නම් කරනවා යැයි ප්‍රීති වාක්‍ය දේශනා කිරීමත් ඇසළ පුන් පොහෝ දින සිදු වූ වටිනා සිද්ධියකි.

06. ලාභ සත්කාර ලැබීම වස් තම තමන් ශ්‍රේෂ්ඨ ශාස්තෘවරුයැයි පවසමින් ලොව මුලාවට පත් කරමින් සිටි, බුදුපියාණන් වහන්සේගේ සමකාලීන ශාස්තෘවරු වූ පූර්ණ කාශ්‍යප, මක්ඛලීකෝසල, අජිත කේෂකම්බල, පකුධ කත්‍යායන, සංජය බෙල්ලට්ඨි පුත්ත, නිඝන්ථනාථ පුත්ත යන තීර්ථකයන් හයදෙනාගේ මානයන් බිඳලමින් තේජෝ කසිනයට සමවැද යමාමහ පෙළහර පා මොවුන් හය දෙනා දමනය කොට නිවැරදි මග ගෙනහැර පා වදාළේද ඇසළ පුන්පෝහෝ දිනකය.

07. බුදුබව ලබන බෝසත්වරයකු ලොවට දායාද කිරීමේ මහා භාග්‍ය හිමිකරගත් මහාමායා දේවීතොමෝ බෝසත් කුමරු ඉපදී දින 7 කින් මියගොස් තව්තිසා දෙව්භවනේ මාතෘ” නමින් දෙව්රජව ඉපදී සිටි කල්හී දෙමවුපිය ගුණ සම්බුදු ගුණයෙහිලා දෙසූ බුදුපියාණෝ මාතෘ දිව්‍යරාජයාට සම්බුදු දහමින් උවටැන් කිරීම් වස් තව්තිසා දෙව්බවනට වැඩ තෙමසක් පුරා විජම්බණ (අභිධර්මය) දෙසුම ආරම්භ කළේද ඇසළ පුන් පොහෝ දිනකය.

08. ලොව්තුරා සම්මා සම්බුදු පියාණන් වහන්සේ 45 වසක් පුරාවට දම් දෙසා ඒ බුදුපියාණන් වහන්සේ සමීපයේ ශ්‍රීමුඛ දේශනාව අසා අමාමහ නිවන් දැකීමට පාරමීදම් පිරූ සිව්වනක් පිරිස අමා නිවනට පමුණුවා සියළු සංස්කාර ධර්මයෝ අනිත්‍ය යැයි දෙසූ දහම සනාථ කරමින් වෙසක් පුන් පොහෝ දිනක මා විසින් දේශනා කොට වදාළ ශ්‍රී සද් දහම මගේ ඇවෑමෙන් ඔබලාට ශාස්තෘ වන්නේයැයි” වදාරමින් පිරිනිවන් පා වදාළ බැවින් අපට ශාස්තෘ වූ නවලෝකෝත්තර ශ්‍රී සද්ධර්මයේ පිරිසිදු බව, නිරවුල් බව, ආරක්ෂාව පිණිස තෘතීය මහා ශ්‍රාවක කාශ්‍යප මහ රහතන් වහන්සේ විසින් මහ රහතන් වහන්සේලා 500ක් සමග අජාසත් රජුගේ පූර්ණ අනුග්‍රහය ඇතිව රජගහනුවර වෝභාර පර්වත ප්‍රාන්තයේ සප්තපර්ණී ගුවද්වාරයේ මණ්ඩපයක් ඉදිකොට වස් සමාදන්ව ප්‍රථම ධර්ම සංගායනාව සිදුකිරීමෙහිලා මූලික කටයුතු සංවිධානය කළේත් ඇසළ පුන් පොහෝ දිනකය.

09. ක්‍රි.පූ. 236 වැන්නේ පොසොන් පුන් පොහෝ දින මිහිදු මහරහතන් වහන්සේ වැඩමවා නව ලොව්තුරා ශ්‍රී සද්ධර්මය දේශනා කොට බුදු දහම අවබෝධ කරවා භණ්ඩුක උපාසක තුමන් පැවදි උපසපන් කරවා සුමන සාමණේරයන් වහන්සේ උපසම්පදා කරවා සියළු දෙනා වහන්සේ මේ ලක් ධරණි තලයේදී ප්‍රථම වස් එළඹීම සිදු වන්නේ ක්‍රි:පූ: 236 වැන්නේ ඇසළ පුන් පොහෝ දිනකය.

**සියම් දේශයෙන් උපසම්පදාව ලැබ ක්‍රි:ව 1753 ඇසළ පුන් පොහො දින මල්වතු මහා විහාර උපෝසථාගාරයේදී නැවත උපසම්පදාව ඇති කිරීමෙන් අප රටේ නැවත මහා සංඝ රත්නය ආරම්භ විය.**

10. යම් රටක ධර්මය ස්ථාපිත වීමට නම් එම රටේ උපන් කෙනෙකු එම රටේදීම පැවිදිව ත්‍රිපිටකය මැනවින් හදාරා දහම් දෙසා උපසපන් විය යුතුය. එම සත් ක්‍රියාව සඳහා අරිට්ඨ කුමරු ඇතුළු සිංහලයන් 56 දෙනා මහණ උපසම්පදාව ලබන්නේ ක්‍රි:පූ:237 වැන්නේ ඇසළ පුන් පොහෝ දින වේ.

11. ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ දානය වැළඳූ පාත්‍ර ධාතුව (බුදු පියාණන් වහන්සේගේ පාරිභෝගික වස්තුවක් වූ පාත්‍රා ධාතුව) අප රටට වැඩමකර වන්නේද ඇසළ පුන් පොහෝ දිනක් වීම වැදගත් කරුණකි.

12. දුටුගැමුණු රජතුමාණන් කළ පුණ්‍ය කම් අතර සුවිශේෂීම පිංකම වන්නේ බුදුරජාණන් වහන්සේගේ ද්‍රෝණයක් පමණ ධාතුන් වහන්සේලා තැන්පත් කොට ඉදිකරනු ලැබූ මහාස්ථූපය” යනුවෙන් ගෞරව නාමයෙන් හඳුන්වනුලබන රුවන්වැලි මහා චෛත්‍ය රාජයාණන් වහන්සේ” ගේ නිර්මානයයි. මෙම නිර්මාණය සඳහා මංගල ශිලාව ස්ථාපිත වන්නේද ඇසළ පුන් පොහෝ දිනකය.

13. ලොව්තුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ ශාරීරික, පාරිභෝගික, උද්දේශික චෛත්‍ය අතර ශේෂ්ඨම ස්ථානයේ පවතින්නේ ශාරීරික චෛත්‍ය හෙවත් ශ්‍රී බුද්ධ ශරීරයේ ධාතුන් වහන්සේලාය. මෙම ධාතුන් වහන්සේලා අතර අප පරම පූජනීය වස්තුව ලෙස වඳින්නේ පුදන්නේ ගරු සත්කාර සම්මාන කරන්නේ මහනුවර උත්තරීතර මාළිගයේ වැඩ වෙසෙන ශ්‍රී දළදා වහන්සේය. හේමමාලා දන්ත කුමරුන් විසින් දළදා වහන්සේ වැඩම වීමෙන් අනතුරුව කිත්සිරි මෙවන් රජු විසින් දළදා වහන්සේ පෙරටු කරගත් පෙරහැර ආරම්භ වන්නේද ඇසළ පුන් පොහෝ දිනකය.

14. අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ වැඩමවා අරිට්ඨ කුමරු ඇතුළු පිරිස පැවිදි උපසම්පදා කරවා මෙරට මහණ උපසම්පදාව, සම්බුදු සසුන ස්ථාපිත කරීමත් විවිධ ආක්‍රමණ, ව්‍යසන හේතුවෙන් පොළොන්නරු යුගයේ අග භාගය වන විට උපසපන් කිසිඳු භික්ෂුවක් හෝ භික්ෂුණියක් නොමැති තරමට සංඝ සමාජය පරිහානියට පත් විය. එම පරිහානි යුගය මහනුවර රාජධානිය දක්වාම දීර්ඝව පැවතුණි. එම යුගය නිමාවට පත් වන්නේ අසරණ සරණ සරණංකර සංඝරාජයාණන් වහන්සේගේ අප්‍රහිත ධෛර්‍ය හා කැප කිරීමත්, ප්‍රඥවත් මතයි. සියම් දේශයෙන් උපසම්පදාව ලැබ ක්‍රි:ව 1753 ඇසළ පුන් පොහො දින මල්වතු මහා විහාරයේදී නැවත උපසම්පදාව ඇති කිරීමෙන් අප රටේ නැවත මහා සංඝ රත්නය ස්ථාපිත විය.

ඉහත කරුණු හා සිද්ධීන් අධ්‍යනය කිරීමෙන් වෙසක්, පොසොන් පොහොය දවසට ඇසළ පොහොයද අද්විතීය ස්ථානයක් ගන්නා බව අපට වැටහේ.

මේ උතුම් පුන් පොහොය සම්බන්ධයෙන් පින්වත් ඔබ හිතට ගත යුතු දෙයක් වේ. එනම් සරාසකි කප්කෙළක් පෙරුම් දම් පුරා ලොව්තුරා සම්මා සම්බුදු බවට තමන් වහන්සේගේම ඥානයෙන් පත්ව ඇසළ පොහෝ දිනක දෙසූ දහමේ සාරය දිවියට එකතු කර ගැනීමයි. එනම් බ්‍රහ්මයෙක් හෝ දෙවියෙක් හෝ මිනිසෙක්ව ඉපදීම දුකකි. මේ දුක නැති කිරීමට නම් කෙලෙස් උපදවන සියල්ලක් අතහැර හිස ගිනිගත්තෙකු සේ ඒ ගින්න නිවා ගැනීමට උත්සුක වන්න. ශීල, සමාධි, ප්‍රඥා වඩා මඟ ඵල අවබෝධ කර ගැනීමයි.

ඒ උතුම් දහම් මඟ අනුගමනයට ඔබට ශක්තිය ධෛර්ය ලැබේවා.

ශාස්ත්‍රවේදී වත්තේගම
කුසලධම්මා මෙහෙණින් වහන්සේ.



# පුරාණ සෙල්ලිපි වලින් හෙළි වන ආයුර්වේද තොරතුරු

ශ්‍රී ලංකාවේ වෛද්‍ය ක්‍රමය පිළිබඳ මූලික ඉතිහාසයට අදාළ වන ඵලදායි තොරතුරු අතරින් පළමු තැන හිමි වන්නේ මහා වංශයටයි. දෙවනි තැන හිමි වන්නේ ශිලා ලේඛන (සෙල්ලිපි) වලටය.

පැරණි රජවරුන් සහ ඔවුන්ගේ රට වැසියන්ගේ මත ප්‍රකාශ කිරීම සහ නිවේදන ගල්ගුහා පර්වත ගල්කණු සහ පුවරුවල වාර්තා කරන ලදි.

ශිලා ලිපි සම්භාරයක් ශ්‍රී ලංකාවට උරුම වී තිබෙන අතර ඒවා අනාගත පරම්පරාව සඳහා ආරක්ෂා වී තිබේ. මෙම ශිලා ලිපි සියවස් ගණනාවක් තුළ අව් වැසි වලට අනාවරණය වෙමින් විනාශයෙන් බේරී ඇති අතර අද ඒවා ජාතික උරුමයන් වශයෙන් සලකනු ලැබේ.

මෙතෙක් සොයාගෙන ඇති මුල්ම ශිලා ලිපිය ක්‍රි.පූ. 247-207 දක්වා රජ කළ දේවානම්පියතිස්ස රජ සමයට අයත්ය.

මෙතුමා ඉන්දියාවේ අශෝක රජුගේ සමකාලීනයකි. අශෝක රජු විසින් ලියන ලද සෙල්ලිපි කියවා මුලින්ම තේරුම් ගන්නා ලද්දේ 1826 දී ජේම්ස් ප්‍රින්සප් මහතා විසිනි.

බ්‍රාහ්මීය අකුරෙන් ලියන ලද විවිධ දේශිය සෙල්ලිපි පහසුවෙන් සොයා ගන්නා ලද අතර ආණමඩුව රෝහලට නුදුරින් තෝනිගල පිහිටි ගලක ශිලා ලිපි 2ක් ඒ.ඩී. බ්‍රොඩි මහතා විසින් කියවන ලදි. එවැන්නක් පළමු වරට ශ්‍රී ලංකාවේදී කියවන ලද්දේ මෙතුමා විසින්ය.

ශ්‍රී ලංකාවේ බ්‍රාහ්මීය සෙල්ලිපි යුගය ක්‍රි.පූ. 3 වන සියවසේ සිට පළමු සියවස දක්වා පැවතියේය. එවැනි සෙල් ලිපි 1500 ක් පමණ තාපස භික්ෂූන් වහන්සේලාගේ ගල් ගුහාවල තිබී මෙතෙක් සොයා ගෙන තිබේ.

අනුරාධපුර පොළොන්නරු යුග වල වෛද්‍ය කර්ම රාශියක් තිබුණු බව එකල පැවති සෙල්ලිපි වලින් දැන ගන්නට ලැබේ.

ඒ අතර රෝහල් වලට රජයෙන් ලැබුණු අනුග්‍රහය වෛද්‍යවරු ලත් වැටුප් හා ප්‍රසාද දීමනා වෛද්‍ය ක්‍රම රෝහල් පාලනය පිළිබඳ ව්‍යවස්ථා ලිපි ප්‍රධාන තැනක් ගනී.

මෙකළ රජවරුන් සෙල්ලිපි වල බොහෝ විට තමන් විසින් කරවන ලද රෝහල් පිළිබඳව සටහන් කල බව පෙනේ. එම සෙල්ලිපි අතර කුකුරුමාන්දමන සෙල්ලිපිය, කිරිබත්වෙහෙර සෙල්ලිපිය, දොරධාවිල සෙල්ලිපිය, මැදිරිගිරිය සෙල්ලිපිය ප්‍රධාන තැනක් ගනී.

පස්වනවන කාශ්‍යප රජුගේ පුවරු ලිපියට අනුව එම නගරයේ මඟුල් වීදියේ දකුණු දොරටුව අසල රාජකීය වෛද්‍ය ශාලාවක් කරවා රෝග බිය සන්සිඳ වූ බවත් හතරවන මිහිඳු රජුගේ ජේතවනාරාම පුවරු ලිපියට අනුව ගිලනුන් වෙනුවෙන් වෙදගලක් කරවහ.

මේ තොරතුරු වලට අනුව පශ්චාත් අනුරාධපුර අවදිය වන විට රජයේ අනුග්‍රහය වන සුවිශාල සෞඛ්‍ය සංරක්ෂණ ව්‍යාපාරයන් දිවයිනේ ව්‍යාප්ත වී ඇති බව පෙනේ.

එකල රජවරුන් පමණක් නොව කණිෂ්ඨ නිළධාරීන්ද සෞඛ්‍ය සුභ සාධක කටයුතු වල නියලුන බව පෙනේ. එනම් සෙනවියෙකු විසින් කරන ලද ආරෝග්‍යශාලාවක් හා එයට ලබා දුන් පරිහාරයන් කුකුරුමාන්දවන සෙල්ලිපියේ සඳහන් වේ.

බෙහෙත් ගෙවල් රෝහල් වෙද ගෙවල් තිඹිරි ගෙවල් වැඩි වශයෙන්ම රාජකීය ප්‍රසාද දීමනා වලින් සම්මාන ලැබූ බවට මේ අවධියේ පිහිටු වන ලද අත්තානි පරිහාර කරුණු වලින් පෙනේ.

අත්තානි පරිහාර යනු රාජ්‍ය සභාවේ සම්මානයෙන් පවරා දෙනු ලබන විශේෂ අනුග්‍රහ හා වරප්‍රසාද ඇතුළත් ප්‍රදාන විශේෂයකි.

කිරිබත් වෙහෙර ලිපියට අනුව බමුණාකුඹුර බෙහෙත් ගෙට ප්‍රදානනය කල විහාර 2ක් වේ.

එකී භූමිය වටා සතර සීමා නිශ්චය කර දීමෙන් පෙනීයනුයේ බෙහෙත් ගේ අවට ඉඩම් නිරවුල්ව භුක්ති විඳීමේ අවශ්‍ය තාවයයි.

තවද මෙකී බෙහෙත් ගේ අවට සිමාව අභය භූමියක් සේ ප්‍රකාශයට පත් කර ඇති අතර එකී භූමියට පැමිණෙන අපරාධකරුවන් අත්අඩංගුවට ගැනීමේ අයිතියක් එක එල්ලේම රාජ පුරුෂයන්ට නොවූ අතර බෙහෙත් ගෙය භාරකරුවන්ට දන්වා එයින් පිටතදී ඔවුන් අත්අඩංගුවට ගත යුතු බව දක්වා ඇත.

තවද රාජ්‍ය නිළධාරීන්ට නිළ ඇඳුමින් රෝහල් කරා ඇතුළු විය නොහැකි බවද රෝහල් භූමිය තුළ කිසිඳු ප්‍රාණ ඝාතයක් සිදු කළ නොහැකි බවද දක්වා ඇත.

මෙයින් පැහැදිළි වන්නේ ආරාම භූමි මෙන්ම බෙහෙත් හල් භූමිද රාජ්‍ය පාලනයෙන් තොර ස්වාධීන ආයතන ලෙස පවත්වා ගෙන ගිය ඒවා බවයි.

**" පස්වන කාශ්‍යප රජුගේ පුවරු ලිපියට අනුව එම නගරයේ මඟුල් වීදියේ දකුණු දොරටුව අසල රාජකීය වෛද්‍ය ශාලාවක් කරවා රෝග බිය සන්සිඳ වූ බවත් හතරවන මිහිඳු රජුගේ ජේතවනාරාම පුවරු ලිපියට අනුව ගිලනුන් වෙනුවෙන් වෙදගලක් කරවූ බවත් පෙනේ. "**



ගොකරැල්ල පොල්ගොල්ල ආයුර්වේද
වෛද්‍ය විද්‍යාලීය කථිකාචාර්යය
වෛද්‍ය එම්.කේ. රෝහිත හපුගොඩ



## ඇසල පොහොය දින වැදගත්කම

1. බෝසත් කුමරු මව්කුස පිළිසිඳ ගැනීම.
2. අභිනිෂ්ක්‍රමණය සිදුවීම.
3. පළමු මංගල ධර්ම දේශනය පැවැත්වීම.
4. පළමු ධර්ම සංගායනාව පැවැත්වීම.
5. කොණ්ඩඤ්ඤ තවුසා සෝවාන් වීම.
6. භික්ෂූන් වහන්සේලා පෙර වස් විසීම.
7. රාහුල කුමරුගේ උපත සිදුවීම.
8. ගන්ධබ්බ රුක්ඛ මූලයේදී යමාමහ පෙළහැර පෑම.
9. කීර්ති ශ්‍රී රාජසිංහ රජු සියම් දේශයෙන් උපසම්පදාව ගෙනවීම.

# කාන්තා සිත විකසිත කළ භික්ෂුණී ශාසනය



ක්‍රි. පූ. 6 වන සියවසේ භාරතයේ සිටි බමුණු මතයන්ට යටත්ව කාන්තාව සැනසීම යන්න අල්ප මාත්‍රයක්වත් නොදැන සිටියාය. එවකට ඇයට ශෝචනීය ඉරණමක් අත්ව තිබිණි. දේශපාලනික, අධ්‍යාපනික, සමාජීය යන කිසිදු කර්තව්‍යයක නියැලීමට ඇයට අවසර නොලැබිණි. එමෙන්ම කාන්තාව යනු බුද්ධියෙන් හීන, නූගත්, චපල තැනැත්තියක් ලෙසට එකල සමාජය ද පිළිගත්හ.

**මුඛ පදමං දලාකාරං**
**වාචා චන්දන සිතලං**
**මධු තිෂ්ඨති ජිව්භාග්‍රෙ**
**හෘදයෙතු හලා හලං**

කාන්තාවන්ගේ මුහුණ පියුමක් සේ පියකරුය. වචන සඳුන් සේ සිසිල්ය. දිවග මී බඳුය. එහෙත් හදවතේ ඇත්තේ හලාහල විෂය. එමෙන්ම එකල පුරුෂාධිපත්‍ය කෙරතම් ප්‍රබලව ක්‍රියාත්මක වූයේද යන්න පහත කරුණින් අර්ථ ගැන්වේ.

**බාල්‍යෙ පිතුර වසෙ තිෂ්ඨෙත**
**ප්‍රාණි ග්‍රහසය යෞවනෙ**
**පුත්‍රාණං භරතරී ප්‍රෙතෙ**
**නභජෙත ස්ත්‍රී ස්වතනත්‍රනාම්**

බාල කාලයේ පියා යටතේ ද, තරුණ කාලයේ ස්වාමියා යටතේ ද, සැමියා මළ පසු වැඩිමහල් පුතු යටතේ ද විසිය යුත අතර ස්ත්‍රියට නිදහස්ව ස්වාධීන විසීමට ඉඩ නොදිය යුතු බවයි.

ආදි කාලීන බ්‍රාහ්මණ සමාජයේ සිටි කාන්තාවන් 'ද්වංගුල පඤ්ඤා' අඟල් දෙකේ නුවණ ඇති අය වශයෙන් බමුණන් ප්‍රකාශ කොට ඇත. දරුවන් වැදීම හා හැදීම පමණක් ඔවුන්ගේ කාර්ය ලෙසට ද ගැහැණු දරුවකු ඉපදීම මහා අභාග්‍යයක් ලෙසට ද එකළ සමාජය පිළිගෙන තිබුණි. කොසොල් රජුගේ අග්‍ර මහේෂිකාව වූ මල්ලිකා දේවියට ගැහැණු දරුවකු බිහි වූ බව රජුට දන්වන ලද්දේ රජු බුදු රදුන් හමුවීමට ගොස් සිටි අවස්ථාවේදය.

රජුගේ මුහුණ අඳුරු වනු දුටු බුදුරදුන් 'මහ රජ කුමක් නිසා කනස්සලු වෙන්නේ දැයි' ඇසුවේය. එවිට 'ස්වාමීනී, මල්ලිකාවට දුවක් ලැබී ඇතැයි' ප්‍රකාශ කළ කල්හි බුදුරදහු,

**ඉත්ථිපි එකච්චයා**
**සෙය්‍යා පොස ජනාධිප**
**මේධාවිනී සිලවතී**
**සසයු දෙවා පත්බ්බතා**

**තසසා සො ජායති පොසො**
**පුරො හොති ජනාධිප**
**තාදිසා සුභගියා පුතෙතා**
**රජජම්පි අනුසසාති**

*(සංයුක්ත නිකාය - කෝසල සංයුක්තය ධිතු සූත්‍රය)*

ජන නායකයාණෙනි, නුවණැති ශ්‍රේෂ්ඨ වූ නැඳි මයිලණුවන් දෙවි කොට සලකන පතිවත ආරක්ෂා කරන ස්ත්‍රීහු ද සිටිති. .එවැනි වාසනාවන්ත අයගේ දරුවෝ රාජ්‍ය පාලනය කරන්නේය. මහ රජ ස්ත්‍රීහු හොඳින් පෝෂණය කරන්න.

බුදුන් වහන්සේගෙන් ලැබූ එවන් අනුසස් නිසා සමාජයේ කාන්තාවන් වෙත තිබූ පහත් තත්ත්වය ටිකෙන් ටික මැකී යන්නට පටන් ගත්හ. ඇයගේ මානුෂික අයිතීන් නිදහසේ පරිහරණය කිරීමට අවස්ථාව සැලසින.

බුදුරජාණන් වහන්සේ භාරතය තුළ පහළ වන විට කාන්තාවගේ ජීවිතය ඉතා ඛේදනීය වුවද උන් වහන්සේගේ පහළ වීමෙත් සමඟ එය ඉතා සීඝ්‍රයෙන් වෙනස් වන්නට විය. ඇයගේ නුවණෙහි සැබෑ තතු හෙළි කිරීමට තේරි ගාථා මනා නිදසුනෙකි.

**නසො සබෙබසු ඨානෙසු**
**පුරිසො හොති පණ්ඩිතා**
**ඉත්ථිපි පණ්ඩිතො හොති**
**තත්ථ තත්ථ විචක්ඛණා**

සෑම අවස්ථාවකම පුරුෂයෝ පණ්ඩිතයෝ නොවන බවත් විචක්ෂණශීලී කාන්තාව ඒ ඒ ස්ථානයනිහි පණ්ඩිත වන බවත්, උවැසියක් හා භික්ෂුණියක් වශයෙන් ද බුදු දහම තුළින් වනිතා උරුම කරගත් වරප්‍රසාද සුළු පටු නොවේ. බමුණු ආකල්පය යටතේ ආගමික මධ්‍යස්ථානයකට ගමන් කිරීමට යාග කර්මයකට සහභාගී වීම ආදිය සපුරා තහනම්ය.

**<u>භික්ෂුණී ශාසනයේ ආරම්භය.</u>**

බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත් වී වසර පහක් ගත වූ කල ශාක්‍ය ජනපදයේ කිඹුල්වත් පුරයෙහි වූ නිග්‍රෝධාරාමයෙහි වැඩ වසන සමයෙහි මහා ප්‍රජාපතී ගෝතමී තොමෝ උන් වහන්සේ වෙත අවුත් වැඳ එක් පසක සිට අනගාරික ශාසනනයේ හි පැවිද්ද ඉල්ලා සිටියහ. බුදු රජාණන් වහන්සේ ගෝතමීයගේ ඉල්ලීම පහළමු වැනි දෙවැනි තුන්වැනි වරටත් ප්‍රතික්ෂේප කළහ. ඉක්බිති බුදු රජාණන් වහන්සේ කිඹුල්වත් පුරෙන් නික්ම විශාලා මහනුවර කූටාගාර ශාලාව වෙත වැඩි සේක. මහා ප්‍රජාපතී ගෝතමී තොමෝ රෝහිණී නදී තීරයේ පැවිදිවූ කුමාරවරුන්ගේ භාර්යාවන් පන්සිය දෙනා සමඟ කෙස් කපා කසාවත් හැද කිඹුල්වත් නුවරින් පිටත් ව යොදුන් පනස් එකක් පමණ වූ දීර්ඝ මාර්ගය පා ගමනින්ම ගෙවා කූටාගාර ශාලාව වෙත පැමිණියහ.

අනඳ හිමියන්ට කරුණු කියා උන් වහන්සේ මාර්ගයෙන් කාන්තාවන්ට බුදු සසුනේ පැවිද්ද ලබා දෙන ලෙස ඉල්ලීය. අනඳ හිමියන්ගේ බලවත් ඉල්ලීමෙන් අෂ්ට ගරුධර්ම පනවා භික්ෂුණී ශාසනය ඇරඹීමට කටයුතු කළාය. අෂ්ඨ ගරු ධර්ම ලෙස,

01.උපසම්පත්තියෙන් වස් සියයක් වූ මෙහෙණක විසින් වුවද එදිනම උපසපන් වූ භික්ෂුහු දැක වැඳුම් පිදුම් ආදී ගෞරව දැක්විය යුතුය.
02. භික්ෂූන් නොමැති ප්‍රදේශයන්හි මෙහෙණක විසින් වස් නොවැසිය යුතුය.
03. අඩ මසක් පාසා මෙහෙණක විසින් උභතෝ සංඝයාගෙන් පොහොය විචාල යුතුය. අවවාද දීමට පැමිණීම ද බලාපොරොත්තු විය යුතුය.
04. වස් අවසානයේදි භික්ෂු, භික්ෂුණී යන උභතෝ සංඝයා ඉදිරියේ වස් පවාරණය කළ යුතුය.
05. ගරු ඇවතකට පැමිණි මෙහෙණක විසින් උභතෝ සංඝයා කෙරෙහි අඩ මසක් මානත් පිරිය යුතුය.
06. අවුරුද්දක් පුහුණුවෙමින් ශික්ෂමානාවක් සිට පසුව උභතෝ සංඝයාගෙන් උපසම්පදා ලැබිය යුතුය
07. කවර කාරණයක් නිසාහෝ මෙහෙණක විසින් භික්ෂු කෙනෙකු හට ආක්‍රොෂ පරිභව නොකළ යුතුය.
08. මෙහෙණින් විසින් භික්ෂූන් හට අවවාද නොකොට යුතුයි. භික්ෂූණී විසින් භික්ෂූණීන්ට අවවාද කළ යුතුයි.

ඉහත ගරු ධර්ම වලට එකඟ වූ මහා ප්‍රජාපතී ගෝතමිය ප්‍රධාන පන්සියයක් කාන්තාවනට බුදු පියාණන් වහන්සේ පැවිදි උපසම්පදාව ලබා දුන්හ.

උදුවප් පුර පසළොස්වක පොහෝදින ලක්දිව දඹකොළ පටුනට සංඝමිත්තා මහරහත් තෙරණිය ප්‍රධාන පිරිස ජය සිරි මහා බෝධීන් වහන්සේගේ අංකුරයක් රන් පාත්‍රයක බහා වඩම්මවාගෙන ආහ. දඹකොළ පටුනේ වෙරළට නෞකාව ලං වූ පසු දෙවන පෑතිස් රජු ජලයට බැස සොළොස් කුල ජනයන් සමඟ බෝධි ශාඛාවත් සංඝමිත්තා රහත් මෙහෙණිය ප්‍රමුඛ මෙහෙණින් වහන්සේලාත් මහත් ගෞරවයෙන් පිළිගෙන පසුව රාජකීය සම්මාන සහිතව මහ පෙරහැරින් අනුරාධපුර මහමෙවුනා උයන වෙත වැඩම කරවාගෙන ගියේය. එසේ වැඩමවා ගෙන ආ බෝධිය මහමෙව්නාවේ රෝපණය කළහ. සංඝමිත්තා මෙහෙණියගේ වැඩම වීමෙන් ලක්දිවට සිදු වූ ශක්තිය ඉමහත්ය. ලාංකීය භික්ෂූණී ශාසනය ඇරඹීම ද මේ අතර මුල් තැනක් ගත්හ.

මහත් ආත්ම බල ශක්තියකින් හා ආත්ම බලයකින් යුතු සංඝමිත්තා මෙහෙණිය ලක්දිව කාන්තාවන්ගෙන් කිසිදු ගෞරවයක් බලාපොරොත්තනු නොවී කරුණාවෙන් යුතුව තම දේශය හැර දමා විදේශගතව අර්ධ ශත වර්ෂයකට අධික කාලයක් මුළුල්ලෙහි කළ උදාර සේවය නිසා ලක්දිව මෙහෙණින්සසුනක් ඇරඹිනි. ඒ හෙයින් ශ්‍රේෂ්ඨ වනිතාවන් රැසක් ද ඇතිවිය. විහාරමහා දේවිය, සෝමා දේවිය ඊට නිදසුන්ය. ඇහැලේපොළ කුමාරිහාමි වැනි ආදර්ශමත් කතුන් බිහි වූයේද සංඝමිත්තා මහරහත් තෙරණියගේ පූර්වාදර්ශ ලබමිනි. ඇතැම් කාන්තාවනට මුහුණ පෑමට වූ දුක් කම්කටොළු නිසාම බණ භාවනා කොට විමුක්තිය ලබා ගත්හ.

මෙසේ සිංහල කාන්තා පක්ෂය පිළිබඳ කළ හැකි හැම සේවයක්ම නො අඩුව ඉටු කොට එකුත් සැට වියේදි 'උත්තිය' රජුගේ රාජ්‍යත්වයෙන් නව වැන්නෙහි සිංහල වනිතා සමාජය ආලෝකවත් කළ මිණි පහණ හත්ථාලහක මෙහෙණවරදී නිවී ගියාය.

නිලූකා සේනාරත්න

බුදුදහමේ මූලික ඉගැන්වීම්

# පටිච්චසමුප්පාද විවරණය

අනන්ත සසර කතරේ අතරමංව ගියා වූ මඟ නොදන මංමුලා වූ සත්වයා එයින් මුදවා ගනු වස් තථාගතයන් වහන්සේ විසින් අමාදම් දෙසූ සේක. ඒ අතර සත්වයාගේ භව ගමන සිදුවන ආකාරයත් භව ගමන නිමා කරන ආකාරයත් දේශනා කොට වදාළ ධර්මය පටිච්ච සමුප්පාද යනුවෙන් දැක්වේ.

පටිච්ච සමුප්පාද යන්නෙහි අර්ථය ගින්න නිසා දුම ඇති වන්නාක් මෙන්ද ගස නිසා ගෙඩිය ඇති වන්නාක් මෙන්ද තමා නිසා පෙර නොතිබූ අන් දෙයක් ඇතිවීමට හේතු වන්නා වූ දෙයට පටිච්ච සමුප්පාදය යැයි කියනු ලැබේ.

පටිච්ච සමුප්පාදය න්‍යායක් ලෙසද චක්‍රයක් ලෙසද දක්වීමේදී අංග දොළසකි.

අවිජ්ජා පච්චයා සංඛාරා ....
දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති
යනුවෙන් සූත්‍රයේ දැක්වේ. එනම්,

- අවිද්‍යාව හේතුකොටගෙන සංස්කාරයෝ හට ගනිති.
- සංස්කාර හේතුකොට ගෙන විඥාන හට ගනිති.
- විඥාන හේතු කොටගෙන නාම රූප හට ගනිති.
- නාමරූප හේතුකොට ගෙන ෂඩ්ආයතන හට ගනිති.
- ෂඩ් ආයතන හේතුකොට ගෙන ස්පර්ෂය හට ගනිති.
- ස්පර්ෂය හේතුකොට ගෙන වේදනාව හට ගනිති.
- වේදනාව හේතුකොට ගෙන තෘෂ්ණාව හට ගනිති.
- තෘෂ්ණාව හේතුකොට ගෙන උපාදාන හට ගනිති.
- උපාදානය හේතුකොට ගෙන භවය හට ගනිති.
- භවය හේතුකොට ගෙන ජාතිය හට ගනිති.
- ජාතිය හේතුකොට ගෙන ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාසයෝ වෙති.


මෙසේ මේ සකල දුක්ඛන්ධයාගේ පහළවීම වේ. එනම් සත්වයාගේ භව චක්‍රය සකස් වේ. මෙහි පළමු අංගය අවිද්‍යාවය. අවිද්‍යාව යනු නොදැනීමයි. නැතහොත් අනවබෝධයයි. කුමන අනවබෝධයක්ද චතුරාර්ය සත්‍යය පිළිබඳ නොදැනීමයි.

න්‍යාථ කත්වා අවිජ්ජා, දුක්ඛෙ අඤ්ඤාණං, දුක්ඛ සමුදයෙ අඤ්ඤාණං, දුක්ඛ නිරොධෙ අඤ්ඤාණං, දුක්ඛ නිරෝධ ගාමිණි පටිපදාය අඤ්ඤාණං අයං වුච්චති අවිජ්ජා

දුක පිළිබඳ නොදැනීම, දුකට හේතුව නොදැනීම, දුක නැති කිරීමට නොදැනීම, දුක නැති කිරීමේ මාර්ගය නොදැනීම අවිද්‍යාව බව මෙයින් කියවේ.

මෙහි දුක යනු ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව අප්‍රිය සම්ප්‍රයෝග දුක, ප්‍රිය විප්‍රයෝග දුක, කැමති දේ නොලැබීමේ දුක, අකමැති දේ ලඟාවීමේ දුක සහ පංච උපාදානස්ඛන්ධ දුක්ඛයෝය. මෙහි පංච උපාදානස්ඛන්ධ දුක්ඛයන්නට හැර දක්වූ දුක් පිළිබඳව සත්‍ය ලෙසම ඒවා දුක් බව සියල්ලෝම දනිති.

පංච උපාදානස්ඛන්ධ දුක යනු රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ පංචකය රාග, ද්වේෂ, මෝහාදියෙන් අල්ලා ගැනීමෙන් සසර පැවැත්මට හේතුවක් හැදීමෙන් ඇතිවෙන දුක්ඛයයි. එසේම එය මෙලොව දීමත් දුක්ඛයක් බවට පත්වේ. උදාහරණයක් ලෙස මෙසේ ගනිමු. කණ ශරීරයේ රූප කලාප වලින් එකකි. එම



බවට පත්වේ. උදාහරණයක් ලෙස මෙසේ ගනිමු. කණ ශරීරයේ රූප කලාප වලින් එකකි. එම රූපයට ශබ්ද තරංග ලැබේ. එම ශබ්දය සිංදුවක් යැයි සිතමු. කණත් සෝක ප්‍රසාදයත් ශබ්දයත් නිසා නිරායාසයෙන්ම විඤ්ඤාණය ඇතිවේ.

සොතං ච සද්දංච පටිච්ච උප්පජ්ජති සොක විඤ්ඤාණං එම විඤ්ඤාණය හරහා සංඥා නිකුත් වේ. මේ අසවල් ගායකයාගේ අසවල් සිංදුවය. මේ සිංදුව ඉතා මිහිරිය. මෙය කටෝරය. ඉතා අමිහිරිය. ආදී සංඥා ලැබීමෙන් ඔබ එයට රුචි අරුචිකම් දක්වයි. එනම් ලෝභය හෝ ද්වේශය ඇතිකර ගනී.

නැතහොත් මධ්‍යස්ථව ඇසෙන්නට සලස්වයි. එනම් උපේක්ෂාව ඇතිකරගනී. එනම් ලෝභයෙන් හෝ ද්වේශයෙන් හෝ උපේක්ෂාවෙන් විඳිනු ලබයි. එය වේදනා නම් වේ. එනම් කණ හරහා ඔබ උපාදානයක් කර ඇත. මෙම උපාදානය අකුසලයකි.

එයින් අප්‍රඥ්ඥාභි සංඛාර සිදුවේ. අවිජ්ජා පච්චයා සංඛාරා එනම් භවයට පියවරක් තබයි. එසේනම් උපාදාන නොවන්නට කණ පාලනය කළ යුත්තේ කෙසේද? කණ අනිත්‍යයි, ශබ්ද රූපය අනිත්‍යයි, විඤ්ඤාණය අනිත්‍යයි, සංඥාව අනිත්‍යයි, සංස්කාරය අනිත්‍යයි, යනුවෙන් සියල්ලෙහි අනිත්‍ය දත යුතුය. ඇස, නාසය, දිව, හම, මනස යන ඉන්ද්‍රියන් හරහාද ඇතිවන උපාදානයන් මෙසේ අනිත්‍ය ලෙස දැකිය යුතුය. විඳීම නැති තැන මෙලොව ද දුක නැත. සසර දුක ද නැත.

දුකට හේතුව තණ්හාවය, කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා යනුවෙන් එය ත්‍රිවිධාකාරය. කාම තණ්හා යනු



ඇස, කණ ආදී ඉන්ද්‍රියන් හය පිනවීමට ඇති කැමැත්තය. භව තණ්හාව යනු මැරි මැරි ඉපිද ඉපිද දිව්‍ය මානුෂීය සම්පත් විඳීමේ කැමැත්ත හා ඒ සඳහා පුණ්‍ය කර්ම සිදුකිරීමය. පුණ්‍ය කර්ම තුළින් පුඤ්ඤාභිසංඛාර සිදුවේ. එයින් භවයට පියවරක් තැබේ.

විභව තණ්හා යනු නැවත භවයක් තිබෙනවාය යන විශ්වාසයකින් තොරව මේ ජීවිතය තුළ පස්පව් දස අකුසල් නොබියව කරමින් ජීවත්වීමයි. වැරදි මාර්ග වලින් තණ්හාවෙන් සියල්ල තමා සතු කර ගැනීමයි. මෙහිදී අපුඤ්ඤාභි සංඛාර සිදුවේ. එසේ නම් කාමතණ්හා, භව තණ්හා, විභව තණ්හා හඳුනාගෙන ඉවත් කළහොත් දුක නැති කළ හැකිය. දුක නැති කිරීමේ මාර්ගය ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි.

''තත්ථ කථවා අවිජ්ජා පච්චයා සංඛාරා පුඤ්ඤාභි සංඛාරො අප්‍රඤ්ඤාභි සංඛාරො, ආනෙඤ්ජාභි සංඛාරො, කාය සංඛාරො, වචී සංඛාරො, චිත්ත සංඛාරොති''

චතුරාර්ය සත්‍යය නොදැනීම නිසා සත්වයා සංස්කාරයන් සිදුකරනු ලබයි. සංස්කාර කොටස් හයකි. එහි පුඤ්ඤාභිසංඛාර යනු පිං රැස් කිරීමයි. අපුඤ්ඤාති සංඛාර යනු පවු රැස් කිරීමයි. ආනෙඤ්ජාභිසංඛාර යනු ධ්‍යාන ශක්තීන් රැස් කිරීමයි. කාය සංඛාර යනු කය උපයෝගි කරනු ලබන පින් පව් ක්‍රියාවන්ය.

වචී සංඛාර යනු වචනය උපයෝගී කරගනිමින් සිදුකරනු ලබන පින් පව් ක්‍රියාවන්ය. චිත්ත සංඛාර යනු සිත උපයෝගී කරගනිමින් සිදුකරනු ලබන ක්‍රියාවන්ය. මෙම පින්, පව් සහ ධ්‍යාන වලට ඇති ආශාවන් කරණ කොටගෙන විඤ්ඤාණය හට ගනී. විඤ්ඤාණය ආකාර 6කි.

1. චක්ඛු විඤ්ඤාණය,
2. සෝත විඤ්ඤාණය,
3. ඝාණ විඤ්ඤාණය,
4. ජිව්හා විඤ්ඤාණය,
5. කාය විඤ්ඤාණය,
6. මනො විඤ්ඤාණය යනු ඒ හයයි.

විඤ්ඤාණයක් යනු කුමක්ද? එය දැනුවත් භාවයයි. විඤ්ඤාණයක් හටගන්නේ කෙසේද?

උදාහරණයක් ලෙස ජිව්හා විඤ්ඤාණය ගෙන බලමු. දිවට ආහාරයක් සමීප කළ වහාම රසය දැනේ. දිවත් රසයත් එකතු වූ තැන රසය නම් දැනීමක් වේ. එය විඤ්ඤාණයයි. එම දැනීමෙන් අනතුරුව ස්පර්ෂය හට ගනී. මෙම ස්පර්ෂයෙන් වින්දනයක් ලබයි. සුඛ, දුක්ඛ, උපේක්ෂා ලෙස මෙම වින්දනය හරහා අල්ලා ගැනීමක් උපාදානයක් හරහා පිං පව් රැස්වේ. පින් හෝ පව් සිදුකළ බව දන්නේ විඤ්ඤාණයයි.

එබැවින් සංඛාර හා විඤ්ඤාණ එකතුව නාම රූප කරා එළඹේ. රූප යනු මව් පියන්ගේ යුක්තානුව  හා ආහාරයි. නාම යනු වේදනා, සංඥා, සංඛාර වේ.

මෙම නාම රූපයන්ට ජීවයක් ලැබෙන්නටත් සංඛාර රැගත් විඤ්ඤාණය හේතුවිය යුතුය. විඤ්ඤාණ පච්චයා නාම රූපං මෙම නාම රූපයන්ට මව්පියන්ගේ ජාන ශක්තියත් කර්මයත් පදනම් වෙමින් නාම රූප පච්චයා සළායතං චක්ඛු ආදි ආයතන හය ලැබේ. සළායතන පච්චයා ඵස්සො මෙම ආයතන හය කරණ කොටගෙන ස්පර්ශයන් හට ගනී. උපේක්ෂා වේදනාවේදී ඇති වන්නේ මෝහයයි.

මෙම ත්‍රිවිධ වේදනා අතුරෙන් එක් වේදනාවකට පත්වීම දුකකට පත්වීමයි. එනම් භවය සකස් කිරීමයි. වේදනා පච්චයා තණ්හා මෙසේ ආයතන හය කරන කොටගෙන ඇති කරගන්නා වූ වේදනාවේ ප්‍රතිඵලයක් ලෙස තණ්ාව උපදවයි. තණ්හාව යනු සිත තුළ ඇති කර ගන්නා වූ අල්ලා ගැනීමයි. මෙය ඇලීම, ගැටීම දෙකම පෙන්නුම් කරයි. එනම් මෙම අල්ලා ගැනීම හේතුවෙන් ලෝභය පමණක් නොව ද්වේශයද පැන නගී. තණ්හා පච්චයං උපාදානං එම ඇලීම කණ්හාව නිසා දැඩිකොට අල්ලාගනී. එයට උපාදාව යැයි කියනු ලැබේ. උපාදානය ආකාර හතරකි.කාමුපාදාන, දිට්ඨූපාදාන, සීලබ්බතුපාදාන, අත්තවාදුපාදාන යනුවෙනි. කාමූපාදාන යනු තමා කැමති දේවල් දැඩිකොට අල්ලා ගැනීමයි.

15 පිටුවට...

ශාස්ත්‍රවේදී වත්තේගම
කුසලධම්මා මෙහෙණින් වහන්සේ
ගොකරැල්ල

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER

රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.

දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 5361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: rangirinewspapers@gmail.com
වෙබ් අඩවිය: www.rangirisrilanka.lk

# සත්‍යයේ ආලෝකය ලොව පුරා පතුරවමු

ලෝක සත්වයා වෙත සත්‍යයේ ආලෝකය උදාවුණු උතුම් දිනය සිහිපත් කෙරෙන ඇසළ සමය එළඹෙන්නේ ශ්‍රී ලාංකිකයන් තුළ සංස්කෘතික ප්‍රබෝධයේ උණුසුමද ජනිත කරමිනි .

මහනුවර ශ්‍රී දළදා පෙරහැර මෙන්ම කතරගම, අළුත් නුවර, සීනිගම ,මහියංගනය ඇතුළු තවත් පුණ්‍යභූමි රැසක් මුල්කොටගත් මහ පෙරහැර ඇරඹෙන්නේ මේ මාසයේ අවසන් භාගයේය.

සංස්කෘතික වටිනාකම් පිළිබඳව කථා කිරීමේදී ලොව අන් කිසිදු රටකට නොදෙවෙනි ශ්‍රේෂ්ඨ දායාදයන් රැසක් අප සතුව ඇතිබව අභිමානයෙන් සිහිකළ හැකිය. නමුත් කාර්මික විප්ලවයෙන් පසුව ඇති වූ නවලෝක ධාරාවක් සන්නිවේදන තාක්ෂණයේ දියුණුවත් සමඟ ඇති වූ ජනප්‍රිය සංස්කෘතියේ බලපෑමක් නිසා අප විසින් දිගු කලක් රැක ගෙන සිටි මානව ගුණදම් වටිනාකම් මෙන්ම සංස්කෘතික හර පද්ධතීන්ට අත්වෙමින් පවතින්නේ අසුභ උදාවක් බව පෙනෙන්ට තිබේ.

මේ තත්ත්වය ලොව පුරාම දැකගත හැකිය.යුද්ධ, කැරළි,කළකෝලාහළ, ගැටුම් සහ ප්‍රචණ්ඩත්වයෙන් ලෝකයම වෙළී ගොස් තිබේ.

ඒ අතර ලෝකය පුරාම පාරිසරික ව්‍යසනයන්ද වැඩිවෙමින් පවතින බවද දැකගත හැකිය.මේ සියල්ලෙන් අපට පසක්වන්නේ මිහිමත මානව ශිෂ්ඨාචාරයේ ගමන් මඟ නිවැරදි නොවන බවය.

බුදුරජාණන්වහන්සේ විසින් චතුරාර්යය සත්‍යයෙන් හා ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙන් පෙන්වාදීමෙන් ඇරඹි පන්සාලිස් වසක් දේශනා කළ ශ්‍රී සද්ධර්මය තුළ මිනිසා මෙන්ම සමාජයද පරිසරයද දූවෙන තැවෙන බොහෝ ගැටළු වලට විසඳුම් තිබෙන්නේය. නමුත් සාර්ථකමය දායාදයට පිළිවෙතින් පෙළ ගැසෙන්නෝ අද විරලය.

රටක් රටක් පාසා ශ්‍රී සද්ධර්මයේ දහම් පණිවුඩය බෙදාහැරීමට අප මුල් විය යුතුය. රට පුරා වස්සාන සමය අරඹන මේ සමයේදී බෞද්ධයෝ නොවරදීම පංසලට විහාරයට යා යුතුමය භික්ෂූන් වහන්සේ මුණගැසී උතුම් දහම් කරුණු දැන කියා ගත යුතුය. දාන සිල භාවනාදී පිංකම් සංවිධානය කොට ඒ සඳහා අපගේ අනාගතය වන ළමා හා තරුණ පරපුරද ඊට සම්බන්ද කොට ගත යුතුය

බෞද්ධ මිනිසා බෞද්ධපවුල සහ බෞද්ධ සමාජය නැවත ගොඩ නැංවීමට අපි සැවොම පෙරමුණ ගත යුතුය.

මේ ඇසළ සමය ඊට ඉතාම උචිත කාලය බව යළිත් සිහිපත් කළ හැකිය.

# අවවාදයට වඩා ආදර්ශයෙන් යුතුව කටයුතු කරමු.



අවවාදයට වඩා ආදර්ශය ඉතාමත්ම වටිනා බව අපට බුදුපියාණන් වහන්සේගේ ජීවන චරිතයෙන් පිළිඹිබු වේ. උන්වහන්සේ බුදු වී පිරිනිවන්පානා තෙක්ම එනම් හතලිස් පස් වසරක් පුරාම ලෝකයාට කරන ලද අපිරිමිත සේවාව කොතෙක්දැයි කියා අගය කිරීමට තරම් සමතෙක් ලොව තවම පහළ වී නොමැත.

ඒ තරම්ම උන්වහන්සේගේ ධර්මස්කන්ධය අනන්තයි. අප්‍රමාණයි. ගැඹුරුයි. දෙසූ සෑම දහමක් තුළම උන්වහන්සේගෙන් පිළිබිඹුවූයේ අවවාදයට වඩා ආදර්ශයයි. මුළු ජීවිතය පුරාම උන්වහන්සේ දෙසු ශ්‍රී සද්ධර්මය පැවිදි ලෞකික සෑම සිත්සතන් කෙරෙහිම අසීමිතව ගලා ගියේ උන්වහන්සේගේ ආදර්ශයෙන් පිරී ජීවන චරිතය නිසාවෙනි.

එසේ නම් උන්වහන්සේ වෙතින් ලොවට දුන් ඒ උතුම් ආදර්ශය අපගේ ලෞකික ජීවිතවලට උකහා ගන්නේ නම් කෙතරම් වැඩදායක වන්නේද? සිතා බලන්න.

අද සමාජය දෙස බලන කල අවවාද දෙන්නෝ අපට අනන්තවත් මුණ ගැසෙති. එනමුදු ආදර්ශයෙන් යුතුව ක්‍රියා කරන්නෝ නම් දකින්ට ලැබෙන්නේ ඉතාමත් අල්ප වශයෙනි. බොහෝවිට මේ අවවාද දෙන්නෝ ළඟ ආදර්ශය දකින්න ලැබෙන්නේ නැත. ඔවුන් තම දරු පවුල් වලට සමාජයට ගමට රටට දෙන්නේ වැරදි ආදර්ශයන්ය. බොරුවෙන් මුවාවී පිටතට පෙන්වන්නේ භික්මුණු, දැහැමි චරිතයන්ය. මෙවන් චරිතයන් පිටතින් පෙන්වා ඔවුන් ගතකරන්නේ වැරදි ආකල්පයන් තුළෙහිය.

ආදර්ශයෙන් තොර වැරදි ක්‍රියා මාර්ගයන් තුළෙහිය. තවත් සමහරෙක් අනුන්ට අවවාද අනුශාසනා දෙමින් පෙනි පෙනී වැරදි වැඩ කරති. බොහෝවිට මෙවන් චරිත දේශපාලන භූමිකාව තුළද, පවුල් සංස්ථාවන් තුළද සුලබව දැකිය හැක. මව, පියා- වැඩිහිටි සහෝදරාදීන්, නැන්දා - මාමා, බාප්පා වැනි පවුලේ ඥාතීන් අතර කොතෙකුත් වැදි ආදර්ශයන් තම දරුවන් ඉදිරියේ සිදුවන අයුරු දැකිය හැක.

ඇතැම් පියවරුන් තම ලාබාල දරුවන් ලවා මත්වතුර බෝතලය ගෙන්වා ගැනීම, කඩ පිලට යවා දුම්වැටි ගෙන්වා ගැනීම වැනි ක්‍රියාවන්හි යෙදෙති. එබඳු අය සිතන්නේ නැහැ තම දරුවාත් යම් කලෙක එම වැරදි ආදර්ශයෙන් ක්‍රියාවට පෙලෙඹෙන බව.

ඇතැම් මව්වරුන්ද එලෙසමයි. තම හැදෙන දරුවන් ඉදිරියේ නොයෙකුත් වැරදි ක්‍රියාවනට හුරුවී සිටිති. දරුවනට අසංවර ලෙස කථා බහ කරති. ආදර වදනක් එවන් මව්වරුන් තුළ ඇත්තේම නැත. තම දරුවන් ඉදිරියේ තම ස්වාමිපුරුෂයාට පවා අසංවර ලෙස, අකීකරු ලෙස, කතා බහ කරති. හැසිරෙති. දරුවන්ද අනිවාර්යයෙන්ම ඒ මඟ යන්නාහ. නමුත් මේ මව්වරුනට තම දරුවන්ද කවදා හෝ වැඩිහිටි තත්ත්වයට පත්වූ කාලයක ඔවුන්ද එසේ හැසිරෙන බව ඔවුන් මොහොතකටවත් නොසිතති. ඇතැමුන්ට එසේ සිතීමට පවා මොළයක් ශක්තියක් නැත. නමුත් තම දරුවන් නොහොබිනා අන්දමින් හැසිරෙනු දුටු කල දරුවනට ගහති. බැණ වදිති. මෙය කකුළුවා ඇදයට යමින් තම පැටවුනට කෙළින් යන්ටෙයි කියා අවවාද කරන්නාක් වැනිය.

නමුත් අවවාද දෙමින් සංවරශීලීව හැසිරෙමින් තම දරුවනට ආදරයෙන් කතා බහ කරමින් දරුවන්ව යහමග යවනා සාමකාමී සුන්දර වූ සිතුම් පැතුම් තුළින් පිරිපුන් ආදර්ශයෙහි පිහිටා කටයුතු කරන දෙමාපියන්ද මේ අතර සමාජයේ සිටිනා බව අප අමතක නොකළ යුතුය. එවන් සුපිරි චරිතයන් ගෙන් හෙබි ජීවිතවලට මේ ලියන මාගේ උපහාරය පමණක් නොව සමාජයේද උපහාරය නොඅඩුව ලැබෙනු ඇත.

පවුල් සංස්ථාවන් තුළින් විවිධ දූර්වලතාවන් දකිද්දී සමාජයේ විවිධ තරාතිරමේ උගත්, ප්‍රබුද්ධ අය අතරින්ද යටකී දූර්වල තැන් එමට ඇති බව අත් විඳීමෙන්ම කිව හැක. දැකිය හැක. ගුරු දෙවිවරුන් ලෙස සමාජයේ ඉතා ආදරයෙන්, හා ගෞරවයෙන් පිදුම් ලබන, ගෝලබාලයින්ගෙන් වැඳුම් පිදුම් ලබන අපගේ ආදරණීය ගුරුමව්වරු ගුරු පියවරු ගැනයි. පාසලෙන් පමණක් නොව විශ්ව විද්‍යාල ආචාර්ය, මහාචාර්යවරුන් අතරින් පවා සුළු පිරිසකගෙන් පමණක් ආදර්ශයෙන් තොර වැරදි ක්‍රියාවන් දැකිය හැක.

එබැවින් මේ සියලු දූසිරිත් හා දූරාචාරයන්ගෙන් මිදී ආදර්ශවත් ජීවිත ගතකරන ලෙස අපි සියලු ශ්‍රී ලාංකිකයන්ගෙන් ඉල්ලා සිටිමු. එවිට අපේ අනාගත පරපුරද ඒ අනුව යලිත් යහපත් ගුණවත් සාරධර්ම අගයන පිරිසක් බවට පත්වේවි. අවවාදයට වඩා ආදර්ශය උතුම්ය යන්න අප සැමගේම තේමා පාඨය බවට පත්කර ගනිමු.

චන්ද්‍රලතා සුමනසේකර

# සඳ සිසිල

සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.

යහගුණ දහම් මට කියලා දෙනවා
හොඳ නරක තමවත් හඳුනා දෙනවා
හිතේ සවිය ගෙන අපි රැකදෙනවා
පතිනි දෙවිඳු අප්පච්චීව රැකදෙනවා

මිහිරි



## ඇසළ සඳ උදා විය

ඇසළ සඳේ සඳ කිරණේ
සත් මඟ මොක් සුව වින්දේ....
අම මිහිරෙන් සුවය ලැබූ
ඒ දින සිහියට එන්නේ......//

සව් සත භව අඳුර තුළින්
ගලවා නුවණැස පෑදූ
සව් කෙලෙසුන් නැසුවා වූ
සම්බුදු හිමි මැවිල පේනවා......//

දෙසැටක් මිත්‍යා පරදා
මධ්‍යම පිළිවෙත දිනවා
ඒ වැයූ සදහම් ගීතේ
තවමත් දෙසවනට අසෙනවා....//

පස්වග තවුසන් අරඹා
දම්සක් පැවතුම් දෙසුවා
මුව පොව්වන් බණ ඇසූ ඒ
මිගදායේ සුවඳ දැනෙනවා.....//

ගලගෙදර රතන වංශ හිමි.

## නූතන බෝසත්වත

සිද්ධාර්ථ,
එදා නුඹ,
අතැර ගියා සේ රාජ සම්පත්
හැකිනම් අපටත්
නික්ම යන්නට මේ පැල්පත අතැර
එදා නුඹ
නේරංජන නදී තෙරින් පැන
එතෙර වූන සේ සසරින් මේ
හැකිනම් අපටත්
එතෙර වන්නට බැම් සිරකර එක්තැන්
කළ මේ සසරින්
එදා නුඹ
පුංචි රාහුලයන් දෙස බලාන
දනට වැඩියා සේ
හැකිනම් අපටත්
අමතක කර යන්නට
කිරි ඉල්ලා හඬනා පොඩි උන් දෙනයන
එදා නුඹ,
යශෝදරාවට දහම් දෙසන්නට වැඩියා
සේ
අහස උසට හීන මවන්
වැරහැලි ඇඳ දුක් විඳිනා
ඇගේ මුහුණ දෙස බලාන
බෑ සොයුර මට නුඹ මෙන් අභිනික්මන්
කරන්න.....!

හිරාන් සසංක හෙට්ටිආරච්චි
ලෙනදොර

## ඕමාවෙනු මට ගුතිං

හින් සිරුවෙ ඇවිත් හද ගැට්ටේ ලැගුම් ගෙන
නවතින්න අවසරද අහනවා
ආචි හද කුටිරයෙ ඇතුළතින් අගුවලා
ගුතිං සැනසිල්ලු මට විදනවා

හදපුර සෙනේහය පැටවුන්ගෙ කිචි බිචිය
දෙව්ලොවක සිරිය මට මැවෙනවා
ඇඹින්දක හඬැස්සක් වත් ගුතිං නැති තැනක
සිහින් ගුක්බිැල්ලක් ඇසෙනවා

ආයෙත්ම යන්න නම් මතු බවෙක ගුඩ ලැබිච්ද
කියා තොර තොරෙන් අහනවා
ඕමාවෙනු මට ගුතිං උප නුපන් හැම බවේ
හිමිකාරයෙක් මටත් ගුන්නවා

ශ්‍රියා විජේසේකර



## සිතන්නට යමක්......

**එපා** කිසිවිට කෝප වන්නට ඇගේ ලේ ටික දැවෙනවා
**එපා** කිසිවිට උඩඟු වන්නට ඔබේ යහගුණ මැකෙනවා
**එපා** කෙනෙකුට දුකක් දෙන්නට එයින් හදවත රිදෙනවා
**එපා** ආසා පොදි බදින්ට මැරෙනවා අපි මැරෙනවා

මොකටද ගුණ කථා කමකට වැඩක් නැති
හොඳටම වැඩිවුනොත් සුදු කොඩි දෙකක් ඇති
ජීවත් වෙලා කිසිකෙනෙකුට බරක් නැති
මිනිහෙක් මලා කීවොත් හොඳටෝම ඇති

සැකසුම:
විශ්‍රාමලත් පරිපාලන ග්‍රාම නිලධාරී
(ඩී.බී. සෙනවිරත්න)

## ඇසළ පොහොය දා...

බරණැස මිගදායේ ඇසළ පොහෝදා
දම්සක් සතුරින් ලොවට දහම් දෙසූදා
පස්වග මහණුන් නැණයෙන් මොක්පුර ගියදා
දහම් එළිය ඒකාලෝකය ඇතිකල දා

සව්සත සසරින් එතෙර කරන්නට
දම් දෙසුවේ ලොව ඇති තතු පහදාලන්නට
සදහම් ගුණයෙන් ලෝ සත සනසාලන්නට
තෙරුවන් ගුණ නිති සිහිකර සිරසා නමදින්නට

දහම් සිසලසක් ගෙන දෙයි වෙහෙරෙන්
කරුණා ගුණයෙන් සත්වග පෑ කුළුණින්
ලෝසත සනසන බුදුගුණ ගඟුලැල්ලෙන්
සැමදා වදිනෙමි මේ ලෙස බැතියෙන්

අජන්තා ශිරෝමණී දිසානායක

## පරාර්ථකාමීත්වය

නැවත වරක් මම මේ ලෝකයට
පිවිසෙන්නම්.......
එහෙත් කුමන කාරණයකටද?
දැන් මා මෙය අවසාන
කළ යුතුය.......
තවත් ලිපි ලිවීමට පෙළඹෙතත්
මෙය එ අවසාන
ලිපියයි
මුළු රටම විශාල සිරකඳවුරකි
මා පමණක් නිදහස් වන්නේ
කුමටද?

අමාලි රුවන්තිකා
ඇහැලියගොඩ




## ගත සිත හා වත

ගත සුදු වතින් සරසන එක හරි ලේසියි
එලෙස සිත සුදු වතින් සරසන්නට බැරි වේවියි
ගත සිත වෙත වෙනම තේරුම් ගන්න හැකියි
සිත සුදු වතින් සරසන අය නිවන් දකියි

පිටින් සෙලවී තිබුණට ඔබේ ගත
යටින් සසල වී දැවෙනවා නේද සිත
පිටින් වගේ යටින් සන්සුන් කලොත් සිත
නිවන් සුවෙන් සැතපී නිවෙනවා සිත

අත කන කර නොවෙයි ඔබෙ ඔය දිලිසෙන්නේ
පැළඳූ ආභරණයි ආලෝකෙට දිලිසෙන්නේ
ගතෙ වතෙ සුවඳ නොවෙ ඔබෙ ඔබ එන්නේ
එක එක ක්‍රීම් වල සුවඳයි එය එන්නේ

සෙනෙවිරත්න

## අනුස්මරණය

සරසවි පිවිසුමට විදු නැණ ලබා ගෙන
ආවෙමු සිතුවමක් සේ බොඳ නොවී ගෙන
සරවසි සුහද හමුවෙන් හද බැඳී ගෙන
වසරෙන් වසර එමු අප ඔබ සොයා ගෙන

දෙදහස් එකොළහ ද ඉක්මී ගෙන යනවා
සරසවි සුහද හමුවද යළි මුළු දෙනවා
යුගයක සිසුන් සුපුරුදු ලෙස හමු වෙනවා
ඉතිහාසයට නව පිරිසක් එක් වෙනවා


සිදු අරගලවලදි ඔහු සෙන් පතියෙක්ය
පසු බට නොවන එඩිතර නායකයෙක්ය
සමුගෙන ගොසින් හරියට දැන් වසරක්ය
සුමිතුරු 'අනඳ මිතු' නොමියෙන මිනිසෙක්ය

නිරතුරු සිනාවෙන් සැරසුණු කුළුණු වත
සරසවි සුහද සැම සිහිපත් කරනු ඇත
සොයුරිය 'නිමාලි' ඔබ සමුගත් පුවත
ඇසුවද අප පැතුම ඔබ දැකුමයි නැවත

සිසිලස රැඳුණ පවනක් මෙන් එකට හැපී
සිටි අප බේද වී කිසිවිට නොමැත කිපී
එක යායෙක රැඳුන කුසුමන් විලස පිපී
හසරැලි සේම කඳුළු ද පිළිගනිමු අපි

විජායි ලක්ෂ්මී දම්මුල්ල

රංගිරි ශ්‍රී ලංකා
RSL NEWSPAPER



# චතුරාර්යසත්‍යය ලොවට අවබෝධ කළ
# ඇසළ මස පුර
# පසොළොස්වක් පොහෝ දිනය

ඇසළ පොහොය අප කාටත් වැදගත් වන්නේ බුද්ධ චරිතය සම්බන්ධව සිදු වූ සුවිශේෂී සිද්ධීන් හේතු කොට ගෙනය. ප්‍රධාන වශයෙන් වැදගත් වන්නේ පළමු ධර්ම දේශනයයි. මිහිමත කෙනෙකුට කරන්නට බැරි තරම් කැප කිරීමක් කරමින් බුද්ධත්වය ලබා ගත් බුදුරජාණන් වහන්සේ එය දේශනා කිරීමේ සුවිශේෂී අවස්ථාව ඇසළ පොහොය හා සම්බන්ධව පැවතීම ඉතා වැදගත් වේ.

උන් වහන්සේ සය අවුරුද්දක් දුෂ්කරක්‍රියා කරමින් එහි ප්‍රතිඵලයත් විද එයින් තමන් සොයන නිවන් මඟ ලබා ගැනීමට නොහැකි බව තේරුම් ගෙන ශරීරයට සැප දී එහි ප්‍රතිඵලය ද විද එයිනුත් තමන්සොයන නිවන් මඟ නොලැබෙන බව දැන මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කළහ. අත්තකිලමතානුයෝගය හා කාමසුඛල්ලියකානුයෝගය යන අන්තද්වය අතැර මධ්‍යම ප්‍රතිපදාව නොහොත් ආර්ය අෂ්ඨාංගික මාර්ගය ඔස්සේ ගමන් කළ උන් වහන්සේට නොබෝ කලකින් ම නිර්වාණය ක්ෂාත් කෂාත් කර ගැනීමේ භාග්‍ය උදා විය.

එදා ඇසතු රුක මුලදී සියලු කෙලෙසුන් නැතිකොට මිනිසෙක් වශයෙන් ඉපදී ලැබිය හැකි උසස්ම පදවිය වන බුද්ධත්වය ලැබීමේ ඒ උතුම් සිදුවීම හා සමානම සිදුවීමක් ලෙස පළමු ධර්මදේශනය හැඳින්විය හැකිය.

බුදුරජාණන් වහන්සේ අවබෝධකරගත් ගැඹුරු ශ්‍රී සද්ධර්මය ලෝක සත්වයාට දේශනා කිරීමට තරම් සුදුසු ද එය දේශනා කිරීමෙන් කෙළෙස් බර සත්වයාට අවබෝධ කර ගැනිමට හැකි වේද යන ප්‍රශ්නය බුදු රජාණන් වහන්සේගේ කුතුහලයට හේතු විය. එම අවස්ථාවේදී බුදු රජාණන් වහන්සේ සිතෙහි උදාසීන බවක් ඇතිවී සිතූ සහම්පති මහා බ්‍රාහ්මයා දස දහසක් සක්වල දෙවිබඹුන් සහිතව බුදු රජාණන් වහන්සේ වෙත පැමිණ වැද නමස්කාර කොට මෙසේ ප්‍රකාශ කළේය.

**"උට්ඨෙහි වීර විජිත සංගාම**
**සත්ථවාහ අණන වීචර ලොකේ**
**දෙසස්සු භගවා ධම්මං**
**අඤ්ඤාතරො භවිස්සන්ති"**

යනුවෙන් වීරයන් වහන්ස, මාර යුද්ධයෙන් ජය ගත් උත්තමයන් වහන්ස, ලෝක සත්වයා සසර කතරින් එතෙර කරනු මැනව, ලොව හැසිරෙනු මැනව, ණය නැති උත්තමය, නැගී සිටිනු මැනව, භාග්‍යවතුන් වහන්ස, දහම් දෙසනු මැනව, ඔබ වහන්සේ අවබෝධ කරගත් ගැඹුරු වූ ධර්මය අවබෝධ කර ගැනීමට සුදුසු සත්වයෝ ඇත්තාහ. දහම් දෙසනු මැනවැයි ආරාධනා කළහ.

කෙළෙස් වලින් බර වූ පුද්ගලයන් විසින් සිතූ මිත්‍යා දෘෂ්ඨීන් ද මීට පෙර මගධයෙහි පහළ විය. එහෙයින් ඔබ වහන්සේ නිවනට දොර හරිනු මැනව, භාග්‍යවතුන් වහන්සේ විසින් අවබෝධකරගත් ශ්‍රී සද්ධර්මයම සත්පුරුෂයෝ අසත්වා. පර්වතයක් මුදුනෙහි උන් පුරුෂයෙක් පර්වතය පාමුල සිටිනා

ඔබ වහන්සේ අවබෝධ කරගත් ගැඹුරු වූ ධර්මය අවබෝධ කර ගැනීමට සුදුසු සත්වයෝ ඇත්තාහ. දහම් දෙසනු මැනවැයි ආරාධනා කළහ.

කෙළෙස් වලින් බර වූ පුද්ගලයන් විසින් සිතූ මිත්‍යා දෘෂ්ඨීන් ද මීට පෙර මගධයෙහි පහළ විය. එහෙයින් ඔබ වහන්සේ නිවනට දොර හරිනු මැනව, භාග්‍යවතුන් වහන්සේ විසින් අවබෝධකරගත් ශ්‍රී සද්ධර්මයම සත්පුරුෂයෝ අසත්වා. පර්වතයක් මුදුනෙහි උන් පුරුෂයෙක් පර්වතය පාමුල සිටිනා මිනිසුන් පහසුවෙන් දක්නේය. එසේම සියල්ල දක්නා නුවණ ඇති මහා ප්‍රඥායන් වහන්ස, ධර්මය නැමැති පර්වතයට නැගී ඔබ වහන්සේ ශෝක රහිතයෙක්ව ශෝකයෙහි වැටුනා වූ ජාති, ජරා, දුකින් වඩනා වූ සත්වයන් දෙස නුවණින් බලනු මැනවි. ධර්මය දේශනා කරනු මැනවියි යනුවෙන් සහම්පති මහා බ්‍රහ්මයා ආරාධනා කර සිටියහ.

ඊට පසු බුදු රජාණන් වහන්සේ සහම්පති මහා බ්‍රහ්මයාගේ ආරාධනය මහා කරුණාවෙන් ඉවසා වදාළහ. ඒ අනුව බුදු රජාණන් වහන්සේ කෘතගුණ සැළකීමක් වශයෙන් සිතා පළමුව ධර්මය දෙසිය යුත්තේ කවුරුන්හටදැයි සිතූහ. පළමුව තමන්ට උපකාර කළ නැත්නම් ගුරු වූ භාර්ගව, ආලාරකාලාම සහ උද්දකරාමපුත්ත යන ප්‍රථම ධ්‍යානලාභීණ්ට ප්‍රථම ධර්ම දේශනාව කිරීමට සිතා බැලුවත් මේ වන විට ඒ අය ජිවත් නොවුන නිසා කලක් තමන් ඇසුරු කළ තමන්ට උපකාර කළ ඥාන සම්පත්තියෙන් මුහුකුරා ගිය කොණ්ඩඤ්ඤ, භද්දිය, වප්ප, මහානාම, අස්සජි යන පස්වග තවුසන්ට ප්‍රථම ධර්ම දේශනය කිරීමට තීරණය කර ගත්හ. තමන් වහන්සේ සය අවුරුද්දක් දුෂ්කරක් ක්‍රියා කරන සමයේ පස්වඟ තවුසන් තමන්ට උපස්ථාන කළ බවත් මේ වන විට ඔවුන් බරණැස මිගදායේ සිටින බවත් දැන ඔවුන්ට පළමු ධර්ම දේශනය කිරීම සුදුසු බවත් සිතා ඒ සඳහා පිටත් වූහ. ඒ බව ම.නි. අරියපරියේසන සූත්‍රයේ විග්‍රහ කර ඇති අයුරු වැඩි දුරත් පැහැදිලි වේ.
බුදු රජාණන් වහන්සේට විශාල දුරක් ඔවුන් සොයා යෑමට සිදුවිය. යොදුන් දහ අටක් දුර යෑමට තිබූ බැවින් බුදුරජාණන් වහන්සේ පයට පාවඩත් නැතිව ගමන් ආරම්භ කළහ. එසේ ගමන් ආරම්භ කළ බුදු රජාණන් වහන්සේට ශ්‍රී මහා බෝධීන් වහන්සේටත් ගයාවටත් අතර මඟදී උපක ආජීවක හමු විය.

ආජිවක යනුවෙන් හැඳින්වෙන්නේ බුද්ධ කාලයේම විසූ පරිබ්‍රාජක පිරිසකි. මේ ශාස්තෘන් අතර මක්ඛලීගෝසාලගේ අනුගාමික පිරිස ආජීවක නමින් හඳුන්වන ලදි. මෙම උපක ආජිවක තෙමේ බුදු රජානන් වහන්සේගේ ප්‍රසන්න ඉන්ද්‍රිය සංවරය දැක බුදුරජාණන් වහන්සේගෙන් මෙසේ ඇසූහ. 'ඇවැත්නි ඔබගේ ඉන්ද්‍රියයෝ ප්‍රසන්නය, ශරීර වර්ණය පිරිසිදුය. ඔබ කවුරුන් උදෙසා පැවිදි වූයේද? ඔබගේ ශාස්තෘවරයාණන් කවරෙක්ද? ඔබ ප්‍රියකරන දහම කුමක්ද? ආදී වශයෙනි. පසුව බුදුරාජණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ.

**"සබ්බාභිභූ**
**සබ්බ විදූහමස්මි**
**සබ්බේසු**
**ධම්මේසු අනුපලිත්තො**
**සබ්බඤ්ජ**
**හා තණ්හක්ඛයෙ විමුත්තො**
**සයං**
**අභිඤ්ඤාය කමුද්දි**
**සෙයයං"**

කාමභව, රූපභව, අරූපභවයන්ට අයත් සියලු ධර්මතා මම මැඩ පැවැත්වූයෙමි. කාම, රූප, අරූප, ලෝකෝත්තර යන සිවු භූමීන්ට අයත් සියල්ල දැන ගත්තෙමි. භවත්‍රයෙහි පිහිටි කිසිවක් කෙරෙහි නොඇලුණෙමි. සියල්ල ඉක්මවා සිටියෙමි. නිවන අරමුණු කොට කෙලෙසුන්ගෙන් මිදුණෙමි. මට ගුරුවරයෙක් නැත. අනුන් වෙතින් අසා දැනගත් ධර්මයක් අවබෝධ නොකළෙමි.

**නමෙ ආචරියො අත්ථි**
**සදිසො මෙ න**
**විජ්ජති සදෙවකස්මිං**
**ලොකස්මිං**
**නත්ථිමෙ පටිපුග්ගලො"**

ලෝකෝත්තර ධර්මය අවබෝධ කර ගැනිමෙහිලා මට උදව් කළ ගුරුවරයෙක් නැත. එමෙන්ම මට සමාන වූවෙක් ද නැත. දෙව් මිනිසුන් අතර, මා හා සමාන කෙනෙක් නැත. **"අහංහි අරහා ලොකෙ අහං සත්ථා අනුත්තරො ඒකොම්හි සම්මා සම්බුද්ධො සීතිභූතොස් මි නිබ්බුතො"**

මම සියලු ලෝකයෙහි අරහත් වෙමි. නිරුත්තර වූ අනුශාසක වෙමි. කිසිවෙකුගේ උපදෙසක් නැතිව දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග යන චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කළෙමි. සියලු කෙලෙසුන්ගෙන් මිදුණ නිසා ගත සිත සිසිල් වූයේ වෙමි.

**"ධම්ම චක්කං පවත්තෙතුං**
**ගච්ඡාමි කසිණං පුරං**
**අන්ධභූතස්මිං ලෝකස්මිං**
**අහඤ්ඡං අමත දුංදුභිං"**

මම ධර්ම චක්‍රය පවත් වන්නට කසී රට බරණැස් නුවරට යමි. ආසාවෙන් අන්ධ වූ ලෝකයෙහි දහම් අමා බෙරය ගසන්නෙමි.

මෙහිදී බුදු රජාණන් වහන්සේ තමන්ගේ වංශය ගැන හෝ කුල පරම්පරාව ගැන හෝ පියාගේ බලවත්කම ගැන හෝ ප්‍රකාශ නොකළේය. එහිදී බුදු රජාණන් වහන්සේ උපක ආජීවකයාට තමා කවුරුන්ද යන්න පහදා දුන්නේ නිරුත්තර ගුණයම ගැන ප්‍රකාශ කරමිනි. අවසානයේ දී ඒ සියල්ල ශ්‍රවණය කළ උපක ආජීවකයා ඇවැත්නි, ඔබ කී පරිදි අනන්ත ජින වන්නට සුදුසු වන්නේ යයි කීය. යළිත් උපක ආජීවකයාට පිළිතුරු දුන් බුදුන් වහන්සේ,

**"මාදිසො වෙ ජිනා හොන්ති**
**යෙ පත්තා ආසවක්ඛයං**
**ජිතා මෙම පාපකා ධම්මා**
**තස්මා හං උපකාජිනො"**

රහත් බවට පැමිණි මා වැනි යම් කෙනෙක් වෙත් නම් ඔවුහු ඒකාන්තයෙන් ජින නම් වෙති. මම සියලු පාපයන් සිදු කරන ක්ලේශ ධර්මයන් දිනූ බැවින්ම අනන්ත ජින නම් වෙමියි වදාලහ.

තමා භවත්‍රයට අයත් සියලු ධර්මයන් මැඩ පැවැත්වූ බවත්, සියල්ල අවබෝධ කළ බවත්, ජින නාමය තමාට සාකල්‍යයෙන්ම සුදුසු බවත් බුදුරදුන් වදාළහ.

මෙසේ වදාළ කල්හි උපක ආජිවක තෙමේ හිස සලා එසේ විය හැකි යයි ප්‍රකාශ කොට වංගහාර ජන පදය බලා පිටත්ව ගියේය. මෙම හමුවීමෙන් පසු බුදු රජාණන් වහන්සේ යොදුන් දහ අටක් මඟ ගෙවා බරණැස් නුවර ඉසිපතනාරාමයට වැඩම කළ සේක. එනම්, බුද්ධත්වයෙන් දින 60ක් නොහොත් ගත වූ තැනදී මෙම සුවිශේෂ සිදු වීම සිදුවිය. එදින ඇසළ මස පුරපසළොස්වක් පොහෝ දින වීම ද බෞද්ධයින්ට අතිශයින්ම වැදගත්වේ.

පස්වග තවුසන්ට පළමු ධර්මදේශනාව සිදු කිරීමට ගිය ඒ දුෂ්කර ගමන් මඟ ඉතා චමත්කාර ජනකය. මඟ දෙපස සතා සිවුපාවුන් පවා, ගස් කොළන් පවා නිහතමානීව බුදු රජාණන් වහන්සේගේ දහම් පණිවිඩය ඇසීමට මෙන් මඟ බලා සිටියහ. සසර පෙර භවයන්හිලා ඇස්, හිස්, මස්, ලේ පමණක් නොව අඹුදරුවන් පවා දන් දී දස පාරමිතා, දස උප පාරමිතා, දස පරමත්ත පාරමිතා සම්පූර්ණ කරමින් අවබෝධ කරගත් ශ්‍රී සද්ධර්මය තුන් ලෝ වාසීන්ටම අමෘතයක් සේ විඳගන්නට මඟ පාදා දුන්නේ ඇසළ මස පුර පසළොස්වක් පොහෝ දිනයේදිය. එම සදහම් පණිවිඩය අසා කොරුන්, බිහිරන්, ගොළුවන්, අන්ධයින් සුවපත් වූහ. භව කතරේ දුකෙහි නිමග්නව සිටි බොහෝ දෙනෙක් අමෘත මහා නිර්වාණය ලබා ගත්හ.

කොබෙයිගනේ පුබ්බිලිය ශ්‍රී සාරානන්ද පිරිවෙනේ ආචාර්ය,
ගලගෙදර රතන වංශ හිමි.

# පිනෙහි ඇති ආනිසංස



සමාජයේ ජීවත්වන අප මේ මනුෂ්‍ය ලෝකය තුළ කී වතාවක් උපත ලැබුවද යන්න අප දන්නේ නැහැ. තිරිසන් ලෝකයේ කී වතාවක් උපත ලැබුවද, පෙරේතයෝ වශයෙන් සසරේ කොච්චර ඉන්න ඇද්ද?

ඒ වගේම නිරයේ ඉන්න ඇද්ද ඒ කිසිවක් පිළිබඳ අපි දන්නේ නැහැ. මිනිස් ලෝකයේ උපත ලබන අපි සතර අපායට යලි වැටෙන ස්වභාවයෙන් යුක්ත බව අප දැන සිටියේ නැහැ. බුදුරජාණන් වහන්සේ බුද්ධ දේශනාවල බොහොම අපුරුවට මේ දේවල් සඳහන් කරලා තියනවා.

බුදුරජාණන් වහන්සේ පහළ වෙලා ධර්මය දේශනා කිරීමේ එක ඉලක්කයක් වුයේ සත්වයා සතර අපා දුකින් නිදහස් කිරීමයි, දෙවන කාරණාව වුයේ සුගතියේ සැප ලබා දීමයි, තෙවන කාරණය වුයේ සසරේ කෙළවරක් නැතුව යන ගමන කෙටි කරවීමයි, සිව්වන කරුණ වුයේ සසර දුක ඉවත් කරදී නිර්වාණ අවබෝධය ලබා දීමයි.

නිර්වාණ අවබෝධය ලැබීමට නම් බුද්ධිමත් බව තිබිය යුතුයි. නමුත් සමාජයේ ජීවත්වන බොහෝමයක් දෙනාට බුද්ධිමත්ව සිතීමට තරම් ශක්තියක් නැහැ. ඊට හේතුව සෑම පුද්ගලයෙකුගේම සිත් කෙලෙස් වලින් පිරිලා. මිනිසුන්ගේ සිත් ආශාව, මාන්නය, තණ්හාව, පළිගැනීම, වෛර කිරීම වැනි ස්වභාවයන්ගෙන් යුක්තවීම හේතුවෙන් ඔවුන් තුළ බුද්ධිමත්ව කල්පනා කිරීමට තරම් ශක්තියක් නැහැ. එබැවින් බුද්ධ දේශනාවන්වල නියම ප්‍රයෝජනය ගැනීමට ඔවුනට හැකියාවක් නැහැ.

සෑම සත්වයෙක්ම ඉපදීමට, මේරීමට, මරණයට අයිතියි. මරණයෙන් පසු අප උපදින්නේ ප්‍රේත ලෝකයේ ද, තිරිසන් ලෝකයේ ද, මිනිස් ලෝකයේ ද එහෙමත් නැත්නම් දිව්‍ය ලෝකයේ ද යන්න තිරණය වන්නේ අපි කරන පින් මතයි. මනුෂ්‍ය ලෝකයේ උපත ලබන අපි අප විසින්ම අපට අවශ්‍ය දෙවල් නිර්මාණය කරගනු ලබනවා. මෙලෙස ලෝකය නිර්මාණය කර ගැනීම පිටිපස්සේ තියෙන්නේ පිනයි. පින තමයි ඊට අවශ්‍ය පරිසරයට අපව යොමු කරන්නේ.

මනුෂ්‍ය ලෝකයේ ජීවත් වන අපි රේඩියෝව අහනවා, රූපවාහිනිය නරඹනවා, අපට ඕන කරන කෑම බීම වගා කර ගන්නවා, අපට කන්න අවශ්‍ය දේවල් අපි හදාගන්නවා, අපට ඕන කරන ලස්සන ඇඳුම් මහගන්නවා, යාන වහන ගන්නවා, නමුත් අපේ ගෙදර ඉන්න තිරිසන් සත්වයින්ට මේ කිසි දෙකින් එලක් නැහැ.

නිවසේ සුරතලේට හදන බල්ලෙකුට ලයිට් වලින් ප්‍රයෝජනයක් නැහැ, රූපවාහිනියෙන් ප්‍රයෝජනයක් නැහැ, ටෙලිෆෝන් අවශ්‍ය නැහැ, ඇඳුම් අවශ්‍ය නැහැ, බල්ලට ඕන කෑම ඉල්ලලා කන්න බැහැ.

මනුස්සයෙක් හැටියටඅප විඳින සැපයන් එකක්වත් ඒ සතාට විඳින්න බැහැ. ඊට හේතුව ඒ සතාට පිනක් නැතිකමයි. අපි කතාවටත් කියනවා "පින තියෙන්න ඕනි" කියලා. අපි සැප විඳින්නේ පින නිසා. හැබැයි මේ සැප පිටි පස්සේ තියන පින හඳුනාගන්න මනුෂ්‍යයා අසමත් වෙලා තියනවා. මිනිසුන් වන අපට මනුෂ්‍ය ලෝකයේ දී පිනෙන් ලද සැපය පමණක් නොව දුකක් ඇද්ද එම දුකද විඳින්නට සිද්ධ වෙනවා.

මනුෂ්‍යය ලෝකයට අපව ගෙනාවේ පින විසින්. මනුෂ්‍යය ලෝකයේ දී අපට සැප ලබන්න උදව් කරන්නේ මේ පිනයි. පින තියෙන කෙනාගේ ඒ පින පාවිච්චි වෙන විදිහ අපට හොයන්න බැහැ. පින් දහම් රැස්කර ගන්න කෙනාගේ ජීවිතයට ඒ පින විපාක දෙන ආකාරය පිළිබඳ බුදුරජාණන් වහන්සේ බුද්ධ දේශනාව තුළින් පෙන්නලා තියනවා.

කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයේ භික්ෂුන් වහන්සේලා දෙනමක් බොහෝ සේ සිල් ගුණ දහම් සපුරමින් ජිවත් වුනා.මොවුන් මිතුරන් වුවා. එක් භික්ෂුන් වහන්සේ නමක් පින්ඩපාතේ යමින් ගිලන් වු භික්ෂුන් වහන්සේලාට දානය ලබා දුන්නා.ඒ වගේම පින්ඩපාතය ගොස් දානය නොලැබුන භික්ෂුන්ට දානය ලබාදුන්නා.

එසේ ලබාදී තමා දුන් දානයන් සිහිකරමින් සතුටු වෙමින් විදර්ශන වැඩුවා. අනෙක් භික්ෂුව විදර්ශනා නැහැ. මොවුන් දෙදෙනා මරණින් මතු දිව්‍ය ලෝකයේ උපත ලැබුවා. දානමනාදි පින්කම් කළ භික්ෂුව සැප සම්පත් බහුල මහේශාඛ්‍ය දෙවතාවක්ව උපත ලැබුවා. අනෙක් භික්ෂුව අල්පේශාඛ්‍ය දෙවතාවක්ව උපත ලැබුවා.

පසුව මොවුන් දෙදෙනා ගෞතම බුදුරජාණන් වහන්සේගේ කාලයේ කොසොල් රජතුමාගේ මාළිගාවේ උපත ලැබුවා. පින් රැස් කළ භික්ෂුව කොසොල් රජතුමාගේ බිසවකට දාව රාජ කුමාරයෙක් ලෙසත් අනෙක් භික්ෂුව දාසියකට දාව දරුවෙකු ලෙසත් උපත ලැබුවා. එසේ නම් පිනෙහි ස්වභාවය අනුව සැපයේ ස්වභාවයද වෙනස් වෙනවා. පෙර පින් කෙතරම් බලවත්ද? දෙව් ලොව වේවා මනු ලොව වේවා යම් පුද්ගලයෙක් සැපක් විඳිනවා නම් එම සැපයට පසුබිම පිනයි.

ඒ වගේම රජ්ජුමාලා නම් දාසියද බුදුරජාණන් වහන්සේගේ ධර්මය සරණ යමින් බොහෝ සේ පින්දහම් කර මරණින් මතු තව්තිසා දෙව්ලොව බොහෝ සැප සම්පත් ඇති දේවතාවක්ව උපත ලැබුවා.

දිනක් මුගලන් මහරහතන් වහන්සේ තව්තිසා දෙව්ලොව චාරිකාවේ වැඩියා. බොහෝ සැප සම්පත් විඳින මේ දෙව්දුව දැක ඇ අසලට වැඩි උන්වහන්සේ "පින්වත් දෙව්දුව, මේ සොදුරු රූපය ඔබට ලැබුනේ මොන වගේ කර්ම විපාකයක් ලෙසද? ලැබුනේ කොහොමද..? මොන වගේ කර්ම විපාකයක් ලෙසද..?" යනුවෙන් ඇසුවා.

එවිට දෙව්දුව "පින්වත් ස්වාමින් වහන්ස මම සරණ ගිය ඒ අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ නිසයි මේ හැමදෙයක්ම. මම ඉන්නේ සතුටින්, කෙළි සෙල්ලම් කරනවා, ප්‍රිති වෙනවා, සතර අපා බයක් නැහැ, දිව්‍ය මල් මාලා දරනවා, මේ දිව්‍ය විමානය පින් නොකළ අයට ලැබෙන්නේ නැහැ, පින් කළ උදවියටමයි සිතක් ඒ තව්තිසාවේ නන්දන වනය ලැබෙන්නේ.

පින් නොකළ උදවියට මෙලොව හෝ පරලොව සැපයක් ලැබෙන්නේ නැහැ. මෙලොව පරලොව දෙකෙම සැප ලැබෙන්නේ පින් කළ උදවියටමයි." එසේ නම් මේ පින කෙතරම් බලවත් යන්න පැහැදිළි වෙනවා. මෙහෙම කියන කොට ගොඩක් අයට හිතෙයි දානමනාදි පින්කම් කරන්න කෝ අපට මුදල් කියලා.

බුදුරජාණන් වහන්සේ ධර්මය තිබෙන්නේ ධනවතුන් පිණිසවත්, දිළින්දන් පිණිසවත් නොවේ. උන්වහන්සේගේ ධර්මය තිබෙන්නේ නුවණ මෙහෙයවන්නනුන් උදෙසාය. එනම් ප්‍රඥාවන්තයින්ටය.

**ඒ.පී.හර්ෂණි ප්‍රභා කුමාරි**
කැලණිය විශ්වවිද්‍යාලය
ජනසන්නිවේදන අධ්‍යයන අංශය



# "මරණය"

**මරණය** යන වචනය විශ්වයේ සමස්ථ ජීවින්ටම සාධාරණීය වූ පරම සත්‍යයකි. මරණය ගැන සිතන විට පවා බොහෝ දෙනා අතිමහත් කම්පාවට හා භීතියට පත්වෙති. උදාවූ තැන් පටන් මොහොතකුදු නොනැවතී අස්තය කරා යන හිරු/සඳු මෙන් සත්වයෝද උපන් තැන් පටන් මොහොතකුදු නැවතීමක් නොමැතිව මරණය කරා ගමන් කරති. නොමැරෙන ජීවිතයක් ඇති සත්වයෙකු විශ්වයේම නොමැත. කවර අවස්ථාවකදී වුවද ජීවිතය නැතිවී යනු ඇත. ලෝක වාර්තා අනුව දිනකට ලෝක ජනගහනයෙන් ලක්‍ෂ දෙකක් පමණ මරණයට පත්වේ.

දුබලවූ නැසෙන ස්වාභාවය ඇති ජීවිතය, පිට්ටනියක් මැද ආවරණයක් නැතිව දල්වෙන පහනක් බඳුය. හිමිදිරියේ තණ අග එල්ලෙන පිනි බිඳක් වැනිය. දිය මතුපිට ඇන්දාවූ ඉරක් බඳුය. මැටි බඳුනක් වැනිය. එම ධර්මතාවයන්ට අනුව ජීවිතයද ඒකාන්තයෙන්ම මරණයෙන් කෙළවර වන්නේය. මරණයේ යථාර්ථය බියකරු බව, රුදුරු බව, බුදුරජාණන් වහන්සේ ප්‍රශස්ථ ආකාරයෙන් පහත දැක්වෙන පරිදි ලෝකයාට ද දේශනා කොට ඇත.

**"කතමඤ්චාවුසො මරණං? යා තෙසං තෙසං සන්තානං තම්හා තම්හා සත්ත නිකායා චුති චදන තා භෙදෝ කලෙබරස්ස නික්ඛෙපො ඉදං වුච්චතාවුසෝ මරණං"**

ඒ සත්වයන්ගේ ඒ ඒ සත්ව කොට්ඨාශයන්ගේ යම් චුතවීමක් ඇද්ද ජීවිතයෙන් වෙන්වීමක් ඇද්ද රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන පහ බිඳීයාමක් ඇද්ද අතුරුදහන්වීමක් ඇද්ද, ශරීරය හැර දැමීමක් ඇද්ද, මෙය මරණය ලෙස හඳුන්වනු ලැබේ. ජීවිතය අනියතයි, මරණය නියතයි යනු බුදුදහමේ එන සුප්‍රකට දේශනාවකි. උපන් සත්වයා මරණයට පත්වීම ස්වභාවික ධර්මතාවයක් වන අතර ඒ ගැන සිතීමට පවා පුහුදුන් මිනිසා බියක් දක්වති.

මරණයේ යථා ස්වරූපය දකින්නට ඇති නොකැමැත්ත නිසා අපි සත්‍ය ඉදිරියේ බියට පත්වෙමු. උපන් සත්වයා ඊතලයක් මෙන් වහ වහා මරණය කරා දිව යයි.

මේ ස්වභාවය වටහාගත් පසු නොබියව මරණයට මුහුණදිය හැක. මරණයෙන් බේරීමට නොයෙකුත් උපක්‍රම යෙදුවත් ඉන් මිදීමක් නැත. මැරෙන මොහොතේදී තමා විසින් ජීවිත කාලය තුලදී රැස්කළ ධනය මතකයට නැගේ. එසේම තමා වටා සිටින දූ දරුවන්, නෑදෑයන්, හිතමිත්‍රාදීන් සිහියට නැගෙන අතර ඒ ගැන කම්පාවට පත්වේ. එමෙන්ම තමන් බොහෝ කාලයක් ඉතාමත් උනන්දුවකින් ආදරයෙන් ආරක්‍ෂා කළාවූ තම කුණුවී විනාශවී යන තම ශරීරය අතහැර දමා යාමට දුක්වේද මරණ දුක බියජනක වන අතර නොයෙක් සිතුවිලි මධ්‍යයේ බොහෝ අය මරණයට පත්වේ. ධම්මපදයේ ජරා වග්ගයේ 3වැනි ගාථාවෙන් මරණයේ ස්වභාවය මෙසේ දැක්වේ.

**"පරිජිණ්ණ මිදං රූපං රොගනිඩ්ඩං පභංගුරං සජ්ජති පූතිසන්දෙහො මරණනතං හි ජීවිතං"**

අතිශයින් දිරා ගියා වූ සිරුර ලෙඩවලට කැදැල්ලකි. වහා බිඳෙන සුළුය. ජීවිතය මරණය කෙළවර කොට ඇති බැවින් කුණු වැගිරෙන මේ කය වහා බිඳේ. රෝගාතුරවීම හා මරණයට පත්වීම ලෝක ස්වභාවයකි. අප තිලෝගුරු සම්බුදුරජාණන් වහන්සේ ප්‍රථම ධර්ම දේශනයේදී (දම්සක් පැවතුම් සූත්‍රය) මෙය මනාව පැහැදිලි කොට ඇත. (ජාතිපි දුක්ඛා, ව්‍යාදිපි දුක්ඛාථ මරණම්පි දුක්ඛා) එනම් ඉපදීම, ලෙඩවීම, මරණයට පත්වීම දුකක් බව දක්වා ඇත. ජීවිතයේ යථාර්ථය අවබෝධ කර ගැනීමට තරම් ප්‍රඥාවක් නොමැති අය මානසික පීඩනයකට පත්වන බව නවීන මානසික විශේෂඥයෝ පවසති. යමෙක් අස්වාභාවික පීඩනයට ලක්වූ විට නොයෙක් ආකාරයේ ශාරීරික ලෙඩ රෝග වලට ගොදුරුවන බව පැහැදිලි වන කරුණකි. සංයුක්ත නිකායේ පංචම භාගයේ දෙවැනි කොටසේ එන ගිලාන සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ ප්‍රඥාවන්ත රෝගියෙකුට ධර්මය කියාදෙන ආකාරය ගැන දීර්ඝ විස්තරයක් සඳහන් වේ.

**"පරිජිණ්ණ මිදං රූපං - රොගනිඩ්ඩං පභංගුරං**
**සජ්ජති පූතිසන්දෙහො - මරණනතං හි ජීවිතං"**

**අතිශයින් දිරා ගියා වූ සිරුර ලෙඩවලට කැදැල්ලකි. වහා බිඳෙන සුළුය. ජීවිතය මරණය කෙළවර කොට ඇති බැවින් කුණු වැගිරෙන මේ කය වහා බිඳේ. රෝගාතුරවීම හා මරණයට පත්වීම ලෝක ස්වභාවයකි.**

එම දේශනාවට අනුව අපි අපේ නෑදෑයින් දූ දරුවන් හිතවත්තු යන යම්කිසි කෙනෙක් රෝගාතුර වූ විට ඒ පුද්ගලයාට බෙත් හේත් සාත්තු සප්පායම් වගේ ධර්මය ගැනත් පැහැදිලි කර දිය යුතුය. එසේ කිරීමට උත්සාහ නොකළහොත් වන්නේ එම පුද්ගලයාගේ මරණ බිය පහ නොවීමයි.

රෝගාතුර වූ පුද්ගලයකු මරණාසන්න අවස්ථාවට ලඟා වූ විට ඔහුට හිතවත් පිරිස් ඉඩකඩම්, ගෙවල් දොරවල්, මිල මුදල්, ආදිය ගැන සිහිවන විට ඒ පුද්ගලයා ඒ දේවල් වලට බැඳුණු ගමන් මරණින් පසු තමාගේ එම දේවල් වලට නැවතත් පැමිණීම ස්වභාවයකි. ත්‍රිපිටකයේ ඛුද්දක නිකයට අයත් පේතවත්ථු නැමැති කොටස ගැන හදාරණ විට ඒ බව මැනවින් පැහැදිලි වන්නේය.

කෙතරම් සංකීර්ණ තාක්‍ෂණික හෝ වෛද්‍ය පහසුකම් තිබුණත් ජීවිතයේ උත්පත්තිය ඇතිතාක්කල් මරණයට ගොදුරුවන හෙයින් එය නැවැත්වීමට උත්සාහ කිරීම ජීවිතයේ පරමාර්ථ ධර්මය වශයෙන් සැලකිය හැක.

කය යනු නිරන්තරයෙන් වෙනස්වන සුළු ස්වභාවයෙන් පැවත එන රසායනික හා භෞතික ද්‍රව්‍ය ගොඩකි. ඉපදීම. මරණයට හේතුඵල දහමක් නිසා මෙම භවගමන නැතිකිරීමට කටයුතු කළ යුත්තේ කෙසේ දැයි බුදුදහම කියාදෙයි.

තම චිත්ත සන්තානයේ හටගන්නා වූ තෘෂ්ණාව සම්පූර්ණයෙන්ම පහකළ බැවින් බුද්ධාදී රහත් උතුමන් වහන්සේලා ස්වකීය නෑ හිතමිතුරන්ගේ වියෝවීමේදී කම්පාවට පත් නොවෙති. බුදුරජාණන් වහන්සේ කුසිනාරාපුර නුවර මල්ල රජදරුවන්ගේ උපවත්තන නම් සල් උයනේදි පිරිනිවන් පා වදාල අවස්ථාවේදී ආනන්ද හිමියන් තම දුක් දරා ගත නොහැකිව හඬා වැළපුන නමුත් අනුරුද්ධ මහ රහතන් වහන්සේ නොසැලී සිටියහ. එම අවස්ථාවේදී අනුරුද්ධ මහ රහතන් වහන්සේ ආනන්ද හිමි ඇතුළු අනෙකුත් ශ්‍රාවක භික්ෂූන් වහන්සේලාට මෙසේ ප්‍රකාශ කළහ.

ආනන්දයෙනි, අප බුදුරජාණන් වහන්සේ නිරන්තරයෙන්ම වදාරන ලද්දේ යම් ඉපදීමක් වේද, පැවැත්මක් වේද, යම් හටගැනීමක් වේද, ඒ පටිච්ච සමුප්පන්න සියල්ල නැසී යන සුළුය.

මෙකී හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් දේ නැසෙන සුලුය. යමක් හටගනීද එය නැසී යයි. මේ හටගැනීම නැතිවිට නැසීමක්ද නැත. මෙය අති උතුම් නිවන් සුවයකි. යනුවෙන් දැක්වීමෙන් පැහැදිලි වන්නේ හේතුඵල සම්බන්ධතාවයක් අනුව සියල්ල සිදුවන බවයි. (යං කිංචි සමුදය ධම්මං සබ්බංතං නිරෝධ ධම්මං) හටගැනීමේ ස්වභාවය අති හැමදෙක්ම නිරෝධ වීමේ ස්වභාවය ඇතිව පවතී. මේ පිළිබඳව යථාවබෝධයක් අප තුළ ඇත්නම් මරණය ගැන බියවීමක් ඇති නොවනු ඇත.

තෘෂ්ණාවෙහි ඇලී ගැලී සිටින මිනිසා නිතරම යම් යම් දේවලට ප්‍රියකරන අතර ඒවා ලඟාකර ගැනීමට මහත් ආශාවක් දක්වයි. මේ තණ්හාව, ආශාව, දුක හටගැනිමට මුල්වන අතර එය නැතිකර ගැනීමට ආශාව නැතිකළ යුතුය.

"ඌනො ලොකො අතිත්තො තණ්හා දාසො"

ලෝකයා නිරතුරුවම අඩුපාඩුකම් ඇතිව අතෘප්තියෙන් පෙළෙමින් තෘෂ්ණාවට දාසව වෙසෙතියි මජ්ඣිම නිකායේ එන රට්ඨපාල සූත්‍රයේ සඳහන් වේ.

මිනිස් ජීවිතය මූලික වශයෙන් අතෘප්තිකරය. සැපත සෙවීමේදී පුද්ගලයා අරමුණකින් නිෂ්ටාවත්ම තවත් අරමුණක් කරා පනිමින් ඉතා දැඩි වුමමනාවකින් සැපපසුපස දුවයි. එහෙත් අවශ්‍ය කිසි තෘප්තියක් නොමැතිව මිය යයි.

අප නොයෙක් බඩු බාහිරාදියට පමණක් නොව පුද්ගලයින්ටද ස්ථානවලටද ආශා කරමු. එහෙත් මරණයේදි මේ සියල්ල අත්හැර දැමීමට සිදුවේ. ඒනිසාම දුක හට ගනී.

මේ පිළිබඳව එක් අවස්ථාවකදී බුදුරජාණන් වහන්සේ දරුවන්ට හා තම දේපල වලට කොතරම්

14 පිටුවට....

13 පිටුවෙන්...

# හා එහි යථාර්ථයට මුහුණදීම

ආශාවෙන් සිටියත් මාරයාගෙන් මිදීමක් නැත. මාරයා ඔහු කැඳවාගෙන යැයි එය රාත්‍රියෙහි නිදාසිටි ගම විශාල ගංවතුරකින් යටවන්නාක් මෙනි. යනුවෙන් පෙන්වා දී ඇති සේක.

දුක් ගිනිවලින් වෙලාගත් දරුවා මළබව නොදන මළදරුවා කරපින්නාගෙන අඬමින් වැළෙපෙමින් බොහත් සොයා ගෙයක් ගෙයක් පාසා ගිය කිසාගෝතමියටත් තම ස්වාමියා දරුවන් හා මව්පියන් මරණයට පත්වීමෙන් සිහි විකල්වූ පටාචාරාවටත් බුදුරජාණන් වහන්සේ දුක අවබෝධ කරදී සුමඟට යොමු කළ සේක.

මෙම බියජනක මරණය අභියස නොසැලෙන මානසිකත්වයක් ගොඩනඟා ගතහැකි නම් එය මිනිසා විසින් ලබාගන්නා විශාලතම ජයග්‍රහණයකි. ඉපිද මැරි යළිත් ඉපිද මැරි යන කෙළවරක් නිමාවක් දැකිය නොහැකි මේ සසර කතර තුළ කෙදිනකවත් නොමැරෙන තත්වයක් ඇතිකර ගැනීම බුදුරජාණන් වහන්සේගේ දේශනාවල පරමාර්ථ සත්‍යය ලෙස දක්වා තිබේ.

මිනිසා දුක් විඳින්නේ බාහිර දේ නිසා නොව තමාගේ චිත්ත සන්තානය තුළ ඇතිවෙන මානසික හැඟීම් සහ වැරදි සහගත නිගමන නිසාය. මරණයේ යථාර්ථය අවබෝධ කරගත හැකිනම් එවිට මරණයට නොබියව මුහුණදීමට හැකිවනු ඇත. බුදුරජාණන් වහන්සේ අංගුත්තර නිකායේ මෙසේ දේශනා කර ඇත. කිසියම් තැනක බිය උපදවයිද එය උපදවන්නේ මෝඩයන් තුළය. නුවණැත්තන් තුළ නොවේ. භය යනු චිත්ත පරම්පරාවකි.

විද්‍යානුකූල විග්‍රහයකදී මරණය යනු කයේ විනාශවීමක් පමණි. මිනිසා ජීවිතය පුරාම තෘෂ්ණාවේ ඇලී ගැලී ගතකිරීම නිසා මරණයට පත්වේ. ජීවත්වීමේ ආශාව අධිකවූ විට සාංකාවත් ඇතිවේ. යමෙක් තම මරණය සිහිපත් කරන්නේද ඉන් මිදීමක් නැතිබව තේරුම් ගන්නේ ද එම පුද්ගලයා තම මරණයට ප්‍රථම සිය යුතුකම් හා සේවාවන් ඉටුකිරීමට උනන්දු වේ.

බුදුදහමේ දැක්වෙන පරමාර්ථ සත්‍යයට අනුව සත්වයා සැදී ඇත්තේ රූප හා නාම යන ස්කන්ධවලින් බව සඳහන් වේ.

රූප කොටස (ශරීරය) පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහා භූතයින්ගෙන්ද නාම කොටස (සන්තතිය) වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන කොටස් වලින්ද සමන්විත වී ඇත. රූපස්කන්ධය ද්‍රව්‍යමය වන අතර නාම කොටස යනු සිතේ ස්වභාවය වේ. මෙම කය හා සිත එකතු වී සත්ව, පුද්ගල, ආත්ම යන සංකල්පය ගොඩනැඟී ඇත.

අපේ පංච ඉන්ද්‍රියන්ට මෙම ස්කන්ධ වෙන වෙනම හඳුනාගත නොහැකි වන්නේ මේ සියල්ලම එකම පුද්ගල සංඥාවෙන්, තෘෂ්ණාව, ආශාව ආදී වශයෙන් කල්පනා කරන බැවිනි. මෙම ස්කන්ධ පහ වෙන් වෙන්ව දැකීමට නම් සිතේ ක්‍රියාකාරිත්වය දෙස සූක්ෂම සති සමාධියෙන් බලන විට මමය, මාගේය, යන සංකල්පනා සිතින් බැහැරවී විෂය අරමුණු පැහැදිලිව වැටහී යනු ඇත.

මෙම පංචස්කන්ධය වෙන් වෙන් වශයෙන් හටගන්නා ආකාරය හා විනාශවන ආකාරය සතිපට්ඨාන සූත්‍රයේ දක්වා ඇත. මෙම ස්කන්ධ ඉක්මණින් හටගනිමින් බිඳෙමින් වෙනස්වන වේගය ගණන් කිරීමට පවා නොහැකිවන ආකාරයට ගලා යයි.

ඒකාකාර ස්වභාවයක් ඇතත් නොනැසී පවතින සත්ව පුද්ගල ස්වභාවයක් එහි විද්‍යාමාන නොවේ. එබැවින් එහි පවතින්නේ ඉපදීම, පැවතීම හා නැතිවීම (උත්පාද, ස්ථිති භංග) පමණක් වේ. මෙකී රූපස්කන්ධය හා නාම හින්නතියේ එකතුවීම උත්පත්තිය නමින් හඳුන්වන අතර නැවත රාශිගතවීමේ විනාශය මරණය ලෙස දැක්වේ. මෙම ස්කන්ධයන්ගේ නැවත එක්වීම පුනර්භවය ලෙස හඳුන්වයි. මේ යථාර්ථය තේරුම් ගැනීමට තරම් බුද්ධි මහිමයක් අප සතු නම් මරණයට බිය විය යුතු නැත.

බුදුදහමේ පෙන්වා දෙන ආකාරයට මරණයක් සිදුවීමට හේතුසාධක සතරක් බලපානු ඇත. එනම්,

1. එම වර්ගයාට අයත් ආයුකාලය ගෙවීයාම (ආයුක්ඛයා)

2. එම උත්පතිතිය ගෙනදුන් කර්ම ශක්තිය ගෙවීයාම (කම්මක්ඛයා)

3. මෙම හේතු දෙකම ගෙවීයාම (උභයක්ඛයා)

4. බාහිර උපද්‍රය නිසා - උදාහරණ වශයෙන් අනතුරක් අකල් මරණ අස්වාභාවික අනතුරුවලින් මියයාම යන ඒවාවේ. මෙම කරුණු සතර ඉතා සරල උපමාවකින් දක්වා ඇත. ඒ අනුව පහනක දැල්ල නිවීයාමට හේතු සතරක් මුල්වේ.

ඒ අනුව තිරය නිවීයාම ආයුකාලය ගෙවීයාමට සමාන වේ. තෙල් ඉවරවීම කර්මය ගෙවීයාමට සමාන වේ. තෙල් හා තිරය එකවිට දැවීයාම ඉහත පළමු හා දෙවන හේතුවලට සමාන වේ. සුළං රැල්ලක් හෝ බාහිර කරුණක් නිසා පහන නිවීයාම බාහිර උපද්‍රව වලට සමාන වේ.

මෙයින් පැහැදිලි වන කරුණක් නම් කර්මය පමණක් මරණයට හේතු වන්නක් නොවන බවයි. බාහිර දේවල් ද ඊට බලපානු ඇත.

මෙම නොවැලැක්විය හැකි හේතු ඵල න්‍යායකට අනුකූලව සිදුවන මරණයට මුහුණ දීමට අපි සියලු දෙනා සූදානමින් සිටිය යුතුය.

කවදා නමුත් මරණයට පත්වන බව සිතනවිට එවැනි දෙයක් සිදුවන බවට සූදානමින් සිටින විට එය සාමාන්‍ය දෙයක් බව පිළිගත හැකිවනු ඇත. උත්පත්තිය හා මරණය චක්‍රයක් ලෙස සිදුවීම සංසාරය කියා කියනු ලැබේ.

මෙම චක්‍රය නැවැත්විය හැක්කේ අවිද්‍යාව සහ තෘෂ්ණාව යන දෙකන නැතිකළහොත් පමණි. උත්පත්තිය නැතිකළහොත් මරණය ජයගෙන සසර කෙළවර කර නිවන සාක්ෂාත් කළ හැකිවේ. රජ ඇමති වේවා, දුප්පත් පොහොසත් වේවා, ශක්තිමත් දුර්වල වේවා, ලොකු කුඩා සියළුම දෙනාම මරණය දායාද කොට සිටිති. මෙම පරම සත්‍ය පිළිබඳව වැටහීමක් අවබෝධයක් නොමැතිකම නිසා හඬාවැළපී දුක් විඳිති.

නිතර තමාට ආදරයෙන් රකින ජීවිතයට හානිවේදෝ යන බියෙන් සියලු දෙනා ජීවත් වෙති. බුදුරජාණන් වහන්සේ නිතර මරණය ගැන සිහිපත් කිරීමට පමණක් නොව ඒ පිළිබඳ නිතර මෙනෙහි කරමින් භාවනා කිරීමටද දේශනා කළ සේක. මරණානුස්සති භාවනාව ලෙස දක්වා ඇත්තේ එයයි.

අද බොහෝ දෙනා මරණය අමතක කර නොමැරෙන මිනිසුන්ගේ ආශාවන් ඔස්සේ හඹා යමින් ජිවත්වෙති. එහෙත් මරණභයින් තැතිගත් අයට ජීවත්වීම දුකකි. තමන්ගේ මරණයට සූදානම් වී ඉතා සැනසිල්ලෙන් හුස්ම හෙළීම කළ යුතු වේ. මේ විදියට අප මරණය ගැන පහත දැක්වෙන ආකාරයට කල්පනා කළහොත් මරණය අසාමාන්‍ය දෙයක් ලෙසට පත්වනු නොමැත.

ඒවා මෙසේ දැක්විය හැක.

1. මම මරණයේ ස්වභාවයට අයත් වෙමි. රෝග වැළඳීමෙන් මිදී නැත.

2. මම මාගේ කර්මයේ දායාදය වෙමි. (කම්ම දායාද) කර්ම විපාකවලින් මිදී නැත.

3. මම මරණයට ගොදුරු වන්නෙමි. මරණය ඉක්මවා නැත.

4. මම මාගේ යැයි ආදරයෙන් සලකන මගේ ශරීරය ඇතුළු ලොව ඇති සෑම දෙයක්ම වෙනස්වීමට පත්වේ. නිරුද්ධවීමට පත්වේ. මගෙන් ඈත්වීමට නැතිවී යාමට පත්වේ.

මෙම ස්වභාවය අපි සංසුන් මනසකින් නිතර මෙනෙහි කරන විට එහි බලවත් ප්‍රතිඵලයක් වන්නේ ලෙඩ රෝග සෑදීම, වයස්ගතවීම, මරණය, ප්‍රියයන්ගෙන් වෙන්වීම පිළිබඳ ඇති බිය දුරුවී යාමයි.

**විද්‍යානුකූල විග්‍රහයකදී මරණය යනු කයේ විනාශවීමක් පමණි. මිනිසා ජීවිතය පුරාම තෘෂ්ණාවේ ඇලී ගැලී ගතකිරීම නිසා මරණයට පත්වේ. ජීවත්වීමේ ආශාව අධිකවූ විට සාංකාවත් ඇතිවේ. යමෙක් තම මරණය සිහිපත් කරන්නේද ඉන් මිදීමක් නැතිබව තේරුම් ගන්නේ ද එම පුද්ගලයා තම මරණයට ප්‍රථම සිය යුතුකම් හා සේවාවන් ඉටුකිරීමට උනන්දු වේ.**

**විශ්‍රාමලත් සහකාර සංස්කෘතික අධ්‍යක්ෂ අභාවප්‍රාප්ත ඩී.එම්.එච්. කරුණාරත්න මහතාහට උපහාර පිණිස නැවත පළ කෙරේ.**




**පුද්ගලයෙකුගේ තරුණවිය දක්වාවූ වෙනස්වීම සතුටක් ලෙස දකින අප, ඉන් අනතුරුව සිදුවන්නා වූ මහළු විය දක්වා වූ වෙනස්වීම් සමුදාය ශෝකවන්නට හේතුවක් ලෙස දකී.රත්න කේ. ප්‍රේමසිරි ගේය පද රචකයාණන් අපේ ජීවිතයේ වෙනස්වීම දකින්නේ සඳ ඇසුරිනි.**




# සඳවතෙන් දුටු ජීවිතයේ යථාර්ථය......

*අර බලන්න කුමරිය වළා යහළුවන් සැදට කරන සරදම්*
*හිනා වෙවී සැඳ හිනා වෙවී සැඳ මඩුව තුරුල්ලෙම දැන්....../ /*

*අර බලන්න සොඳුරිය දුව පැන දැගලන තාරණ දරුවන්*
*හිත සතුට පිරී සැඳ බලා හිඳී දොරකඩට හොරෙන් ඇවිදින්....... / /*

*අර බලන්න මැණිකේ අටවක අහසේ මීදුම් කඳුළු මැදින්*
*වියපත් මව් සැඳ මඩුලු පැලැල්ලේ තරු දරුවන් එනකන්......*

*ගායනය - එඩ්වඩ් ජයකොඩි*
*තනුව හා සංගීතය - එච්.එම්. ජයවර්ධන*
*ගේය පද - රත්න කේ. ප්‍රේමසිරි*


එඩ්වඩ් ජයකොඩි


එච්.එම්. ජයවර්ධන


රත්න කේ. ප්‍රේමසිරි

ලොව තිබෙන්නාවූ සියලුම දෙයට රිද්මයක් තිබේ. මේ රිද්මය එකින් එකකට වෙනස්ය. ජීව අජීව සෑම වස්තුවකට සතු රිද්මයානුකූල බවට හේතුව අනිත්‍ය බව හෙවත් වෙනස්වන සුළු බවයි. 'ලෝකයේ වෙනස් නොවන එකම දෙය වෙනස්වීමයි' යනුවෙන් කියමනක් ඇත. ලෝකයේ නිතය නොවන ස්වබාවය නිසා ජීව අජීව වස්තූන් රිද්මයානුකූල බවින් මිදී එක්වරම මිනිසුන්ගේ, සතුන්ගේ මෙන්ම පරිසරයේද විශාල වෙනස්කම් සිදුවේ. එලෙස දරාගත නොහැකි විශාල වෙනස්වීම් සිදුවන්නේ මිනිසා විසින් ලෝකයේ රිද්මයානුකූල වෙනස්වීම තමාට රුචි පරිදි හැසිරවීම නිසාය.

මෙලෙස වූ ලෝකයේ අනිත්‍ය ස්වභාවය ශෝක වන්නට කරුණක් වුවද ඇතැම්විට එය සුන්දරය. බිළිඳියක් හෝ බිළිඳෙක් දිනෙන් විවිධ විපර්යාස වලට බඳුන් වෙමින් වැඩීම සිතට සතුට උපදවන කරුණකි. ඉන් පසුව කෙලි සෙල්ලම් කරමින් දුව පැන ඇවිදින දරුවා වසර කිහිපයකින් පාසලට ඇතුලුවේ. ඉන් පසු අධ්‍යාපනය ලබා පිටව යන්නේ, තරුණියක හෝ තරුණයෙකි. අනතුරුව තෘතීක අධ්‍යාපනයක් ලබා හෝ නොලබා රැකියාවකට පිවිසෙන තරුණයා, තරුණිය විවාහපත්වේ. දරුවන් ලබා ඔවුහු ද මව්පියන් බවට පත්වේ.

පුද්ගලයෙකුගේ තරුණවිය දක්වාවූ වෙනස්වීම සතුටක් ලෙස දකින අප, ඉන් අනතුරුව සිදුවන්නා වූ මහළු විය දක්වා වූ වෙනස්වීම් සමුදාය ශෝකවන්නට හේතුවක් ලෙස දකී.රත්න කේ. ප්‍රේමසිරි ගේය පද රචකයාණන් අපේ ජීවිතයේ වෙනස්වීම දකින්නේ සඳ ඇසුරිනි.

කුමරිය යනු පෙම්වතියයි. පුරා හඳ නුබ ගැබ දිදුලන විට එය අපට පෙනෙන්නේ ප්‍රේමවන්තියක් විලසිනි. ඇය කෝල බවින් පිරි තම වත වළා අතරේ සැඟව ගිනියි. වළාවන් අතරින් හොරැහින් බලන්නීය. වළාකුළු ද ඇයට සරදහ් කරන්නාක් බඳුය.

දෙවනුව සොඳුරිය යනුවෙන් අමතන්නේ තම බිරිඳටයි. සඳේ ප්‍රභාවට ආශක්තව සිටින අප තරු කට නොදුටුවෙමු. එහෙත් දූන් දගලන, දුවපනින දිප්තිමත් තරු කැට නොදුටු වෙමු. එහෙත් දූන් සඟලන, දුවපනින දීප්තිමත් කරු කැට අපට පෙනේ. මේ තරු දරුවන් යනු සඳවතියගේ දරු පැටවුන්ය. දගලන, දුවපනින තරු දරුවන්ගේ සුරතලය දකිමින් ඈ අප්‍රමාණව සතුටට පත්වන්නීය.

මැණිකේ නමින් පද රචකයා අමතන්නේ වියපත් වූ බිරිඳටයි. පූර්ණ සඳක්සේ අසීමිත ප්‍රභාවෙන් යුතුවූ සඳවතිය දූන් අටවක සඳක් බවට පත්ව ඇත. පුරා සඳ, දුකින් පීඩිත වූ කළු ගැසී ගිය සඳක් බවට පත්වී ඇත. දූන් ඇයට හිසට සෙවණක් හෝ නොමැත. අවලංගු වී ගිය කාසියක්සේ ඉවත්ට විසි වී ගිය ඇය පැල්පතකයට වී දුකසේ ජීවත් වන්නීය. පෙර දින ඈ වටා දඟ කළ තරු දරුවන් ඇය හැර දමා ගොසිනි. වියපත් වූ වැහැරී ගිය ඇය තමා හැරදා ගිය තරු දරවන් යළි එන්නේ කවදා දූයි කඳුලින් පිරී දෙනෙතික් බලාසිටින්නීය.

මෙහිදී මට මෑතක කියවූ කරුණාදාස සූරියආරච්චිගේ 'කන්ද පාමුල' කෘතියේ ජේදයක් මතකයට නැගේ. 'ජීවිතයේ පුරාම අපි කරන්නෙ කන්දක් නගින එක. ඒත් අපි හැමෝටම කඳු මුදුනට යා ගන්නට බැහැ. මගක් දුර කන්දනගින කොට අපි දෙමාපියන් බවට පත් වෙනවා. ඊට පස්සේ දරුවොත් එක්ක කන්ද පාමුලට එන්ඩ අපට සිද්ධ වෙනවා. දරුවන්ගෙන් නිදහස් වුණාට පස්සෙ අපි කන්ද නඟින්නට පටන් ගන්නවා. ඒත් දරුවො විඳින දුක දැනිල එහෙමත් නැත්නම් දරුවෙන්ගෙ දරුවන්ට ආස හිතිලා ආයිමත් කන්ද පාමුලට එනවා. කාට හරි පුළුවන්නම් කන්ද තරණය කරලා මුදුණය යන්ඩ ඔහු අපූරු මිනිහෙක් වෙනවා.

මේ කෘතියේ කන්ද මුදුණ යනු ආත්ම සාක්ෂිත් කරණයයි. ආත්ම සාක්ෂිත්කරණය කලෝ නම් බුදුවරු සහ රහත් තෙරුනන් හා පසේ බුදුවරුම පමණි. පෘථග්ජනයන් වන අප නිබදවම කරන්නේ ජීවිතය නම් කන්ද නැගීම බැසීම හා යළි නැගීමයි. ජීවිතයේ වූ බැඳීම් නිසා කන්ද තරණය කිරීඹ අපහසු දෙයක් වේ.

සඳට සදා කල්හිම තාරුණයයෙන් පරිපූර්ණව සිටිය නොහැක. එහි අලෝකය මදින් මද වෙනස් වී අටවක සඳ බවට පත්වේ. ඉන් පසුව අමාවක වී සඳ එළිය නැතිව යයි. සඳෙහි වෙනස්වීම් රත්න කේ. ප්‍රේමසිරි නම් ගේය පද රචකයාණන් සෞන්දර්යාදීව දකිමින් අපේ ජීවිතයට ගලපා ගන්නා අයුරු අපූරුය.

උසස් කලා කෘතියක මූලික ලක්ෂණ වන්නේ අර්ථාන්විත බව හා අපූර්වයයි. රචකයා තම ප්‍රතිභාවත්, පර්යාප්තික අත්දැකීම් ද ඇසුරින් අර්ථාන්විත නිර්මාණයක් ආනන්දය ජනනය වන අයුරින් නිමවා ඇත.

රචකයාගේ අනුභූතිය වූයේ හන්තානට උඩින් පෑයූ කෘෂ වී ගිය, වක ගැසී ගිය අටවක සඳයි. ඔහුට එය පෙනෙන්නේ වියපත්වූ මවක විලාශයෙනි. ප්‍රතිභාසම්පන්න නිර්මාණකරුවන් සුලභ දෙයෙහි දුලබ නොපෙනන අරුත් දකී. ඒ තුළින් අපූර්ව නිර්මාණ බිහි කරති.

ගීතයෙන් කියවෙන්නේ ජීවිතයේ වෙනස්වීම් වුවද මෙහි සංගීතයේ හා ගැයුමෙහි රිද්මය වෙනස් නොවේ. එයට හේතුව ජීවිතයේ අවධි වෙනසකට ලක් වුවද ජීවිතය ගලා යන්නේ එකම රිද්මයකයට. මේ නිසා ගීතයේ රිද්මය වෙනසක ලක් නොකල බව එච්.එම්. ජයවර්ධනයන් පවසයි.

එම්. එම්. ජයවර්ධනයන්ගේ සංගීතය හා තනුවත් විශාරද එඩ්වඩ් ජයකොඩිගේ මධුර හඬත් ගීතය අප හදවත් තුළ නොමැකෙන මතකයක් රඳවයි.



චාමිකා ජනානි ද සිල්වා



# ලක්දිව ප්‍රාග් බෞද්ධ යුගයේ පැවති ඇදහිලි හා පුද සිරිත්

ලක්දිව ප්‍රාග් බෞද්ධ යුගයේ පැවති ඇදහිලි හා පුද සිරිත් පිළිබඳව සමන්ත පාසාදිකාව වංශ කතා හා වංසත්ථප්පකාසිනී යන ග්‍රන්ථ මූලාශ්‍ර කොට ගෙන විමසීමට ලක් කළ හැකිය. ආචාර්යය වල්පොල රාහුල හිමිපාණෝ පවසන පරිදි ලංකාද්වීපයට බුදු සමය හඳුන්වා දීමට පෙර මෙරට ක්‍රමවත් ලෙස සංවිධානය වූ ජාතික හෝ රාජ්‍ය ආගමක් තිබී නැත. ප්‍රාග් මහින්ද යුගයේ සිංහලයන් නොදැහැමි ඇදහිලිවලට යොමු වී සිටි වග හ්‍යුසියෑංගේ දේශාටන වාර්තාවේ ද සඳහන් වේ.

සකලවිධ බොදු ලෝකවාසී සත්ත්වයාගේ දෑස් කඳුළින් තෙමා හළ ගෞතම බුදු පියාණන් වහන්සේගේ පරිනිර්වාණ දිනම විජයාවගමනය මෙරටට සිදුව ඇති බව දීපවංශ- මහාවංශ වැනි වූ වංශකතා සඳහන් කරයි. ඊට මත්තෙන් බුදු පියාණන් වහන්සේ ද තෙවරක්ම ලක් දෙරණට වැඩම කොට ඇති අතර එකී වැඩම කරලීම් දෙස ආවර්ජනය කරන විට යක්ෂ නාග නැනි ගෝත්‍රික පිරිස් පිළිබඳ සඳහන් වනු ඇත. එසේ නම් කළ නමුදු එම පිරිස් ද මනුෂ්‍ය කොට්ඨාසයක් බවම දත යුත්තේම ය.

මහින්දාගමනයට පෙර ලක්දිව ඇදහිලි රැසක්ම පැවති බවට සාධක ඇත. යක්ෂ දේව ප්‍රේත මළවුන් ඇදහීම මෙන්ම ස්වාභාවික වස්තූන් කෙරෙහි ඇදහීම ද තිබී ඇති බවට දත්තයන් එමට ය. වංශකතා කෙරෙහි සුපරීක්ෂාකාරීව බලන කල්හි යක්ෂ වන්දනය පිළිබඳවත් රජවරු ඔවුනට විමාන තනා දීම පිළිබඳවත් සඳහන්ව ඇති කරුණු එමට ය. වළවාමුඛී හා පච්චිම රාජිනී යන යක්ෂණියන් මෙන්ම චිත්තරාජ කාළවේල මහේජ වෛශ්‍රවණ ජුතින්ජර විභීෂණ වැනි යක්ෂයින් පණ්ඩුකාභය රජ දවස සිටි බවට මහාවංශය සඳහන් කරයි.

ප්‍රේත ඇදහිල්ල ද ප්‍රාග් බෞද්ධ යුගයේ මෙරට වූ තවත් ඇදහිල්ලකි. මෙකී ඇදහිල්ල තදින්ම මුල් බැස ගත්තක් බවට කදිම නිදසුනක් ලෙස මිහිඳු මා හිමි පාණන්ගේ ලංකාගමනයෙන් දෙවන දිනම ප්‍රේත වස්තුව හා විමාන වස්තුව දේශනා කිරීම පෙන්වා දිය හැක්කකි. බුදු සමයෙහි ප්‍රේත යනුවෙන් සඳහන් කරනුයේ මළවුන්ට නොවන අතර අකුසල කර්ම විපාක හේතුවෙන් ඉතා අන්ත දුක්ඛිත ජීවිත ගත කරන අයට ය.

මහාවංශයෙහි වන තොරතුරු සලකා බලන කල්හි ප්‍රාග් මහින්ද යුගයේ ආගමික විශ්වාස ප්‍රමුඛ වශයෙන් ඝන දෙකකට වෙන් කළ හැකිය. ඒ කෙසේද යත් ඉන් එක් ඝනයක් වනුයේ බ්‍රාහ්මණ සමය ජෛන සමය ආජීවක සමය හා පරිබ්‍රාජක ඉගැන්වීම් යනාදියයි. මෙහි ආගමික විශ්වාසයන් බොහෝ දුරට සංවිධානාත්මක වූ දාර්ශනික පක්ෂයට නැඹුරු ආගමික විශ්වාසයන් ලෙස සැලකිය හැකිය. එමෙන්ම මෙම ආගම් භාරතීය ප්‍රභවයකට ද උරුමකම් කියනු බැව් කිය යුතු මනාය. අනෙක් ඝනය ලෙස යක්ෂ වෘක්ෂ දේවතාවන් ඉටු දෙවි මළවුන් පිදීම යනාදී වූ ප්‍රාථමික ඇදහිලි ගෙන හැර දැක්විය හැකිය. එකී විශ්වාසයන් දේශීයත්වයෙන් යුක්ත වන්නේ ය. ෆ්‍රෙසර් හා ටයිලර් වැනි වියතුන් දක්වන පරිදි සෑම ප්‍රාථමික ජන සමාජයකම පාහේ මෙවන් විශ්වාස පොදු ජනයා තුළින් පහළව ගරු කෙරෙනු ඇත. ආචාර්යය සෙනරත් පරණවිතානයන් විසින් 1 වන සියවසට අයත් සේ නිශ්චය කරනු ලැබූ කිරින්දෙන් හමු වූ පද්‍යමය ශිලා ලේඛනයෙහි නාග නම් යුවරජු මිත්‍යා දෘෂ්ටිය අතහැර බුදු සමය වැළඳගත් බව සඳහන් වේ. එකී මිත්‍යා දෘෂ්ටීන් වනාහි බොහෝ විට ප්‍රාග් මහින්ද යුගයේ ඇදහිලි හා විශ්වාසයන් ලෙස නිගමනය කළ හැකිය.

### පණ්ඩුකාභය රජ දවස යක්ෂ

පණ්ඩුකාභය රජ පවුලට ලෙන්ගතුව සිටි දාසියක් ද මරණින් මතු යක්ෂණියකව උපත ලද බවට කරුණු වේ. රජු ඇයට නගරයෙන් දකුණු වාසල දෙවොලක් ඉදි කොට දී ඇත.

මහේජ වෛශ්‍රවණ විභීෂණ කාලසෝදර වැනි යක්ෂයෝ පැරණි ලක්දිව ලංකාවාසීන්ගේ පූජනීයත්වයට ලක් වූවෝ වෙති.

මෙකී වෛයශ්‍රවණ නම් වූ යක්ෂයා යක්ෂයෙකු නොව සතර වරම් දෙවිවරුන්ගෙන් කෙනෙකු ලෙස ද සැලකේ.

ලක් දෙරණෙහි ප්‍රාග් බෞද්ධ සමයෙහි බ්‍රාහ්මණ ආගම ද ප්‍රබල ආගමක් ලෙස පැවති බවට සාධක දක්නට ඇත. පණ්ඩුකාභය රජු ශිල්ප උගෙන ඇත්තේ පණ්ඩුල නැමැති පුරෝහිත බ්‍රාහිමණයෙකුගෙනි. එකී බමුණාගේ පුත් චන්ද්‍ර නැමැති බ්‍රාහිමණ තෙමේ පණ්ඩුකාභය රජුගේ පුරෝහිතයා ද වී ඇති බව දත යුතුය.

**පණ්ඩුකාභය රජ දවස යක්ෂ ඇදහිල්ලට ප්‍රමුඛස්ථානයක් තිබූ බවට මහාවංශය සඳහන් කරයි. එම රජු චිත්තරාජ යක්ෂයාට අභය වැවේ පහළ කෙළවරෙහි වාසස්ථානයක් කරවූ බව සඳහන් ය. එසේ වූ හෙයින් ඉන් පෙන්වන්නා වූ ප්‍රබල කරුණක් නම් පොදු මහජනතාව අතර පමණක් නොව රාජකීයයන් හා රාජකීය පවුල් ආශ්‍රිත ප්‍රභූන් අතර ද මෙවැනි ඇදහිලි හා විශ්වාස පැවති බවය.**

ඇදහිල්ලට ප්‍රමුඛස්ථානයක් තිබූ බවට මහාවංශය සඳහන් කරයි. එම රජු චිත්තරාජ යක්ෂයාට අභය වැවේ පහළ කෙළවරෙහි වාසස්ථානයක් කරවූ බව සඳහන් ය. එසේ වූ හෙයින් ඉන් පෙන්වන්නා වූ ප්‍රබල කරුණක් නම් පොදු මහජනතාව අතර පමණක් නොව රාජකීයයන් හා රාජකීය පවුල් ආශ්‍රිත ප්‍රභූන් අතර ද මෙවැනි ඇදහිලි හා විශ්වාස පැවති බවය.

ඊට අමතරව කාළවේල නම් වූ යක්ෂයාට නගරයේ නැගෙනහිර පැත්තෙන් වාසස්ථානයක් කරවූ බව ද මහාවංශයෙහි සඳහන් වෙයි. ආචාර්යය වල්පොල රාහුල හිමිපාණෝ පවසන පරිදි මේ අය මළ භූතයන් බව පෙන්වා දෙයි. එම කරුණ සත්‍ය නම් මෙරට මළගිය වුන් පිදීම ද තිබූ බවට නිගමනය කළ හැකිය.

තවද මහාවංශ ටීකාවේ ජුතින්දර නම් යක්ෂයෙකු ගැන ද සඳහන් වේ. එමෙන්ම වළවාමුඛී පශ්චිම රාජිනී නම් වූ යක්ෂණියන් පිළිබඳව ද උක්ත සඳහන් කරන ලදී. චේතිය ජුතින්දරගේ භාර්යාව ලෙස වළවාමුඛී අශ්ව වේශයෙන් යුතුව පණ්ඩුකාභය රජුට උපකාර කොට ඇත.

ඈත අතීතයේ පටන් වෘක්ෂ වන්දනය ද මෙරට පැවත ඇති බවට සාදක ඇත. අනුරපුර බටහිර වාහල්කඩ අසල නුග ගසක් වෛශ්‍රවණගේ වාස භවනය ලෙස ද තල් ගසක් ව්‍යාධ දේවගේ වාස භවනය සේ ද පණ්ඩුකාභය රජු විසින් සම්මත කොට ඇත. මේ බව මහාවංශයෙහි 89 වන ගාථාවේ දැක්වේ.

රාජ සභාව සමන්විත වී ඇත්තේ ද බ්‍රාහ්මණයන්ගෙන් බැවින් මෙකී යුගයේ බ්‍රාහ්මණයන් බලවත්ව සිටි බව පෙනේ.

එහි බලපෑමක් ලෙස මහාබෝධි වංශය සඳහන් කරන පරිදි දෙවන පෑ තිස් රජු මහමෙව්නාවේ සීමා බන්දනය කරන විට දිව්‍යවාස නැමැති බමුණු දෙව්ගෙය වමට සිටින සේ සීමා ලකුණු කොට ඇත.

විජය රජු සමඟ පැමිණියා වූ උපතිස්ස නැමැති බමුණා විජගේ මරණින් පසු සිහසුනේ වැඩ බලා ඇත. පණ්ඩුකාභය රජු බ්‍රාහ්මණයන්ට තනවා දුන් ආරාම දේවාල අතර සිවිකා සාලා- සොත්ථි සාලා යනාදී වූ ගොඩනැගිලි දෙකක් පිළිබඳ මහාවංශ ටීකාවක් වන වංසත්ථප්පකාසිනීයෙහි සඳහන් වෙයි.


15 පිටුවට...

ආර්. එන්. එච්. එම්. සමන් ජයරත්න

සසුන

## චර්යාමය වෙනසට මඟ හෙළිකරන

# මේ පින්බර




**මේ** එළඹ ඇත්තේ වස්සාන කාලයයි. විනයානුකූලව මෙන්ම ධර්මානුකූලවත්, ප්‍රතිපත්ති ගරුකවත් වාසය කිරීමට සුදුසු කාලය මේ පිංබර වස්සාන සමයයි. විශේෂයෙන්ම භික්ෂූන් වහන්සේලා වෙහෙර විහාරස්ථානවල මෙම තුන්මස වස් වසන අතර ගිහි බෞද්ධයින් විසින් චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස යන සිව්පසයෙන් භික්ෂූන් වහන්සේලාට උපස්ථාන කරනු ඇත. භික්ෂූන් වහන්සේලාගෙන් ගිහි බෞද්ධයන් බලාපොරෝත්තු වන්නේ ආගමික සහනසීලීතාවයයි.

ඒ අනුව භික්ෂූන් වහන්සේලා ගිහි බෞද්ධයින්ට අර්ථයෙන්, ධර්මයෙන් සංග්‍රහ කරනු ඇත. ගිහි බෞද්ධයින් අවුරුද්දේ වෙනත් කාලවලට වඩා ප්‍රතිපත්තිමය ජීවිතයකට තම චර්යා රටාව හුරු පුරුදු කරගනිමින් සිත, කය, වචනය නම් වූ ත්‍රිවිධ ද්වාරයෙන්ම කුසල් රැස්වෙන ආකාරයෙන් වැඩකටයුතු කිරීමට වග බලා ගන්නවා ඇත. බුදුරජාණන් වහන්සේ මෙම වස්කාලය තුළ භික්ෂූන් වහන්සේලාට වස් සම්බන්ධව දේශනාකළ ආකාරය සොයාබැලීම ඉතා වැදගත් වේ.

වස් සමාදන්වීම දෙයාකාරයකින් සිදුවේ. එනම් පෙර වස් සමාදන්වීම හා පසු වස් සමාදන්විම යනුවෙනි. මෙයින් වඩා වැදගත්වන්නේ පෙර වස් සමාදන්විමයි. ඒ අනුව, ඇසළ පොහෝ දින පෙර වස්ද, නිකිණි පොහෝ දින පසු වස් ද විසීමට විනයෙන් අවසර ඇත. එම වස් සමාදන් විමෙන් මාස තුනකට පසුව වස් පවාරණයකොට, ඊළඟ මාසයේදී කඨින පිංකම් සිදුකරනු ඇත. ඒ අනුව පෙර වස් සමාදන්ව විසූ භික්ෂූන් වහන්සේලාට කඨින චීවර ලබාගැනීමට පුළුවන් වන අතර පසු වස් සමාදන්වූ භික්ෂූන් වහන්සේලාට කඨින චීවරයක් ලබාගැනිමේ වරප්‍රසාදය අහිමිවේ.

මෙම වස් කාලය පිළිබඳ ගිහි බෞද්ධයින්ට ඇති දැනුම අවබෝධය තවත් පුළුල් කිරීම පිණිස, වැඩි දියුණු කරගැනීම පිණිස කරුණු කීපයක් ඉදිරිපත් කිරීම වැදගත් වේ. ඒ අනුව විමසා බැලීමේදී, හැම අවුරුද්දකම මාස හතර බැගින් සෘතු තුනකට බෙදා වෙන් කොට ඇත. එනම්, හේමන්ත, ගිම්හාන, වස්සාන, යනුවෙනි. සිද්ධාර්ථ කුමාරයාට ඒ අනුව රම්‍ය, සුරම්‍ය, සුභ යනුවෙන් මාළිගා තුනක් ද වාසය කිරීම සඳහා ඉදිකර දී තිබුණි. හේමන්ත සෘතුවේ අධික ශීතලක්ද, ගිම්හාන සෘතුවේ අධික උණුසුමක්ද, වස්සාන සෘතුවේ අධික වර්ෂාවක්ද පවතින්නේය. ඉන්දියවේ කුරුළු, සිව්පා ආදී සතුන්ගේ පවා සිරිත වූයේ, වස්සාන සෘතුවේ එක් තැනක වාසය කිරීමයි. බුදුරජාණන් වහන්සේ ලොව පහළ වීමෙන් අනතුරුව භික්ෂූන්වහන්සේලා වස්සාන සෘතුවේ එක් තැනක වාසය කිරීමක් නොකරන ලදි. කොතැනක හෝ අසුවුණු තැනක වාසය කිරීම සිරිතක් කොට ගෙන තිබුණි. භික්ෂූන් වහන්සේලා වැස්සට තෙමී තෙමී ඇවිදිම දයක දයිකාවන්ගේ අප්‍රසාදයට හේතු විය. මේ නිසා වැසි සමයේ එක තැනක වාසය කරන ලෙස බුදුරජාණන් වහන්සේ අනුදැන වදළ සේක. මේ පිළිබඳ කරුණු චුල්ලවග්ග පාලියේ වස්සූපනායික්ඛන්ධයේ සඳහන් වී ඇත. ඒ අනුව විමසා බැලීමේදී අනුජානාමි භික්ඛවෙ වස්සානෙ වස්සං උපගංතු" යනුවෙන් වස් කාලයේ වස් විසිය යුතු බව දේශනා කරන ලදි.

එක තැනක මාස කීපයක් දිගින් දිගටම වාසය කිරීම, මහණදම් පුරන්නට ඉතා හොඳම කාලය ලෙස සලකා, සංඝයා වහන්සේට ඊට අදාළ වන අන්දමට කටයුතු කරන ලෙසත් වදළහ. එද සිට උපසම්පදාවූ සියලු භික්ෂූන් වහන්සේලාගේ සිරිතක් වූයේ වස් සමාදන් වීමයි. වස් කාලය තුළ ඇවිදීමේ සිරිතක් ඇත්තේ නැත. එහෙත් ඉතාම අවශ්‍ය ගමන් බිමන් කළහැකිය. කිසියම් හේතුවක් නිසා දින හතකට පෙර පැමිණීමේ බලාපොරොත් තුවෙන් වස් විසූ ස්ථානයෙන් බැහැර වන්නට හැකියාවක් ඇත. හත් වැනි දිනය ගෙවෙන්නට පොරොත්තුව කෙසේ හෝ තමන් වස විසූ ස්ථානයට පැමිණිය යුතුය. මේ ක්‍රමය ධර්මයෙන් උගන්වන්නේ සත්තාහකරණය" යනුවෙනි. එයින් පැහැදිළි වන්නේ දින හතක් පමණක් අරාමයෙන් බැහැරව විසිය හැකි බවයි. දින හතකට වඩා වැඩියෙන් බැහැරව වැඩ සිටීම වස්කමට බාධාවක් වන බැවිණි. වස් විසූ ස්ථානයෙන් බැහැරව ආගමික කටයුත්තක් වැනි වැදගත් දේකට වඩිනවිට එදාම එන්නට වගබලා ගත යුතුය. එය දැක්වෙන්නේ සතිකරණය" නමිනි. මෙහිදී සති යන්නෙන් පැහැදිළි වන්නේ සිහියයි.

සත්තාහකරණයෙන් වස් විසූ ස්ථානයේ සිට බැහැරව යා හැක්කේ භික්ෂුණී සික්ඛාමාතා සාමනේර, සාමනේරී මව් පියන් උපාසක උපාසිකාවන් ආරාධනාවක්කල කල්හිත් ඔවුනොවුන් ගිලන් වූ කල්හිත් මේ පිරිසගේ පණිවිඩයක් සොරුන්, අමනුෂ්‍යයන් හිරිහැර බාධාකරන විට ගින්නෙන් හා ජලයෙන් ගමට හෝ සෙනසුනට හානි පැමිණීවිට, සමාදන් වූ වස් බිඳ දැමිය හැකිය. දාන මානාදිය නොලැබීම, දායකයින්ගේ නොසැලකිල්ල, වෙනත් වැරදි ආදිය නිසා වස් බිඳ හෙළිය හැකිය. එහි වරදක් නෙමැති බව චුල්ලවග්ගපාලියේ" වැඩි දුරටත් කරුණු ඉදිරිපත්කොට ඇත.

වස් වසිය යුතු තැන් මෙන්ම වස් නොවිසිය යුතු තැන්ද එහි ඉදිරිපත් කොට ඇත. ඒ අනුව බොහෝ දුරට වස්විසිම සඳහා සුදුසු යැයි සිතා, තෝරාගන්නේ පන්සලක්, ආරාමයක් ආදී පහසු ස්ථානයන්ය. එසේ ගොපල්ලන් හා ළන්දන්ය. ගස් බෙණ, ගස් අතු බෙදුණු තැන,සාර්ථවාහකයන් වසන තැන් මෙන්ම නැවකද වස් විසීමට අනුදැන වදාරා ඇති අතර ඔවුන් යන තැන්වල වස් විසූ තැනැත්තාටද යා හැකි බව දක්වා ඇත. මෙහිදී දර්ථවාහකයන් යනුවෙන් පැහැදිළිකොට ඇත්තේ ගැල්වලින් ගමන් ගන්නා වෙළෙන්දන්ය. ගස් බෙණ, ගස් අතු බෙදුණු තැන, එළිමහන, වහළක් දොරක් නැති තාප්පයකින් වටවූ තැන්, මිනී කාමර, විශාල කුඩ හා විශාල හැලි ආදියේ ඉන්නට හැකියාව තිබුණත් වස් විසීම නොසුදුසු වේ.

**" වස් කාලය පින් කාලය හැටියට හැඳින්වෙන බැවින්, මේ කාලය තුළ පැවිදි කිරීම හා උපසම්පදා කිරීම් සුදුසු බව බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළහ "**

වස් කාලය පින් කාලය හැටියට හැඳින්වෙන බැවින්, මේ කාලය තුළ පැවිදි කිරීම හා උපසම්පදා කිරීම් සුදුසු බව බුදුරජාණන් වහන්සේ අනුදැන වදාරා ඇත. වස් විසීම බුද්ධ චරිතයත් සමඟ සංසන්දනය කර බැලීමෙන් උන්වහන්සේ පළමුවෙන් එය සිදු කළේ මංගල ධර්ම දේශනාව දේශනා කිරීමෙන් අනතුරුවයි. වෙසක් පොහෝ දින ලොව්තුරු සම්මා සම්බුදු බව ලබා මාස දෙකකට පසුව බුදුරජාණන් වහන්සේ ධම්මචක්කපවත්තන" සූත්‍රය දේශනා කරන ලදි. ඊට පසුදා උන්වහන්සේ බරණැස් නුවර ඉසිපතනාරාමයේ මිගදාය නම් වූ ස්ථානයේ වස් විසීම සිදු කළේය.
අවුරුදු තිස් පහේදී සම්මා සම්බුදු වූ උන්වහන්සේ පිරිනිවන් පෑවේ අවුරුදු අසූවේදීය. ඒ අතර කාලය අවුරුදු හතළිස් පහකි. මෙය හඳුන්වන්නේ පන්සාළිස් වසරක් යනුවෙනි. මේ කාලයේ වස් 25 ක්ම සැවැත්නුවර වැඩ වාසය කරමින් වස් නොබිඳ ආරක්ෂා කරමින් වස් වසන ලදි. එයට හේතුව වශයෙන් සැළකෙන්නේ කාරණා දෙකක් නිමිති කරගෙන බව පැහැදිලි වේ. පළමු අවුරුදු විස්සේදී උන්වහන්සේගේ දඹදිව පුරා වඩිමින් දහම් දේශනා කරමින් නිවන් දැකිය හැකි සත්වයන් හික්මවමින් වැඩ වාසය කළේය.

iv පිටුවට....

# වස්සාන සමයයි

උන්වහන්සේට ඒ කාලය තුළ මුළු දඹදිවින් විශාල කොටසක බුදු දහම පතුරවාලන්නට හැකියාවක් ලැබුණි. ඒ නිසාම අන්තිම කාලයේ එකම තැන වාසය කිරීමේ අවශ්‍යතාවයක් මත එහිම වැඩ වාසය කරන ලදි. තවද බුදුරජාණන් වහන්සේගේ කාලයේ සැවැත් නුවර කෝටි තිහක් වැනි වැඩි ජනගහනයක් සිටීමත් හේතුකොටගෙන වැඩි පිරිසකට වැඩි පහසුකම් සළසාලීමේ අදිටනින් යුක්තව එහි වැඩ වාසය කළහ.

මෙම වස් කාලය තුළ පැවිදි පක්ෂය පැත්තෙන් වස්විසූ භික්ෂූන් වහන්සේලා විශේෂයෙන් බණ භාවනා සඳහා යොදාගන්නේ මේ කාලයයි. එනිසා භික්ෂූන් වහන්සේලා මේ කාලය තුළ සිත, කය, වචනය, යන ත්‍රිවිධ ද්වාරයන් සංවර කරගැනීම සඳහා වැඩි සැළකිල්ලක් හා උනන්දුක් දක්වන ආකාරයත් දක්නට ලැබේ.

**සීලේ පතිට්ඨාන නරෝ**
**සපඤ්ඤෝ**
**චිත්තං පඤ්ඤංච භාවයං**
**ආතාපි නිපකෝ භිකඛු**
**සො ඉමං විජටෙ ජටං**

සංයුක්ත නිකායේ දේවතා සංයුත්තයේ සඳහන් වන ඉහත ගාථා ධර්මයට අනුව සීලවන්තව නැණවන්තව සමථ විදර්ශනා භාවනායෝගීව උත්සහවන්තව බුද්ධි සම්පන්නව කටයුතු කරන භික්ෂූන් වහන්සේට සංසාර දුකින් නිදහස් වීමේ භාග්‍යය හිමිවන ආකාරය එයින් උත්සහාවන්ත වන භික්ෂූන් වහන්සේ මුලින්ම කළයුත්තේ සිල්වත් වීමයි. එනම් කය වචනය සංවර කර ගැනිමයි. කාය වාචානං සමොධානං සීලං" යනුවෙන් සඳහන් වන්නේ ඒ බවයි. එවැනි සිල්වත් භීක්ෂුවක් කුමන බාධක, කරදර පැමිණියත් තම ශීලයට හානියක් කරගන්නේ නැත.

බුදුරජාණන් වහන්සේ තරම් ශීලය අරක්ෂාකළ උත්තමයෙක් මේ ලෝක ධාතුව තුළ තවත් දක්නට නොලැබේ. උන්වහන්සේගේ චරිතය තුළින් පැහැදිළි වන්නේ සෑම ආත්ම භාවයකදීම ජීවිතය දෙවනි කොට ශිලය පළමු තැන්හිලා තබා ශිලය ආරක්ෂා කළ බවයි. එයට හොඳම නිදසුනක් ලෙස බෝසතාණන් වහන්සේ තිරිසන් ආත්මයක නාගරාජයෙක්ව උපන් කතා පුවත ඉතා වැදගත්ය.

බෝසතාණන් වහන්සේ භූරිදත්ත නාගරාජයෙක් වී එක් ආත්මයක ඉපදී සීලය ආරක්ෂා කරමින් කල්ගෙවන ලදි. දිනක් නාරජු ළඟට පැමිණි අහිගුන්ඨිකයින් පිරිසක් නා රජු විශාල දිග ලීයකට තබා බැඳ, ශරීරයද විද ඒ තුළින් ලණු රැහැන් වැල් දමා තදට වෙළන ලදි. එහිදී නාරජු කල්පනා කළේ මේ සියලු මිනිසුන් විෂ ධූමයකින් වනසාලන්නට හැකියාව ඇති නමුත් එසේ නොකර සමාදන් වූ ශිලයම රක්නා බවයි. තමන්ගේ ජීවිතයට වඩා ශිලය ආරක්ෂා කිරීම උතුම්බව කල්පනා කරලයි ඒ ආකාරයෙන් ජීවිතය විනාශ වුවත් ඉවසීමෙන් කල්ගත කළේ.

දෙස විමසා බැලීමෙන් පැහැදිළි වන්නේ වස් කාලය තුළ ශිලය ප්‍රමුඛස්ථානයෙහි තබා කටයුතු කළ බවයි. පැවිදි පක්ෂය තම ශීලයද ගිහි පක්ෂය විසින් පංච ප්‍රතිපත්තිද ආරක්ෂා කරමින් මෙම වස් කාලය තුළ තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් කුසල කර්ම සිදු කරමින් ජීවිතය පවත්වාගෙන යැමයි තමන් සතු අඩුපාඩු සකස්කරගනිමින් ආධ්‍යාත්මික දියුණුව උදෙසා යහපත් කාර්යයන්වල නියැලිය යුතුය.

එයින් කායික මානසික යන දෙඅංශයම සංවර්ධනය වේ. සිත කය වචනය සංවර කළ මුළු මහත් සමාජ තලයම ක්‍රියාකරන්නේ යහපත් පුද්ගලයින් වශයෙනි. ඒ අනුව චර්යාමය වෙනසක් ඇතිවී ඊර්ෂ්‍යා, ක්‍රෝධ, වෛර පලිගැනීම් වැනි නපුරු සිතුවිලි නැති වී යයි. කරුණාව, දයාව, මෛත්‍රිය, අවිහිංසාව වැනි උතුම් මානුෂික ගුණාංග මතුවී, සියල්ලෝම ඒ තුළින් දුකෙන්, බියෙන් තොර ජීවිතයකට අවතීර්ණ වන්නේය.

සැමදෙනාගේම ලෞකික සැපත මෙලෙසින් සිදුවන්නාසේම, ලෝකෝත්තර සුවය උදෙසාද මෙම වස් කාලය තුළ කරගන්නා යහපත් කටයුතු හේතුවන බව සිහියට නඟාගත යුතුය.

ගලගෙදර රතනවංශ හිමි

" මෙම වස් කාලය තුළ පැවිදි පක්ෂය පැත්තෙන් වස්විසූ භික්ෂූන් වහන්සේලා විශේෂයෙන් බණ භාවනා සඳහා යොදාගන්නේ මේ කාලයයි. එනිසා භික්ෂූන් වහන්සේලා මේ කාලය තුළ සිත, කය, වචනය, යන ත්‍රිවිධ ද්වාරයන් සංවර කරගැනීම සඳහා වැඩි සැළකිල්ලක් හා උනන්දුක් දක්වන ආකාරයත් දක්නට ලැබේ. "

වැඩිදුරටත් පැහැදිලිවේ. මෙම කරුණු සියල්ල

# ජාතික කොඩිය



රටක ජාතියක උත්තරීතර සංකේතය එරට ජාතීන්ගේ ජාතික කොඩිය යයි පැවසීම සාධාරණය. ජාතික කොඩියෙන් ගැඹුරු අර්ථයක් සංකේතවත්වේ. ජාතික කොඩියෙන් ලබා දෙන පැහැදිලි දර්ශනය නිර්මාණශීලිත්වය කුමක්දැයි තව දුරටත් විමසා බලමු.

ප්‍රථමයෙන්ම දකුණු අතින් අසිපතගත් සිංහයෙකුගේ රූපයක් ධජය මැද දකින්නට ලැබේ. රතුපාටින් බැබළෙන පසුබිමක මෙම රූපය කහ පාටින් දක්වා තිබේ. කොඩිය වටා කහපාට තීරුවකි. සතර කොන බෝපත් සතරකි. තැඹිලි පාට සහ කොළපාට තීරු දෙකක් කොඩියේ සිරස් අතර දැක්වේ. කඩුව අතින්ගත් සිංහ රූපයෙන් තේජස සහ උත්තරීතර බව හඟවයි. පාද තුනකින් සිටගෙනෙ අසිපත දරා සිටින සිංහයාගෙන් තුන් සිංහලය එක්සේත් කළ බව එම ආරක්ෂක ආයුධය පරමාධිපත්‍යයේ සංකේතය වන අතර එය ඉහළට එසවී තිබීමෙන් ජාතියේ ස්වාධීනත්වය නිරූපනය වේ.

බෝපත් සතරෙන් මෙත්තා, මුදිතාව, කරුණාව සහ උපේක්ෂා යන සතර බ්‍රහ්ම විහරණ නිරූපණය වේ. තැඹිලි පාට තීරුවෙන් ද්‍රවිඩ ජනතාවත් කොළ පාට තීරුවෙන් මුස්ලිම් ජනතාවත් නියෝජනය කෙරේ. මේ තීරු දෙක ජාතික කොඩියට මෙලෙස එකතු කරන ලද්දේ මේ ජාතීන් දෙකට අප රටේ නිදහස්ව ජීවත් විය හැකි බව පෙන්වීමටයි. මෙම තීරුවක ප්‍රමාණය සම්පූර්ණ කොඩියේ ප්‍රමාණයෙන් භාගයෙන් එකක් විය යුතු යැයි නිර්දේශ කර ඇත. තද රතුපාට පසුබිමෙන් පෙන්වන්නේ ගාම්භීරත්වය සහ සමෘද්ධිමත් බවයි. කහ පාටින් සිංහලයාගේ ධාර්මික බව මෙන්ම සාමකාමීත්වය ද පිළිබිඹු වෙයි.

මීළගට අපි ජාතික කොඩියේ ඉතිහාසය දෙස බලමු. ඉතා දුරාතීතයේ පටන් අප රටේ සිංහයා පිළිබිඹු කර ගනිමින් ජාතික ධජය සකස් කොට ඇති බවට සාධක ඇත. දේවානම් පියතිස්ස රජ සමයේ ද රාජකීය ධජය වූයේද සිංහ කොඩියයි. සිංහල රාජ වංශයේ රාජකීය සලකුණ වුයේද සිංහ රූපයයි. අප ජාතික ධජයේ අතිතය සනාථ කිරිමට අවශ්‍ය තරම් සාධක ඉතිහාසයේ ඇතත් ඒ පිළිබඳව සැලකිය යුතු කරුණු හෙළි වන්නේ ක්‍රි.ව. 1765-1778 දක්වා වූ වකවානු තුළදීය. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කාලය දක්වාම අඛණ්ඩව සිංහලයේ ජාතික ධජය ලෙස සිංහ කොඩිය භාවිත කර ඇත. 1803 සැප්තැම්බර් මස 13 වැනි දින ශ්‍රී වික්‍රම රාජසිංහ රජු හන්වැල්ලේදී පැරදී පලායන විට දමා ගිය සිංහ කොඩිය ඉංග්‍රීසි ආණ්ඩුකාරයා විසින් ලබාගෙන ලන්ඩනයේ 'වයිට්හෝල්'දෙව් මැදුරේ තැන්පත් කරන ලදි.

මේ බව 1815 පෙබරවාරි මස 28 වෙනි දින බ්‍රවුන්රික් ආණ්ඩුකාරයා විසින් යටත් විජිත මහලේකම්ට යැව් අංක 95 දරණ නිල ලිපියේ සඳහන් කර ඇත. ඉංග්‍රීසීන් සතුකරගත් මෙම කොඩියේ එංගලන්තයට යැවීමෙන් පසුව එය වෙල්සි හමුදා රෝහලේ නැපෝලියන් අධිරාජයාගේ 'රාජලියා' ධජය සමඟ තැන්පත් කරන ලදි. 1815 න් පසු ශ්‍රී ලංකාවේ කොඩිය ලෙසට භාවිතා කරන ලද්දේ 'යුනියන් ජැක්' නැමැති බ්‍රිතාන්‍ය ජාතික කොඩියයි. මීට අමතරව ලංකාවට වෙන්වූ යටත් විජිත කොඩියක් ද තිබී ඇත. අධිරාජ්‍ය විරෝධී සටන් පටන් ගන්නවාත් සමඟම අපට ජාතික කොඩියක අවශ්‍යතාවය තදින් දැනෙන්නට විය. එම නිසා ඒ. සී. බෙල්, ආචාර්ය ජෝෂප් පීටර්සන් සහ ඊ.ඩබ්.පෙරේරා යන මහත්වරු මේ පිළිබඳව පර්යේෂණ කිරිමෙන් අනතුරුව දීර්ඝ කාලයක් මුලුල්ලේ සොයාගත නොහැකිව තිබුණු සිංහලයේ අන්තිම රජුගේ සිංහ කොඩිය 1907 දී වේල්හි හමුදා රෝහලේ තිබී සොයා ගන්නා ලදි.

පද්මා එන් කොඩිකාර

ii පිටුවෙන්...

සිව්කා සාලා යනුවෙන් වූ ගොඩනැගිල්ල ශිව ලිංගයට පුද පූජා පැවැත් වූ දේවාලයක් වූ අතර බ්‍රාහ්මණයන් ස්තෝත්‍ර ගීතිකා ගායනය කරමින් ආශිර්වාද කළ ස්ථානය සොත්ථිසාලා යනුවෙන් හඳුන්වා ඇත.

ප්‍රාග් මහින්ද යුගයේ ජනප්‍රියව පැවති දහමක් ලෙස ජෛන ආගම ද පෙන්වා දිය හැකිය. ජෛනයන්ට ද පණ්ඩුකාභය රජු ආරාම තනවා දී ඇති බවට මහාවංශය සඳහන් කරයි. ජෝතිය- ගිරි- කුම්භාණ්ඩ යනුවෙන් සුප්‍රසිද්ධ නිවටැදුරන් තිදෙනෙක් සිට ඇත.

මීට අමතරව ආජීවක- පරිබ්‍රාජක හා පාසණ්ඩක ආදී වූ මිත්‍යා දෘෂ්ටිකයෝ ද මෙකල විසුවෝ වෙති. භාරතයේ සත්‍ය ගවේෂණයේ නිරත වූ ආගමික පිරිස් මේ අයුරින් ලක්දිව තැනින් තැන වාසය කොට ඇත. තාපස යන ආගමික පිරිස ද ජීවත්ව ඇති බවට සාධක ඇත. රාවණ රජු සීතාව පැහැර ගැනීමට මස්කරි හෙවත් ආජීවක වේශයෙන් රාමගේ අසපුවට ගිය පුවතක් ජානකීහරණ නම් වූ කුමාරදාස රජු විසින් රචිත සංස්කෘත මහා කාව්‍යයෙහි සඳහන් ය. ඒ බව

දම්භාජීවක මුත්තුංග - ජටා
මණ්ඩිත මස්තකම්
කංචිත් මස්කරි ණෞ සීතා -
දදර්ශාස්ශ්‍රම මාගතම්

යන්නෙන් පැහැදිලි වේ. විජය කුමරු ඇතුළු පිරිසට පිහිට වීමට උපුල්වන් දෙවිදු ලංකාවට පැමිණීම මෙන්ම පණ්ඩුවාස දේව ලංකාවට සම්ප්‍රාප්ත වීම ද සිදුව ඇත්තේ පරිබ්‍රාජක වේශයෙනි.

එමෙන්ම මහාවංශයෙහි සඳහන් පරිදි භද්දකච්චානා කුමරිය සහ ඇගේ පරිවාර ස්ත්‍රීන් ද ප්‍රව්‍රජ්ජා වේශයෙන් ලංකාවට පැමිණ ඇත.

මෙකී කරුණු කාරණාවලට අමතරව නාගයන් ඇදහීම ද තාරකා වන්දනය ද මෙකල පැවත තිබේ. එමෙන්ම නක්ෂත්‍ර විද්‍යාව හා නිමිති ශාස්ත්‍රයත් පැවත ඇත. ප්‍රාථමික සමාජයන්හි මෙවන් ඇදහිලි පැවතීම පුදුමයට කරුණක් නොවනු ඇත.

මෙකී කරුණු විග්‍රහයෙන් ගම්‍ය වනුයේ ලක්දිව ප්‍රාග් බෞද්ධ යුගයේ නානප්‍රකාර වූ ඇදහිලි හා පුද සිරිත්වලින් යුක්ත වූ බවය.

එවන් යුගයක්ව පැවති ලක්දිව අදවන විට බුදු දහමින් නැහැවී පැවතීම අමා මැණී බුදු පියාණන් වහන්සේගේ මෙන්ම අනුබුදු මිහිදු මා හිමිපාණන් වහන්සේගේ ලංකා ගමනයෙ'ද ආශ්චර්යක් වන්නේම ය. ලක්දිව සියල්ලෝම බුදු දහමේ අනුහසින් ප්‍රඥාවන්තයින්ම වේවායි අප පැතුම වනු නියති.

08 පිටුවෙන්....
## පටිච්චසමුප්පාද විවරණය

එනම් ඇස, කණ, නාසය, දිව, ශරීරය, සිත හරහා ඔබ කැමති වන දෑ මමය මගේය මා කැමතිම දේය යනුවෙන් වැලඳ ගැනීම කාමූපාදන යයි. මම කියා පුද්ගලයෙක් ඇති බව මගේ කියා ආත්මයක් ඇතිබව විශ්වාස කිරීම, පිළිගැනීම දැඩිසේ ගැනීම අත්තවාද උපාදානයයි. මෙම පටිච්ච සමුප්පාදය ආරම්භයේ විඤ්ඤාණ නාම රූප එක තුව උත්පත්තියක් බව පැහැදිළි කරයි. එසේ නම් මෙහි මම කියා අමුතු පුද්ගලයෙක් හෝ ආත්මයක් නැත. දිට්ඨි උපාදාන යනු මිත්‍යා දෘෂ්ඨි අදහස් දැඩිකොට ගැනීමය. එබඳු දෘෂ්ඨි දහයක් ධම්ම සංගණී ප්‍රකරණයෙහි දක්වා ඇත.

1. දීමෙන් ඵලයක් නැත.
2. මහාදානයේ ඵලවිපාක නැත.
3.ප්‍රතිග්‍රාහකයන් කැදවා දෙන දානයේ ඵලවිපාක නැත.
4. හොඳ නරක දෙකින් ඵලක් නැත.
5. පරලොව සිටිනවුන්ට පැමිණීමට මෙලොවක් නැත.
6. මෙලොව සිටිනවුන්ට යෑමට පරලොවක් නැත
7. මවට කරන හොද නරකින් ඵලක් නැත.
8. පියාට කරන හොද නරකින් ඵලක් නැත.
9. නැවත නැවත මැරි මැරී උපදිනා සත්වයෙක් නැත.
10. යම්කිසි ප්‍රතිපත්තියක බලයෙන් මෙලොව පරලොව දෙක ඇති බව හරියටම දැන ප්‍රකාශ කරන ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් නැත.

මෙබඳු දෘෂ්ඨි ඇතිවන්නේ පඤ්චස්කන්ධයට ඇලුම් කොට අනුවණින් එය සැපත් කිරීමේ ක්‍රම සොයන කල්හි වේ. එබැවින් තෘෂ්ණාව නිසා දිට්ඨුපාදානය ඇතිවේ.

සීලබ්බත උපාදාන යනු බුද්ධ දේශනාවට පරිබාහිරව සීල ව්‍රතයන් ආරක්ෂා කිරිමය. බුද්ධ කාලීනව ගෝ, ව්‍රත, අජ ව්‍රත, සුනඛ ව්‍රත, ආදී සීල ව්‍රත ආරක්ෂා කළ අයද නිසණ්ඨ ධර්මයන් ආරක්ෂා කළ අයද වූහ. අද කාලයේද මේවා බෞද්ධ භාවනා ක්‍රම නොවේ යනුවෙන් බෞද්ධයන් අතර පවත්වාගෙන යන භාවනා ක්‍රම ඇත. මේවා සීලබ්බත උපාදානයට වැටේ.

උපාදාන පච්චයා භවො මෙම උපාදාන හේතුවෙන් භවයක් ඇතිවේ. භවය දෙයාකාර වේ.

1. උප්පත්ති භව
2. කර්ම භව

කර්මභවය යනු පුද්ගලයා විසින් සිදුකරනු ලබන පිං පව් හා ධ්‍යාන වලට අනුව උත්පත්තිය ලැබීමයි. උත්පත්ති භව යනු ඒ ඒ භූමිවල උත්පත්ති ලැබීමයි. එනම් කාම භවය, රූප භවය, අරූප භවය, සංඥා භවය, අසංඥා භවය ආදියයි. මේ සියල්ල උපාදාන හේතුවෙන් සිදුවේ.

භව පච්චයා ජාති මෙම භවය හෙවත් පිළිසිඳ ගැනීම ඉපදීමක් සත්වයෙක් හැටියට පහළ වේ. එය ජාති යනුවෙන් දැක්වේ. එනම් ස්කන්ධයාගේ පහළවීමයි. එම ඉපදීම කරණකොට ගෙන දිරීම, ලෙඩවීම, මරණය, ශෝකය, පරිදේවය හටගනී.

එම නිසා සත්වයා මෙම චක්‍රය සිඳ දැමිය යුතුය. එසේ සිඳ දැමීමට තෘෂ්ණාව ක්ෂය කළ යුතුය. තෘෂ්ණාව ක්ෂය කිරීමෙන් උපාදනය ක්ෂය වේ. එයින් භවයක් නැත. නැතහොත් අවිද්‍යාව හළ යුතුය. අවිද්‍යාව නැතිකිරීමෙන් සංස්කාර සිඳෙන බැවින් නැවත භවයක් නැත.



## බුදු දහමෙහි ඉගැන්වෙන ශාරීරික සුවතාවය

මිනිසාගේ ජීවිතය පිළිබඳ නිවැරදි සාධාරණ,කරුණු රැසක් ඉදිරිපත් කළ ශ්‍රේෂ්ටතම ශාස්තෘවරයා බුදුරජාණන් වහන්සේය. ඒ බව ඉදිරිපත් කර ඇති දහම් කරුණු වලින් මනාකොට පැහැදිලි වෙයි. ''දුල්ලභඤ්ච මනුස්සත්තං'' මිනිසත් බවක් ලබා ගැනීම ඉතා දුර්ලභ කරුණකි. ''මනං උස්සතීති මනුස්සයා'' වශයෙන් හඳුන්වා දී තිබේ. ''දුකකිනි මිනිසත් බව ලැබ ගන්නේ'' මිනිස් ආත්මයක් ලබා ගැනීම බතා අපහසුවෙන් සිදුවන්නකි.''දුල්ලභො පුරිසාජඤ්ඤ'' මෙම කරුණු වලින් පෙනියන්නේ මිනිස් ආත්මයක ඇති වටිනාකමයි.

දුර්ලභ ලෙසට ලබාගත් මිනිස් ජීවිතය මෙලොව,පරලොව සාර්ථකකර ගන්නා ආකාරය බුදුරජාණන් වහන්සේ සූත්‍ර අනුසාරයෙන් ඉදිරිපත් කළ සේක. අටතිස් මංගල කරුණු අඩංගු මංගල සූත්‍රය පෙන්වා දෙන්නේ නිවැරදි ජීවිතයක් සඳහා අවශ්‍යවන උපදෙස් රාශියකි. ''අසෙවනාච බාලානං පණ්ඩිතානංච සෙවනා'' බාලයන්ගේ (අඥානයාණ) ඇසුර නොකළ යුතු බවත් පණ්ඩිත (හොදනරක අවබෝධ කරගත්) පුද්ගලයන් ඇසුරු මෙලොව,පරලොව යහපතට හේතුව බවත්ය. සොළොස් නැලියක බත් අනුභව කළ කොසොල් මහ රජතුමා ශාරීරික වශයෙන් දැඩි අපහසුතාවයට පත්ව සිටියේය. එම අවස්ථාවේ එතැනට වැඩම කළ බුදුරජාණන් වහන්සේ ''ආරෝග්‍යා පරමාලාභා'' ලොව පවතින උතුම් ලාභය,''නිරෝගීකම'' පෙන්වාදුන් බුදුරජාණන් වහන්සේ, නිරෝගීව සිටීමේ වැදගත්කම ගැන කොසොල් මහරජතුමා ප්‍රධාන එම පිරිසට දහම් දෙසූ සේක. මෙම දේශනාවෙන් පසු රජතුමා තම ආහාරවේල පිළිවෙලින් අඩුකර ශාරීරික සුවතාවයට පත්විය. මිනිසාගේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍යවන ජලය ආරක්ෂාකර ගැනීම සඳහා දේශනාවන් පැවැත් වූ බුදුරජාණන් වහන්සේ ජලය ඇති ස්ථාන ආරක්ෂා කර ගැනීමට අවශ්‍යවන කරුණු ඉදිරිපත් කළ සේක. ඇළ,දොළ,ගංගාවන්ට මළ,මූත්‍ර නොදමන ලෙස අවවාදකළ සේක.ජලයේ කුඩා සත්වයන් ජීවත්වන බැවින් ජලය පෙරාගෙන (පෙරහංකඩ) පානයකර ලෙස භික්ෂූන් වහන්සේලාට නියමකළ සේක.
මනසේ සුවතාවය සඳහා තොරාන්නා ලෙසට උපදෙස් ලබාදුන් සේක. භාවනා කරන අවස්ථාවලදී ශරීරය නිවැරදි ලෙසට පවත්වාගෙන යෑමට අවශ්‍ය සක්මන්භාවනා ක්‍රමය පෙන්වාදී තිබේ. වනාන්තරවල ඇති රුක්ඛමූලයන්ද ගල්ගුහාවන්ද (ජනශූන්‍ය) මේ සඳහා වඩාත් සුදුසු බව දක්වා තිබේ. කරණීයමෙත්ත සූත්‍රය දේශනා කර ඇත්තේද වනාන්තරගතව භාවනා කළ භික්ෂූන් වහන්සේලා පිරිසකටය. වැසිකලි,කැසිකිලි භාවිතා කිරීම පිළිබඳ පිළිවෙත් ගැන කරුණු ඉදිරිපත්කළ බුදුරජාණන් වහන්සේ වැසිකිලියේදී භාවිතාකල භාජනයේ භික්ෂු පිරිස විනයධර ධම්මධර නමින් බෙදී වාද විවාද පැවැත්වූහ.අවසානයේ සිදුවූයේ අසමගියක් ඇතිවීමය.මෙය සංසිඳවීම පිනිස බුදුරජාණන් වහන්සේ ප්‍රයෝජනයක් නොවීය. බුදුරජාණන් වහන්සේ භික්ෂු සමාජයෙන් ඈත්ව වනගත වූ සේක.බුදුරජාණන් වහන්සේ ''පාරිලෙය්‍ය වනයට '' වැඩම කෙළේ එම භික්ෂූන්ගේ අසමගිකම හේතුකොට ගෙනය. අවසානයේ සිදුවූයේ අසමගිය වූ භික්ෂූන් මහජනතාවගේ අප්‍රසාදය ලක්වීමෙන් සිවුපසයද නැතිවීයාමය.

කුඩා ප්‍රශ්නයක් විසදා නොගැනීම නිසා සිදු වූ හානිය සුළුපටු නොවේ. භික්ෂු ජීවිතයක,සුවතාවය හෙවත් නිරෝගි බව ඇති කරුනු ලබන්නේ විනය නීති,රීති පිළිපැදීම මතය. විනයක් නැති සමාජයක,සෞඛ්‍යතාවය ආරක්ෂා නොවේ. එබැවින් සෞඛ්‍ය සම්පන්න බව ඇතිකර ගැනීමට මනාහික්මීමක් අවශ්‍යවනු ඇත. ගිහි සමාජය සෞඛ්‍ය සම්පන්න කිරීමට පංචශීල ප්‍රතිපත්තිය බුදු දහමෙහි දක්වා තිබේ.''කාමේසුමිච්චාචාර''යන ශික්ෂාපදය සෞඛ්‍ය සම්පන්න සුචරිතවත් සමාජයකට හේතු වන්නකි. වැරදි ලෙසට කම්සැප විදීම වැළැක්වීම මෙම ශික්ෂා පදයෙන් සිදුවේ. වැරදි ලෙසට කම්සැප භුක්ති විඳීම විවිධ රෝගයන්ට හේතුවන්නකි.එබැවින් එයින් මිදී කටයුතු කිරීම වැදගත් වන බව බුදු දහමෙන් පෙන්වාදී තිබේ. ''සුරාමේරයමජ්ජපමා දට්ඨානා වේරමණී'' යන ශික්ෂා පදයෙන් සිදුකරනු ලබන්නේ මත්ද්‍රව්‍ය භාවිතයෙන් මෙලොවදීම විපාක දෙන ප්‍රධාන කරුණු වන්නේ මිනිසාගේ මනස විකෘතිවීමය.මනස විකෘතිවීම හේතුකොට එදිනෙදා සිදුකරනු ලබන සියලුම දේම අවුල් සහගතවේ. ශාරීරික වශයෙන් බෙලහීන (දුර්වල) පුද්ගපයන් බවට පත්වේ. ජීවිතය විනාශවීමටද ඉඩ තිබේ. ''මත්රකුසා'' යනුවෙන් මත්ද්‍රව්‍ය හඳුන්වා ඇත්තේද එය ජීවිත විනාශයට හේතුවන්නක් නිසාය.

භික්ෂූන් වහන්සේලාට අවේලාවේ (විකාල භෝජනය) ආහාර නොගතයුතු බවට විනය ශික්ෂාපද මගන් දක්වා ඇත්තේ රාත්‍රි කාලයට ආහාර දිරවීමේ ඇති අපහසුතාවයට භාවනා කිරීමට ඇති අවහිරයක් ගැන අවධාරණය කිරීම හේතුකොටගෙනය.රාත්‍රි කාලයට ආහාර ගැනීම ඉතා සුළුවෙන් (සුළු ආහාර) සිදුකළ යුතු බව වෛද්‍යවරුන්ගේ ඉල්ලීමය.භික්ෂූන් වහන්සේලාට(භෙසජ්ජ) බෙහෙත් ද්‍රව්‍ය පානය කිරීමට බුදුරජානන් වහන්සේ අනුදැන වදාළ සේක. බෙහෙත් ද්‍රව්‍ය (කොළ වලින්) සාදගත් කැඳ වගී පාවිච්චි කිරීමට දහමෙහි සඳහන්ව ඇත.ඉහත සඳහන් කරුනු අනුව පෙනී යන්නේ බෞද්ධ දර්ශනයේ පෙන්වාදී ඇති පරිදි මිනිස් වර්ගයාගේ බෞද්ධ දර්ශනයේ පෙන්වාදී ඇති පරිදි මිනිස් වග්‍රයාගේ සෞඛ්‍ය සම්පන්න බව ඇති කිරීමට සුචරිතවත් ලෙස උනන්දුවෙන් ක්‍රියාකළ යුතු බව අවදාරණය කළ යුතුවේ.

ශාස්ත්‍රපති ඇම්.ඩී.විජයවර්ධන

රංගිරි ශ්‍රී ලංකා 2020 ඇසළ- 2564 පුළි කලාපය

රංගිරි ශ්‍රී ලංකා
සත්‍ය ගවේෂී බෞද්ධ හඬ
රංගිරි ශ්‍රී ලංකා 2020 පුළි - 2564 ඇසළ කලාපය

තමන් පෝෂණය කරන ලද දෙමව්පියන් වයසට පත්වූ විට අවශ්‍ය පරිදි ආහාර පානාදියෙන් සංග්‍රහ කිරීම ද, හොඳින් රැකබලා ගැනීමද, පරම යුතුකමකි. එසේ නොකරන දරුවන් පිරිහීමට පත්වන්නාහ. - පරාභව සූත්‍රය -

# මහනුවර ශ්‍රී දළදා මන්දිරය



මහනුවර ශ්‍රී දළදා මන්දිරය අතිපූජනීය ස්ථානයකි. පිංබිමකි. ලක්දිව රජකළ කිත්සිරි මෙවන් රජ දවස කලිඟු රටේ සිට හේමමාලා කුමරිය සහ දන්ත කුමරු යන දෙදෙනා විසින් ශ්‍රී දන්තධාතූන් වහන්සේ මෙරටට වැඩම කරවූ බව ඓතිහාසික තොරතුරු වලින් අනාවරණය වේ. කිත්සිරි මෙවන් රජතුමා දන්ත ධාතූන් වහන්සේ ගෞරවාදරයෙන් පිළිගෙන අනුරපුර මහමෙවුනා උයනෙහි සාදන ලද විශේෂ මණ්ඩපයක තැන්පත් කෙරිණි. රාජ්‍ය ආරක්ෂාව ලබාදීම සඳහා රජ මාලිගාව අසලින්ම දන්ත ධාතූන් වහන්සේ තැන්පත් කර තිබුණි. රට පාලනය කරන රජතුමා අනිවාර්යෙන්ම දන්තධාතූන් වහන්සේ ආරක්ෂා කළ යුතු බවට රාජ නියමයක් පැවැති බව සඳහන් වේ. එබැවින් මෙරට සිටි විදේශීය රාජ්‍ය පාලකයින්ද දන්තධාතූන් වහන්සේ ආරක්ෂා කර තිබිණි. ලංකාවේ රාජධානි වෙනස් වූ අවස්ථාවල රජ මාලිගාව අසලින්ම දළදා මැඳුරක් සාදා තිබූ බව දූනට හමුවී ඇති නටඹුන් වලින් පැහැදිලි වේ.

කන්ද උඩරට රාජ්‍යයේ රජකළ විමලධර්ම රජතුමා රජ වීමෙන් පසු දන්තධාතූන් වහන්සේ වෙනුවෙන් පළමුවෙන්ම මහනුවර නගර මධ්‍යයේ විසිතුරු දළදා මාලිගාවක් සාදවා පූජා විධි පැවැත්වූ බව දළදා වංශයෙහි දක්වේ. දන්තධාතූන් වහන්සේ වැඩම වන පෙරහැරක්ද මෙම රජතුමා විසින් ආරම්භ කර තිබිණ. දෙවන රාජසිංහ රජතුමා, දෙවන විමළධර්මසූරිය රජතුමා, වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා, ශ්‍රී විජය රාජසිංහ රජතුමා, ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා යන රජවරුන් විසින් කන්ද උඩරටදී ශ්‍රී දන්තධාතූන් වහන්සේ වෙනුවෙන් පෙරහැර පවත්වා විවිධ පුද පූජා පවත්වා ඇත. සෙංකඩගල පුරයෙහි වර්තමානයේ දක්නට ලැබෙන තෙමහල් දළදා මන්දිරය ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා විසින් ගොඩනගන ලද බව වංශකථාවල සඳහන් වෙයි. දළදා මන්දිරයෙහි ආරක්ෂාව සඳහා දියරැලි බැම්මක්ද දිය අගලක්ද සාදා තිබෙනු දක්නට ලැබේ. රන් වියනකින්ද අලංකාර වී ඇත.

වෙනත් පූජනීය ස්ථානයක නොමැති විශේෂ පූජා විධි ක්‍රමයක් දන්ත ධාතූන් වහන්සේ වෙනුවෙන් එදා රජ දවස සිට වර්තමානය දක්වා පැවැත්වීම විශේෂ දෙයකි. එම විශේෂ පූජා විධි ක්‍රමය රජතුමා ගේ නියෝගයන් පරිදි එදා මෙන් අදත් සිදුවේ. අස්ගිරි විහාර පාර්ශවයේ අතිපූජ්‍ය මහා නායක ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ ප්‍රධාන තත්විහාරික භික්ෂූන් වහන්සේලා එක් වසරක් තේවාව සිදුකෙරේ. මල්වතු මහා විහාර පාර්ශවයේ අතිපූජ්‍ය මහානායක ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ ප්‍රධාන තත් විහාරික භික්ෂූන් වහන්සේලා එක් වසරක් තේවාව සිදුකෙරේ. මෙසේ මාරුවෙන් මාරුවට තේවාව සිදුවෙන අතර භාරකාරත්වය දියවඩන නිලමේතුමා විසින් දරනු ලැබේ. අතිරේක නිලමේවරු විවිධ සේවාවන්වල යෙදෙති. තේවාව පවත්වන අවස්ථාවලදී හේවිසි ශබ්ද පූජාව පැවැත්වීම, පෞරාණික පරම්පරාවෙන් පැවත එන අය විසින් සිදුකරනු ලබති. ඔවුන් සඳහා ගම්වර ප්‍රදානය කර තිබුණි.

දළදා මාලිගාවේ පැවැත්වෙන පෞරාණික කාර්යභාරයන් රාශියක් ගැන ග්‍රන්ථවල සඳහන් වේ. වාර්ෂික අළුත් සහල් මංගල්‍යය, සිංහල අවුරුදු චාරිත්‍ර මංගල්‍යය, කාර්තික් පූජා මංගල්‍යය, දළඳා පෙරහැර යන සිද්ධීන්ට අදාලව රාජ්‍ය අනුග්‍රහය ලබමින් පැවැත්වේ. පෙර රජදවස ද මෙම චාරිත්‍ර විධි පවත්වා ඒ බව රජුට දන්වූ බව දළදා වංශ කථාවේ සඳහන් වේ. දළදා පෙරහැරට පසු පසින් ගමන්ගන්නා කුඩා පෙරහැර කිහිපයක් වේ. නාථ දේවාල පෙරහැර, විෂ්ණු දේවාල පෙරහැර ද වේ. මෙම සෑම පෙරහැරක්ම පැවැත්වෙන්නේ බෞද්ධ සංස්කෘතික ලක්ෂණ ආරක්ෂාවෙන පරිද්දෙනි. හේවිසි කණ්ඩායම්, උඩරට, පහතරට නැටුම් කණ්ඩායම්, කෙලි සෙල්ලම් මෙම පෙරහැරට සම්බන්ධකර තිබේ. දන්තධාතූන් වහන්සේ වැඩමවන මංගල හස්තිරාජ්‍යා මහත් අභිමානයෙන් යුක්තව පෙරහැරේ ගමන් කරයි. දින කිහිපයක් මෙසේ පෙරහැර පවත්වා දියකැපීමෙන් පසු දළදා පෙරහැර නිමාවට පත්වෙයි.

දෙස් විදෙස් ජනතාවගේ සිත්ගත් ආකර්ෂණීය පෙරහැරක් බවට දළදා පෙරහැර පත්ව තිබීම අප කාගෙත් සිත් සතන්වලට මහත් සතුටකි. දළදා පෙරහැර පැවැත්වෙන කාලය මහනුවර පුරවරයම උත්කර්ශවත් ශ්‍රියෙන් බැබලෙයි. බුද්ධාලම්බන ප්‍රීතියක්ද ජනයා අතර ඇතිවෙයි. දන්තධාතූන් වහන්සේ වැඩසිටීම, ජීවමාන බුදුරජාණන් වහන්සේ වැඩ සිටිනවා හා සමාන ලෙසට බෞද්ධ ජනතාව සලකනු ලබති. එදා මෙදාතුර මෙරටට ඇතිවූ ආක්‍රමණ වලදී එම උවදුරු වලින් කිසිඳු අනතුරක් දන්තධාතූන් වහන්සේට සිදුනොවීම මහත් ආශ්වර්යක් සේ ජනතාව සලකති. ත්‍රස්තවාදී උවදුර ඇතිවූ අවස්ථාවේදීද දන්තධාතූන් වහන්සේට කිසිදු අනතුරක් සිදුනොවූ බව සත්‍ය දෙයකි. ලාංකික ජනතාවට විපතක් සිදුවන අවස්ථාවලදී දන්තධාතූන් වහන්සේගේ පිහිට පැතීම පැරණි චාරිත්‍රයකි. දන්තධාතූන් වහන්සේට පුද පූජා විධි පැවැත්වීමත් ආරක්ෂා කිරීමත් බෞද්ධ ජනතාවගේ පරම යුතුකම වන්නේය. සැමට දළදා සමිඳු පිහිට ලැබේවා.ශබ්ද පූජාව පැවැත්වීම, පෞරාණික පරම්පරාවෙන් පැවත එන අය විසින් සිදුකරනු ලබති. ඔවුන් සඳහා ගම්වර ප්‍රදානය කර තිබුණි.

දළදා මාලිගාවේ පැවැත්වෙන පෞරාණික කාර්යභාරයන් රාශියක් ගැන ග්‍රන්ථවල සඳහන් වේ. වාර්ෂික අළුත් සහල් මංගල්‍යය, සිංහල අවුරුදු චාරිත්‍ර මංගල්‍යය, කාර්තික් පූජා මංගල්‍යය, දළඳා පෙරහැර යන සිද්ධීන්ට අදාලව රාජ්‍ය අනුග්‍රහය ලබමින් පැවැත්වේ. පෙර රජදවස ද මෙම චාරිත්‍ර විධි පවත්වා ඒ බව රජුට දන්වූ බව දළදා වංශ කථාවේ සඳහන් වේ. දළදා පෙරහැරට පසු පසින් ගමන්ගන්නා කුඩා පෙරහැර කිහිපයක් වේ. නාථ දේවාල පෙරහැර, විෂ්ණු දේවාල පෙරහැර ද වේ. මෙම සෑම පෙරහැරක්ම පැවැත්වෙන්නේ බෞද්ධ සංස්කෘතික ලක්ෂණ ආරක්ෂාවෙන පරිද්දෙනි. හේවිසි කණ්ඩායම්, උඩරට, පහතරට නැටුම් කණ්ඩායම්, කෙලි සෙල්ලම් මෙම පෙරහැරට සම්බන්ධකර තිබේ. දන්තධාතූන් වහන්සේ වැඩමවන මංගල හස්තිරාජ්‍යා මහත් අභිමානයෙන් යුක්තව පෙරහැරේ ගමන් කරයි. දින කිහිපයක් මෙසේ පෙරහැර පවත්වා දියකැපීමෙන් පසු දළදා පෙරහැර නිමාවට පත්වෙයි.

දෙස් විදෙස් ජනතාවගේ සිත්ගත් ආකර්ෂණීය පෙරහැරක් බවට දළදා පෙරහැර පත්ව තිබීම අප කාගෙත් සිත් සතන්වලට මහත් සතුටකි. දළදා පෙරහැර පැවැත්වෙන කාලය මහනුවර පුරවරයම උත්කර්ශවත් ශ්‍රියෙන් බැබලෙයි. බුද්ධාලම්බන ප්‍රීතියක්ද ජනයා අතර ඇතිවෙයි. දන්තධාතූන් වහන්සේ වැඩසිටීම, ජීවමාන බුදුරජාණන් වහන්සේ වැඩ සිටිනවා හා සමාන ලෙසට බෞද්ධ ජනතාව සලකනු ලබති. එදා මෙදාතුර මෙරටට ඇතිවූ ආක්‍රමණ වලදී එම උවදුරු වලින් කිසිඳු අනතුරක් දන්තධාතූන් වහන්සේට සිදුනොවීම මහත් ආශ්වර්යක් සේ ජනතාව සලකති. ත්‍රස්තවාදී උවදුර ඇතිවූ අවස්ථාවේදීද දන්තධාතූන් වහන්සේට කිසිදු අනතුරක් සිදුනොවූ බව සත්‍ය දෙයකි. ලාංකික ජනතාවට විපතක් සිදුවන අවස්ථාවලදී දන්තධාතූන් වහන්සේගේ පිහිට පැතීම පැරණි චාරිත්‍රයකි. දන්තධාතූන් වහන්සේට පුද පූජා විධි පැවැත්වීමත් ආරක්ෂා කිරීමත් බෞද්ධ ජනතාවගේ පරම යුතුකම වන්නේය. සැමට දළදා සමිඳු පිහිට ලැබේවා.

අජන්තා ශිරෝමණි දිසානායක